# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

වැය ශීර්ෂ අංක 255




| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 0112 369 134 / 0112 369 136 |
| ෆැක්ස් | - | 0112 369 142 |
| වෙබ් අඩවිය | - | colombo.dist.gov.lk |
| ඊමේල් ලිපිනය | - | ds@colombo.dist.gov.lk |

**2022 වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව සඳහා**

**දිස්ත්‍රික් ලේකම්ගේ පණිවුඩය .....**



සමස්ත දිවයිනට ම බලපෑ ආර්ථික හා දේශපාලන අර්බුද මෙන්ම කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2022 වසර අභියෝගාත්මක වසරක් විය. මෙම සියලු අභියෝග හමුවේ කොළඹ දිස්ත්‍රික්කයේ සැලසුම් කළ වැඩසටහන් හා ව්‍යාපෘති, අපේක්ෂිත ඉලක්ක කරා ලඟා කරවීමට මෙහෙයවමින්, නායකත්වය හා මඟපෙන්වීම ලබා දුන් හිටපු දිසාපති ප්‍රදීප් යසරත්න මහතාට මාගේ ස්තුතිය පුද කරමි. එසේම ඒ සඳහා නන් අයුරින් සහයෝගය ලබා දුන් දිස්ත්‍රික් දේශපාලන නායකත්වය, ප්‍රාදේශීය ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ ප්‍රධානීන් සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සෙසු රාජ්‍ය හා පෞද්ගලික ආයතන, සංවිධාන මෙන්ම අදාළ පුද්ගලයින් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සම්බන්ධීකරණයෙන් හා මෙහෙයවීමෙන් දිස්ත්‍රික්කයේ මහජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධන, සමාජ සංවර්ධන හා අධ්‍යාත්මික සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙන්ම බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ තොරතුරු හා ප්‍රගතිය මෙහි ඇතුළත් කර ඇත.

රජයේ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්වලට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එක්ව, විවිධ නිර්මාණාත්මක වැඩසටහන් රාශියක් පසුගිය වසරේ දී ක්‍රියාත්මක කර ඇත. රට තුළ පැවති ආහාර අර්බුදයට විසඳුමක් ලෙස දිස්ත්‍රික්කයේ ගෙවතු වගාව ප්‍රවලිත කිරීමේ අරමුණින් පැවැත් වූ ‘‘කොළොම්තොට වගා සංග්‍රාමය’’ හා ඒ ආශ්‍රිතව පැවැත්වුණු ගෙවතු වගා තරගාවලිය විශේෂිත ය. කොළඹ තදාසන්න නාගරික මහල් නිවාසවල ප්‍රජාව පවා සිරස් අවකාශයේ වගා කරවීමට පොළඹවමින් මේ සඳහා සහභාගි කරවීමට හැකිවීම අප ලද සුවිශේෂී ජයග්‍රහණයකි. රාජ්‍ය ආයතනයක් ලෙස, සාර්ථක අනුග්‍රාහක දායකත්වයක්

ලබා ගනිමින් ඉහළ ප්‍රමිතියකින් යුක්ත ව සංවිධානය කරන ලද "Voice of Colombo" රියැලිටි වැඩසටහන, වෙහෙසකර රාජකාරියෙන් මොහොතකට මිදී තම ගායන හැකියාවන් ඔප මට්ටම් කර ගැනීමටත් රස වින්දනයටත් රාජ්‍ය නිලධාරීන්ට මහඟු අවස්ථාවක් සලසා දුණි. නිලදරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය ඉහළ නංවා, සාමූහික ක්‍රීඩා කෞෂල්‍ය වැඩි දියුණු කිරීමට පැවැත් වූ "දිසාපති කුසලාන ක්‍රීඩා තරගාවලිය" හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතාවයනට දිරියක් හා අත්වැලක් වීමේ අරමුණින් ආරම්භ කළ "නැණමිණ ශිෂ්‍යත්ව වැඩසටහන" ද කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් සංවිධානය කළ නිර්මාණාත්මක වැඩසටහන් වේ.

ඉදිරි සමාජ අවශ්‍යතාවයන් හා අනපේක්ෂිත ලෙස මුහුණ දීමට සිදු විය හැකි අභියෝගයන් පිළිබඳව අවබෝධයෙන් යුතුව, ගොඩ නඟා ඇති අනාගත ඉලක්කයන් සාර්ථකව සපුරා ගැනීමට බලාපොරොත්තු වන අතර, සුවිශේෂී ජයග්‍රහණ මතින් සියලු ඉලක්ක සාර්ථකව ළඟා කර ගැනීමට තම කාලය හා ශ්‍රමය වැය කළ සියලු දෙනාට මාගේ ගෞරවය පුද කරමි.

කේ. ජී. විජේසිරි,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය

# පටුන


| අනු අංකය | | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|---|
| 1. | පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය..... | | |
| | 1.1 | දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම..... | 7 |
| | 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු..... | 9 |
| | 1.3 | ප්‍රධාන කාර්යයන්..... | 10 |
| | 1.4 | සංවිධාන සටහන..... | 11 |
| | 1.5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල | |
| | | 1.5.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳ මූලික තොරතුරු..... | 12 |
| | | 1.5.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්..... | 13 |
| | | 1.5.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය..... | 13 |
| | | 1.5.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබාගෙන ඇති විජයග්‍රහණ..... | 14 |
| | | 1.5.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මුහුණදීමට සිදුවන අභියෝග..... | 17 |
| | | 1.5.6 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිරි ඉලක්ක..... | 21 |
| 2. | පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම (විශේෂ ජයග්‍රහණ, අභියෝග, ඉදිරි ඉලක්ක) | | |
| | 2.1 | ආයතන අංශය ..... | 26 |
| | 2.2 | ක්‍රමසම්පාදන අංශය ..... | 27 |
| | 2.3 | ගිණුම් අංශය ..... | 30 |
| | 2.4 | අභ්‍යන්තර විගණන අංශය ..... | 32 |
| | 2.5 | ඉංජිනේරු අංශය ..... | 33 |
| | 2.6 | කෘෂිකර්ම අංශය ..... | 33 |
| | 2.7 | පොහොර අංශය ..... | 34 |
| | 2.8 | සමෘද්ධි අංශය ..... | 35 |
| | 2.9 | සංඛ්‍යාලේඛන අංශය ..... | 38 |
| | 2.10 | කුඩා ව්‍යාපාර අංශය ..... | 38 |
| | 2.11 | ඉඩම් පරිහරණ සැලසුම් අංශය ..... | 40 |
| | 2.12 | මිනුම් හා ප්‍රමිතිසේවා අංශය ..... | 41 |
| | 2.13 | පුපුරන ද්‍රව්‍ය පාලන අංශය ..... | 41 |
| | 2.14 | පර්යේෂණ හා සන්නිවේදන අංශය ..... | 43 |
| | 2.15 | මාධ්‍ය අංශය ..... | 44 |
| | 2.16 | සමාජ ආරක්ෂණ අංශය ..... | 45 |
| | 2.17 | පාරිභෝගික සම්බන්ධතා අංශය ..... | 46 |
| | 2.18 | බෞද්ධ කටයුතු අංශය ..... | 46 |
| | 2.19 | මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ අංශය ..... | 47 |

| අනු අංකය | මාතෘකාව | පිටු අංකය | අනු අංකය |
|---|---|---|---|
| | 2.20 | ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය | 49 |
| | 2.21 | ළමා ආරක්ෂක අංශය | 50 |
| | 2.22 | වනිතා සංවර්ධන අංශය | 51 |
| | 2.23 | සමාජ සේවා අංශය | 52 |
| | 2.24 | විදාතා නිලධාරී | 53 |
| | 2.25 | මානව සම්පත් සංවර්ධන අංශය/රැකියා කේන්ද්‍රය | 54 |
| | 2.26 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් අංශය | 55 |
| | 2.27 | රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක අංශය | 57 |
| | 2.28 | විදේශ රැකියා ප්‍රවර්ධන අංශය | 58 |
| | 2.29 | පරිසර අංශය | 59 |
| | 2.30 | ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන අංශය | 60 |
| | 2.31 | සංස්කෘතික අංශය | 60 |
| | 2.32 | ආපදා සහන සේවා අංශය | 62 |
| | 2.33 | ඵලදායිතා ප්‍රවර්ධන අංශය | 62 |
| | 2.34 | උපදේශන අංශය | 62 |
| | 2.35 | සමඵ පුහුණු අංශය | 63 |
| 3. | පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය | | |
| | 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 67 |
| | 3.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 68 |
| | 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 69 |
| | 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 70 |
| | 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 104 |
| | 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 105 |
| | 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 107 |
| | 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 120 |
| | 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 120 |
| 4. | පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක | | 139 |
| 5. | පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | | 157 |
| 6. | පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ | | |
| | 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 193 |
| | 6.2 | මානව සම්පත් සංවර්ධනය | 193 |
| 7. | පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව | | 196 |

# 1 පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25න් බස්නාහිර පළාතට අයත් වූ සුවිශේෂී දිස්ත්‍රික්කය වන්නේ කොළඹ දිස්ත්‍රික්කයයි. ශ්‍රී ලංකාවේ වාණිජ හා වෙළඳ අගනගරය වන කොළඹ ත් පරිපාලන අගනගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ත් යන නගර පිහිටා තිබීම, කොළඹ දිස්ත්‍රික්කයේ සුවිශේෂිත්වයට ඉවහල් වී ඇත.

උතුරින් කැළණි ගඟෙන් ද දකුණින් පානදුර බොල්ගොඩ ගඟෙන් හා කළුකර දිස්ත්‍රික්කයෙන් ද බස්නාහිරින් ඉන්දියානු සාගරයෙන් ද නැගෙනහිරින් සබරගමුව පළාතෙන් ද මායිම් වන මෙම දිස්ත්‍රික්කය වර්ග කිලෝ මීටර 699ක භූමි ප්‍රමාණයකින් යුතු දිවයිනේ කුඩාම දිස්ත්‍රික්කයයි. එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13ක් තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 557කින් යුක්ත වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2022 වසරේ දත්තවලට අනුව මෙහි ඇස්තමේන්තුගත ජනගහණය 2,477,922 ක් වන අතර ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට 3,545ක් වේ. ඒ අනුව දිවයිනේ වැඩිම ජන ඝනත්වය පවතින්නේ ද මෙම දිස්ත්‍රික්කයේ ය. අතීතයේ පටන් ලොව පතළ හා වඩාත් කාර්යබහුල වරායන් අතර ශ්‍රේණිගත කිරීම්වල ඉහළින් ඇති කොළඹ වරාය මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම හේතුවෙන් ජන ඝනත්වය ඉහළ අගයක් ගෙන ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු දත්තවලට අනුව 2016 - 2020 කාල පරිච්ඡේදය තුළ ජාතික දළ දේශීය නිෂ්පාදිතයට බස්නාහිර පළාත දක්වා ඇති දායකත්වය 38%-39%ක පරාසයේ පවතී. 2020 වසරේ දී එය ශ්‍රී ලංකාවේ සමස්ත ජාතික දළ දේශීය නිෂ්පාදනයෙන් 38%ක් වූ අතර එම අගය රු.මිලියන 5,694,306 කි (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2021). ඒ සඳහා බස්නාහිර පළාතේ වඩාත් ක්‍රියාකාරී කලාපය වන, ප්‍රධාන වෙළඳ හා මූල්‍ය ආයතන සංකේන්ද්‍රනය වී ඇති කොළඹ දිස්ත්‍රික්කයේ දායකත්වය ඉහළ අගයක පවතී.

ආර්ථික, සමාජයීය, දේශපාලනික හා ඓතිහාසික වශයෙන් කැපී පෙනෙන විශේෂතාවලින් සමන්විත වන මෙම දිස්ත්‍රික්කයේ මෑත කාලීන සංවර්ධන ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතීන් මෙරට අනාගතයේ වැදගත් සන්ධිස්ථාන සටහන් කරනු ඇත. මෙරට ඉදි වූ පළමු අධිවේගී මාර්ගය වන දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ-කටුනායක

අධිවේගී මාර්ගය, නව කැළණි පාලම හා පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘති හා දෙමටගොඩ, නුගේගොඩ ගුවන් පාලම් හා දැනට ඉදිවෙමින් පවතින ගුවන් පාලම් ව්‍යාපෘති මෙරට මාර්ග හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ සුවිශේෂී මංසලකුණු වේ. එසේම වර්තමාන සංවර්ධන ක්‍රියාවලියේ සීමාවන් පුළුල් කළ ආයෝජනයක් ලෙස පෝට් සිටි ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. 2021 අංක 11 දරණ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත, 2021 මැයි 28 වන දින ගැසට් කරන ලද අතර ඒ යටතේ හෙක්ටයාර 446.6153ක නව භූමි ප්‍රදේශයක් ලාංකීය භූමියට එකතු විය. මෙම නව භූමි ප්‍රදේශය අයත් වන්නේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටයි.

කොළඹ දිස්ත්‍රික් සිතියම



## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**ආයතනයේ දැක්ම**

යහ පාලනයෙන් හා තිරසර සංවර්ධනයෙන් හෙබි ප්‍රමුඛතම දිසාව.....

**ආයතනයේ මෙහෙවර**

නිර්මාණශීලීව හා නව්‍යශීලීව පවත්නා සම්පත් කළමනාකරණයෙන් ජන ජීවිතය සවිබල ගැන්වීමට දිසාව මෙහෙය වීම.

**ආයතනයේ අරමුණු**

- කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් ක්‍රමයක් පවත්වාගෙන යෑම.
- ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මඟින් කාර්යක්ෂම සේවා සැපයීම සහතික කිරීම.
- ප්‍රතිලාභිමුඛ ආකල්ප, වගකීම, විචක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතිත්වය, විනිවිදභාවය වැනි හර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්තිවලට අනුකූල වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරී මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍ය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතුවල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 13 දෙනා සමග ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම හා අධීක්ෂණය කිරීම.
- පරිපාලන කටයුතුවල දී ඵලදායිතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.
- දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතනවල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- සියලුම මැතිවරණ කටයුතුවල දී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණවල දී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා අදාල ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
- මුහුදු ගොඩගැලීම, නියඟ, ගංවතුර හා සුලි සුළං වසංගත තත්ත්ව වැනි විස්තීරණ ආපදා අවස්ථාවන්හි දී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම තුළින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.

## 1.4. සංවිධාන සටහන



## 1.5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

### 1.5.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳ මූලික තොරතුරු

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී වසම් | මුළු භූමී ප්‍රමාණය (ව.කි.මී.) | ජනගහනය (2021) | ජන ඝනත්වය (වර්ග කිලෝ මීටර් 1 ට) |
|---|---|---|---|---|---|
| 1. | කොළඹ | 35 | 18.0 | 344,615 | 19,145 |
| 2. | තිඹිරිගස්යාය | 20 | 24.0 | 253,786 | 10,754 |
| 3. | කොළොන්නාව | 46 | 28.0 | 204,352 | 7,298 |
| 4. | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 20 | 17.0 | 115,056 | 6,768 |
| 5. | කඩුවෙල | 57 | 88.0 | 268,694 | 3,053 |
| 6. | මහරගම | 41 | 38.0 | 209,401 | 5,511 |
| 7. | හෝමාගම | 81 | 121.0 | 253,624 | 2,096 |
| 8. | කැස්බෑව | 73 | 64.0 | 261,435 | 4,085 |
| 9. | සීතාවක | 68 | 150.0 | 121,326 | 809 |
| 10. | පාදුක්ක | 46 | 110.0 | 69,579 | 633 |
| 11. | දෙහිවල | 15 | 8.0 | 94,840 | 11,855 |
| 12. | රත්මලාන | 13 | 13.0 | 101.816 | 7,832 |
| 13. | මොරටුව | 42 | 20.0 | 179,398 | 8,970 |
| දිස්ත්‍රික්කය | | **557** | **699.0** | **2,477,922** | **3,545** |



### 1.5.2 කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 න් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

i. ව්‍යවස්ථාපිත කාර්යයන්

- උප්පැන්න/ විවාහ/ මරණ සහතික ඇතුළු පුද්ගල අනන්‍යතාව සම්බන්ධ කාර්යයන්
- ජාතික හැඳුනුම්පත් ලබා දීම හා අනු අත්සන් කිරීම්
- සියලු බලපත්‍ර වර්ග ලබා දීම, ඉඩම් අත්පත් හා ඉඩම් පැවරීම් කටයුතු
- විශ්‍රාම වැටුප් ගෙවීම හා සම්බන්ධ කටයුතු

ii. සමාජ සුබසාධන කාර්යයන්

- ගංවතුර ඇතුලු ආපදා සහන කටයුතු
- වැඩිහිටි, ආබාධිත, ගර්භණී හා රෝගාධාර ආදී පුද්ගල ආධාර ලබාදීම

iii. රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන ආදී මූල්‍ය ප්‍රභවයන්ගේ ප්‍රතිපාදන යටතේ පොදු වැසිකිළි, ග්‍රාමීය මාර්ග, කෘෂි මාර්ග හා ඇළවේලි ආදී යටිතල පහසුකම් සංවර්ධනය

### 1.5.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය |
|---|---|---|
| 01 | කොළොන්නාව | 100% |
| 02 | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | |
| 03 | කඩුවෙල | |
| 04 | හෝමාගම | |
| 05 | පාදුක්ක | |
| 06 | සීතාවක | 98% |
| 07 | කොළඹ | 95% |
| 08 | තිඹිරිගස්යාය | |
| 09 | දෙහිවල | 90% |
| 10 | මොරටුව | 90% |
| 11 | රත්මලාන | 85% |
| 12 | කැස්බෑව | 82% |
| 13 | මහරගම | 80% |

### 1.5.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ළඟා කරගෙන ඇති විජයග්‍රහණ

#### i. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- "දිසාපති කුසලාන - 2022" තරගාවලියේ ජයග්‍රහණ රැසක් ලබා ගැනීම.
- ඉන්දීය සහනාධාර යටතේ ලබාදුන් සහල් මලු, කොට්ඨාසයේ සිටින අඩු ආදායම්ලාභී පවුල් සඳහා බෙදා දීම.
- 2022 වර්ෂයේ දී ඉඩම් අත්පත් රාජකාරි ලෙස හිමිකම් පරීක්ෂණ 25ක් අවසන් කිරීම, 10 (1) (ආ) වගන්ති 20ක් හා 17 වගන්ති 15ක් පමණ නිකුත් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව පුද්ගලයින් 10කට වන්දි මුදල් ලබා දීම, පැරණි අත්පත් ගොනු 50ක් පමණ වාර්තා යොමු කිරීම, පැරණි අත්පත් කිරීම්වලට අදාළව ඉල්ලීම් ලිපි 30ක ගැටලු විසඳීම.



#### ii. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියෙන් දිවයිනේ දෙවන ස්ථානය සහ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය ලබා ගැනීම.
- 2022 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.මි. 22ක් වටිනා ව්‍යාපෘති 137ක් හා සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ ජීවනෝපාය සංවර්ධනය යටතේ වූ සියලුම ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම.

#### iii. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- 2022 වර්ෂයේ දී ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ රු.මි. 47.18ක් වටිනා ව්‍යාපෘති 78ක් ද විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති 6ක් ද සාර්ථකව නිම කර කොට්ඨාසයේ සංවර්ධනයට දායක වීම.
- "දිසාපති කුසලාන - 2022" තරගාවලියේ ජයග්‍රහණ; වයස අවුරුදු 40න් පහළ අංශයේ ජයග්‍රහණ 15ක් ලබා ගැනීම.

### iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- දිසාපති කුසලාන තරගාවලියේ කැරම්, චෙස්, මලල ක්‍රීඩා ශූරතාවය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 අතරින් සමස්ත ශූරතාවය දිනා ගැනීම.
- කොළොම්තොට වගා සංග්‍රාමයට සමගාමීව පැවැත් වූ ගෙවතු වගා වැඩසටහනේ බප/ජය ජනාධිපති ප්‍රාථමික විද්‍යාලය තෙවන ස්ථානය දිනා ගැනීම.
- වසර ගණනාවක සිට ගංවතුර අපදාවට ලක්වන බුත්ගමුව ඇළ ආශ්‍රිතව ජීවත් වූ පවුල් 42ක් සඳහා වෙනත් ස්ථානවල නිවාස 42ක් ලබාදීම.

### v. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- 2022 වර්ෂයේ කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය සහ විදුලි, ඉන්ධන හා ආර්ථික අර්බුදය හමුවේ කොට්ඨාසයේ ජන ජීවිතය අඛණ්ඩව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.
- කාර්යාලයේ සාමාන්‍ය සේවා කටයුතු හා කොට්ඨාසයට අදාල සංවර්ධන කටයුතු ද අවම කාර්යය මණ්ඩලයක් යටතේ කාර්යක්ෂම ව ඉටුකිරීම.

### vi. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- 2021 වර්ෂයේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද අන්තර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තරගයෙන් දිවයිනේ තෙවන ස්ථානය දිනා ගැනීම.

### vii. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- 2022 වර්ෂයේ පවත්වන ලද දිසාපති කුසලාන ක්‍රීඩා තරගාවලියේ ක්‍රිකට් (පිරිමි) ශූරතාවය, චෙස් අනු ශූරතාවය, කැරම් අනුශූරතාවය හා මලල ක්‍රීඩා ජයග්‍රහණ දිනා ගැනීම.

## viii. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ කාර්යාලයේ සාමාන්‍ය සේවා කටයුතු හා කොට්ඨාසයට අදාල සංවර්ධන කටයුතු අවම කාර්ය මණ්ඩලයක් යටතේ කාර්යක්ෂමව ඉටු කිරීම.

## ix. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- "The Voice of Colombo"තරගාවලියට ඉදිරිපත් වූ නිලධාරිනියක් එහි අවසන් 12 දෙනා අතරට තේරී පත්වීම.
- 2022 දිසාපති කුසලාන තරගාවලියේ වොලිබෝල් කාන්තා අනුශූරතාවය ඇතුළු ජයග්‍රහණ 06ක් හා වොලිබෝල් කාන්තා දක්ෂතම ක්‍රීඩිකාව සම්මානය හිමි කර ගැනීම.

## x. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- වගා කළ හැකි, එහෙත් වගා නොකළ ගෙවතු 2082ක වගා කටයුතු කොළොම්තොට වගා සංග්‍රාමය යටතේ වගා කිරීම.
- දිසාපති කුසලාන ක්‍රීඩා තරගාවලියේ මලල ක්‍රීඩා අංශයේ අනුශූරතාවය හා ක්‍රිකට් තරගාවලියේ අනුශූරතාවය දිනා ගැනීම.
- කොට්ඨාසයේ හඳුනාගත් පාසල් හැර ගිය සහ විධිමත් අධ්‍යාපන ධාරාවෙන් ගිලිහී ගිය දරුවන්/තරුණයන් 165ක් වෘත්තීය පාඨමාලාවල ලියාපදංචි කිරීම හා පසු විපරම් කිරීම.

## xi. දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- ඉදිකිරීම් ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩවල හිඟය හා මිල අධික ලෙස ඉහළ යාම, බලශක්ති අර්බුදය හේතුවෙන් ප්‍රවාහන ගැටළු ඇතිවීම, විදුලිය කප්පාදුව ආදී අභියෝග මධ්‍යයේ වුව ද විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන භාවිතා කර සැලසුම් කරන ලද ව්‍යාපෘති සියල්ල වඩා ඵලදායී අයුරින් අවසන් කිරීමට හැකිවීම.
- 2022 දිසාපති කුසලාන ක්‍රීඩා තරගාවලියේ හෙල්ල විසිකිරීමේ දෙවන ස්ථානය හා මීටර් 800 ඉසව්වෙන් තුන්වන ස්ථානය දිනා ගැනීමට හැකි වීම.

- සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනට සම්බන්ධ ව්‍යවසායකයින් අසූහතර දෙනාගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා අලෙවි පොළක් පවත්වා රු.300,000ට අධික ආදායමක් උපයා ගැනීමට සැලසීම.
- නව කාර්යාලයක් ඉදි කිරීම සඳහා සුදුසු භූමියක් ලබාගෙන, සැලසුම් සකස් කර, ඊට අදාල කැබිනට් පත්‍රිකාව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
- මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකිරීම.

### xii. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හමුවේ වුව ද සීමිත සම්පත් උපයෝගී කර ගනිමින් කාර්යක්ෂම හා උපරිම ලෙස මහජන සේවාවන් ඉටු කිරීම.

### xiii. මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- 2022 දිසාපති කුසලාන ක්‍රීඩා තරගාවලියේ දී එල්ලේ (පිරිමි) ශූරතාවය, කඹ ඇදීම (කාන්තා) ශූරතාවය, බැඩ්මින්ටන් (කාන්තා යුගල) අනු ශූරතාවය හා මලල ක්‍රීඩා ඉසව් 10කින් ජයග්‍රහණ ලබා ගැනීම හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 45 දෙනකු දිසාපති වර්ණ දිනා ගැනීම.
- “කොළොම්තොට වගා සංග්‍රාමය” දිස්ත්‍රික් ගෙවතු වගා තරගාවලියේ ජයග්‍රහණ 07ක් දිනා ගැනීම

## 1.5.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුහුණ දෙන ලද අභියෝග

### i. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කජීමාවත්ත ගින්න - 2022.09.27 දින කජීමාවත්තේ පිහිටි පැල්පත් කිහිපයක් ගිනි ගෙන විනාශ විය. එම පැල්පත්වාසීන් මෝදර උයන ප්‍රජා ශාලාව හා කැලණි නදී විහාරයේ ප්‍රජා ශාලාව වෙත යොමු කළ අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාව, කොළඹ මහ නගර සභාව සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ඇතිව ඔවුන් වෙත ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය උපකරණ ලබා දෙන ලදී.



- කොවිඩ් 19 - වසංගතය පැවතිය ද කාර්යාලයීය නිලධාරීන්ගේ සෞඛ්‍යාරක්ෂාව සුරක්ෂිත කරමින් පීඩාවට පත් වූ කොට්ඨාසයේ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කරමින් ඔවුන්ට සහන සැලසීම.
- එක්ස්ප්‍රස් පර්ල් නෞකාව හානි වීම හේතුවෙන් බලපෑමට ලක් වූ ධීවර ජනතාව වෙත වන්දි ලබාදීමේ කටයුතු ඉටු කිරීම.

## ii. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කාර්යාලය තුළ මානව සම්පත (කළමණාකරණ සහකාර) ප්‍රමාණවත් නොමැති වීම,
- කාර්යාල නිලධාරීන්ට රාජකාරී ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිගණක, මුද්‍රණ යන්ත්‍ර ඇතුලු කාර්යාල උපකරණ ප්‍රමාණවත් නොවීම.
- වසම් මට්ටමින් රාජකාරි කිරීමේ දී අනවශ්‍ය දේශපාලන බලපෑම්වලට ලක්වීම.

## iii. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කාර්යාල නිලධාරීන් සඳහා පහසුවෙන් රාජකාරී කටයුතු කිරීමට ප්‍රමාණවත් තරම් ඉඩකඩ නොමැති වීම.
- කාර්යාල නිලධාරීන්ට රාජකාරී ඉටු කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ඇතුලු කාර්යාල උපකරණ ප්‍රමාණවත් නොවීම.

## iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කාර්යාල නිලධාරීන් සඳහා පහසුවෙන් රාජකාරී කටයුතු කිරීමට ප්‍රමාණවත් තරම් ලිපි ද්‍රව්‍ය, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ඇතුළු කාර්යාල උපකරණ නොමැතිවීම.
- අඛණ්ඩ විදුලි සැපයුම නොමැතිවීම, ඉන්ධන අර්බුදය හා ප්‍රවාහන වියදම් අධිකවීම මත කොට්ඨාසයෙන් පිටත හා දිස්ත්‍රික්කයෙන් පිටත නිලධාරීන් සේවයට වාර්තා කිරීමේ දී අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර හදිසි හා අත්‍යාවශ්‍ය රාජකාරි ඉටු කිරීමේ දී අවම මානව සම්පත් භාවිතයෙන් සියළු මෙහෙයුම් කටයුතු කිරීමට සිදුවීම.

## v. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් විදුලි, ඉන්ධන හා ආර්ථික අර්බුදය හමුවේ අවම කාර්යය මණ්ඩලයක් යටතේ මහජනතාවට සේවා සැපයීම.

- කොට්ඨාසයේ සංවර්ධන කටයුතු හා කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතුවෙන් පැන නැඟුණු ගැටළු සාර්ථකව විසඳීම.

### v. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- වසම්වල සේවය කරන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි නිලධාරීන් සඳහා පවතින කාර්යාල පහසුකම් සීමිත වීම.
- රටේ ආර්ථික අර්බුදය හමුවේ සාමාන්‍ය රාජකාරී ඉටුකිරීමේ දී හා සහන සැලසීමේ කටයුතුවල දී ඇතිවන ප්‍රවාහන දුෂ්කරතා හා ප්‍රතිපාදන නොමැතිවීම.

### vii. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- 2022 වර්ෂයේ වැඩ අවසන් කළ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබීම නිසා ගිවිසුම්ගත ආයතන හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් දැඩි විවේචන එල්ල වීම.
- භාණ්ඩ මිල ගණන් කැඳවීමේ දී අඛණ්ඩ මිල උච්ඡාවචනය නිසා මිල ගණන් නොලැබීම හා භාණ්ඩ හිඟය නිසා භාණ්ඩ ලබා ගැනීමේ අපහසුතා.
- ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහළ යෑම හා හිඟය නිසා නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී කොන්ත්‍රාත්කරු විසින් නියමිත දිනට වැඩ අවසන් නොකිරීම.
- ඉන්ධන අර්බුදය හේතුවෙන් අතිරේක රාජකාරි විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැවරීම.

### viii. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින්, විදුලි, ඉන්ධන හා ආර්ථික අර්බුදය හමුවේ ග්‍රාම නිලධාරි වසම් 73ක, තම කාර්යයන් ඉටු කර ගැනීමට පැමිණෙන මහජනතාව උදෙසා කාර්යක්ෂම සේවාවක් ලබා දීම.

### ix. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- ඉන්ධන අර්බුදය හමුවේ අත්‍යවශ්‍ය සේවාවන් හඳුනාගෙන ඒ සඳහා සීමා සහිතව ඉන්ධන අවසර පත්‍ර නිකුත් කිරීම.
- 2022.05.09 දින සිදු වූ අරගලය හේතුවෙන් විනාශයට පත් වූ නිවාස, දේපල හා වාහන කඩිනමින් තක්සේරු කිරීම.
- වසම් 68ට අදාලව ජනතාව විසින් යොමු කරන ලද සමාජ සුබසාධන අයදුම්පත් 15,924ක් ඉතා කඩිනමින් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම.

### x. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- ඉන්ධන හා ආර්ථික අර්බුදය වැනි තත්වයන් යටතේ අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට සිදු වීම.

### xi. දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- LGN හරහා අන්තර්ජාල පහසුකම් භාවිතයේ පැවති විවිධ තාක්ෂණික ගැටලු හේතුවෙන් කාර්යක්ෂම මහජන සේවයක් ලබාදීමේ ගැටළුවලට මුහුණ දීමට සිදු විම.



- කාර්යාල නිලධාරින්ගෙන් වැඩි පිරිසක් කොට්ඨාසයෙන් පිටත හා දිස්ත්‍රික්කයෙන් පිටත නේවාසික නිලධාරීන් වීම හේතුවෙන් ප්‍රවාහන අපහසුතා පැවති අත්‍යවශ්‍ය අවස්ථාවන්හි දී අවම මානව සම්පත් භාවිතයෙන් සියලු මෙහෙයුම් කටයුතු ඉටු කිරීමට සිදුවීම.
- දෙහිවල මංසන්ධියේ පවතින අධික වාහන තදබදය හේතුවෙන් සේවා ස්ථානය වෙත පැමිණීමේ දී නිලධාරීන්ට හා සාමාන්‍ය ජනතාවට දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවීම.
- කාර්යාලීය ඉඩකඩ ප්‍රමාණවත් නොමැතිවීම නිසා දෛනිකව පැමිණෙන සේවාලාභීන්ට විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවීම.

### xii. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කොවිඩ්-19 වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් සීමිත සම්පත් ඉතාම අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමට සිදුවීම.
- කාර්යාලයේ අභ්‍යන්තර හා බාහිර ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- ඇතැම් තනතුරු සඳහා නිලධාරී පුරප්පාඩු පැවතීම.

### xiii. මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කාර්යාලයේ අභ්‍යන්තර හා බාහිර ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම..
- කාර්යාල කටයුතු සඳහා භාවිතා කරන පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර ඇතුළු කාර්යාල උපකරණ ප්‍රමාණවත් නොවීම සහ දැනට භාවිතා කරන එම උපකරණ නිතර අළුත්වැඩියාවට යොමු කිරීමට සිදුවීම නිසා කාර්යාල කටයුතුවලට බාධා ඇතිවීම.

- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
- නිලධාරීන්ගේ පුහුණු අවස්ථා ප්‍රමාණවත් නොවීම.
- වසම්වල සේවය කරන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි නිලධාරීන් සඳහා පවතින කාර්යාල පහසුකම් සීමිත වීම.

## 1.5.6 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිරි ඉලක්ක

### i. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කර ගනිමින් හා 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු ළඟා කර ගැනීමට රාජ්‍ය ප්‍රතිපත්ති හා යහපාලන මූලධර්ම අනුගමනය කරමින් කොළඹ ජනතාව තෘප්තිමත් වන ලෙස ඔවුන්ගේ අවශ්‍යතා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර දීම.

### ii. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- මහජනතාවට උපරිම සේවයක් ලබා දීම.
- දිස්ත්‍රික්කයේ සංවර්ධනය අතින් ප්‍රමුඛතම කාර්යාලය බවට පත් කිරීම.
- කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ජනතාවට උපරිම සහන සැලසීම.
- පුහුණු වැඩමුළු පවත්වා ඒ තුළින් ස්වයං රැකියා අවස්ථා උදාකර දී අර්බුදකාරී අවස්ථාවන්ට මුහුණ දීමේ අවස්ථා අවම කිරීම.
- පාසල් හැරයන් දරුවන් පාසල්ගත කිරීමට යොමු කරලීම.
- කොට්ඨාසයේ සංවර්ධන ව්‍යාපෘති ඵලදායීව සහ සාර්ථකව ඉටුකර මහජනතාවගේ ජීවනෝපාය සහ කොට්ඨාසයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

### iii. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කොට්ඨාසයේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම තුළින් සවිබල ගැන්වූ ප්‍රජාවක් බිහි කිරීම.

- කොට්ඨාසයේ ඉදිරි සංවර්ධන ව්‍යාපෘති ඵලදායීව සහ සාර්ථකව ඉටුකර මහජනතාවගේ ජීවනෝපාය සහ කොට්ඨාසයේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් මහජනතාවට උපරිම සේවයක් සැපයීම.

## iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- මහජනතාවට උපරිම සේවයක් ලබා දීම.
- දිස්ත්‍රික්කයේ සංවර්ධනය අතින් ප්‍රමුඛතම කොට්ඨාසය බවට පත් කිරීම.
- පෝෂණ ඌනතා ගැටළු අවම කිරීම.
- වෙළඳපල අවස්ථා ඇති කිරීම.
- අධ්‍යාත්මිකව පෝෂිත සමාජයක් බිහි කිරීම.
- කොට්ඨාසයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- කොට්ඨාසයට අනුමත වන සංවර්ධන ව්‍යාපෘති ඵලදායීව සහ සාර්ථකව ඉටුකර මහජනතාවගේ ජීවනෝපාය සහ කොට්ඨාසයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## v. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- කොවිඩ්-19 වසංගත තත්ත්වය, විදුලි, ඉන්ධන හා ආර්ථික අර්බුද, ජනතාවට කඩිනම් හා අඛණ්ඩ සේවා සැපයීමට බාධාවක් කර නොගෙන සියළුම අංශයන්හි රාජකාරී කටයුතු සාමාන්‍ය පරිදි ඉටුකිරීම හරහා සැලසුම්ගත රාජකාරිවල ඉලක්කයන් සපුරා ගැනීම.

## vi. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- නව තාක්ෂණ ක්‍රමවේද භාවිතයෙන් හා පවතින මානව සහ භෞතික සම්පත් ඵලදායීව කළමනාකරණය කර ගනිමින් කොට්ඨාශයේ ජනතාවට ප්‍රශස්ථ සේවයක් සැපයීම හා "අලුත් ගමක් අලුත් රටක්" ජාතික ඒකාබද්ධ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය තුළින් කොට්ඨාසයේ ජනතාව ආර්ථික, සමාජීය වශයෙන් සවිබල ගැන්වීම හා ආහාර සුරක්ෂිතාව ඇති කරලීම.
- 2023 වර්ෂයට අදාළ කාර්ය සාධන ගිවිසුමේ සඳහන් ඉලක්ක සියල්ල සපුරාලීම.

### vii. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- නව ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර කාර්යාලය වැඩි ඉඩ පහසුකම් සහිතව ස්ථාපනය කිරීම.
- කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම.

### viii. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගනිමින් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකරලීමට ජාතික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීමට උපරිම අයුරින් දායකත්වය ලබාදීම.

### ix. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- මාසයකට වසම් 2 බැගින් තෝරාගෙන, පවතින ඉඩම් ගැටළු (බලපත්‍ර/දීමනාපත්‍ර/බදු බලපත්‍ර/ රජයේ රක්ෂිත ඉඩම්) නිරාකරණය කිරීම.
- ඉඩම් කච්චේරි පවත්වා බලපත්‍ර ලබා දීම.
- දීමනා පත්‍ර ලබා දීම හා දීමනා පත්‍ර පසු කටයුතු සිදු කිරීම.
- රජයේ ඉඩම් හඳුනාගෙන සංරක්ෂණය කිරීම.
- වසම් 68හි රජයේ ඉඩම්වල පිඹුරු පිටපත්වලට අදාලව දත්ත පද්ධතියක් සැකසීම හා අදාළ තොරතුරු ග්‍රාම නිලධාරී වෙත දත්ත පද්ධතිය මඟින් සම්ප්‍රේෂණය කිරීම.
- ජනතා සේවා කවුළු සියල්ල ජනතාවට පහසුවෙන් ළඟා විය හැකි පරිදි ස්ථානගත කිරීම.
- සමාජ සුබ සාධන වැඩසටහන හා සම්බන්ධ ගණන් ගැනීමේ නිලධාරීන් විසින් ඉල්ලුම්කරුවන්ගේ දත්ත රැස්කිරීම.

### x. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- රජය විසින් පවරනු ලබන කාර්යයන් හා ඉලක්ක සපුරාලීම සහ මහජනතාවට තෘප්තිමත් සේවයක් සැලසීම.

### xi. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

- 2023 ක්‍රියාකාරී සැලැස්ම 100%ක් සාර්ථක කර ගැනීම.
- ඉඩ පහසුකම් සහිත භූමියක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා කටයුතු කිරීම.

## xii. මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



- කාර්ය මණ්ඩලය හා පවතින සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් අදාළ බාහිර පාර්ශවයන් සම්බන්ධීකරණයෙන් ප්‍රදේශයේ මහජනතාව වෙත කාර්යක්ෂවම හා ඵලදායී ලෙස රාජ්‍ය සේවා සැපයීම.

# 2 පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1. ආයතන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13හි කාර්යාල කටයුතු නිසි ලෙස සිදු කරලීමට අදාළව කාර්යාල කළමනාකරණ තරඟයක් පැවැත්වීම.
2. ආර්ථික අර්බුදය හමුවේ ජන ජීවිතය පවත්වාගෙන යාමට අසීරු ජනතාව වෙත සවියක් වීමට පෞද්ගලික අංශ හා ආයතන 11ක් සම්බන්ධ කරමින් මූල්‍යමය හා මූල්‍යමය නොවන ආධාර බෙදා දීමේ වැඩසටහන් 11ක් ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභී පවුල් 281,883කට සහන ලබාදීම.
3. අභ්‍යාසලාභී උපාධිධාරීන් 402ක් සඳහා සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලිපි ලබා දීම හා සේවා ස්ථාන සඳහා අනුයුක්ත කිරීම.
4. ඉන්දීය මානුෂීය ණය ආධාර යටතේ සහල් කිලෝ ග්‍රෑම් 10 පැකට් 225,890ක් හා කිරිපිටි කිලෝ ග්‍රෑම් 15 මලු 1,100ක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 13හි බෙදාදීම.
5. අඩු ආදායම්ලාභී පාසල් සිසුන් 1,288 දෙනකු සඳහා නැණමිණ ශිෂ්‍යත්ව ලබාදීම.
6. දිසාපති කුසලාන ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයීය නිලධාරීන්ගේ සේවක අභිප්‍රේරණය ඇති කිරීම.



7. 2022.05.09 දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් සිදු වූ අලාභ හානි සඳහා වන්දි ලබා දීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම.
8. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සම්බන්ධ කරමින් “Voice of Colombo” රියැලිටි තරගාවලිය පවත්වා ජයග්‍රහණය ලද නිලධාරීන්ට ජාතික මට්ටම දක්වා යාමට ඉඩ හසර විවර කිරීම.

**අභියෝග**

1. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කිරීමට සිදුවීම.
2. රටේ පැවති ඉන්ධන අර්බුදය හමුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සඳහා ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීම සඳහා පැවැති දුෂ්කරතා.
3. සීමිත කාලසීමාවක් තුළ පැමිණෙන හදිසි රාජකාරී කටයුතුවල දී දෛනික රාජකාරී කටයුතු සමඟ කළමනාකරණය කර ගනිමින් කටයුතු කිරීමට සිදුවීම.

4. රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ පැන නැඟුණු ඉන්ධන හිඟය හේතුවෙන් නිලධාරීන් සීමා සහිතව කැඳවීමට සිදුවීම.
5. රටේ මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ පැනනැගුණු මහජන අරගල අවස්ථාවල දී රාජකාරී කටයුතු කිරීමට සිදුවීම.

**ඉදිරි ඉලක්ක**

1. 2023 වර්ෂයේ ආයතන අංශයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව 100% වැඩි කිරීම සඳහා ආයතන අංශය වෙත පැමිණෙන සේවාලාභීන්ගේ සේවා අවශ්‍යතා පුරවැසි ප්‍රඥප්තිය මත ඉටු කිරීම.
2. ජ්‍යෙෂ්ඨ, ද්විතියික හා ප්‍රාථමික නිලධාරීන්ගේ කාර්ය සාධනය වර්ධනය වන ආකාරයේ වැඩසටහන් 20ක් සැලසුම් කිරීම.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනඟා ගනිමින් අවශ්‍ය සියලු කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා පුහුණු වැඩසටහන් හා සේවක අභිප්‍රේරණය වැඩි කිරීම උදෙසා වන රසවින්දන වැඩසටහන් පැවැත්වීම.
4. කළමනාකරණ සේවා නිලධාරි, රියදුරු හා කාර්යාල කාර්ය සහයක තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීම.
5. රජයේ ප්‍රතිපත්තිමය අවශ්‍යතා මත ක්ෂණිකව සිදු කරන දැනුම් දීම අනුව කෙටි කාලයකින් සංවිධානය කිරීමට සිදුවන විවිධ වැඩසටහන් සාර්ථකව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජනතා පැමිණිලි සඳහා වගකීම් සහිත ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම හා ක්‍රියාත්මක කිරීම.

## 2.2. ක්‍රමසම්පාදන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. දිස්ත්‍රික්කයේ ජනතාවට මුහුණ පෑමට සිදු වී ඇති හදුනාගත් ගැටළු සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මඟින් විසඳුම් ලබාදීමට හැකිවීම.



   - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බුත්ගමුව ග්‍රාම නිලධාරී වසමේ බුත්ගමුව ඇළ ආශ්‍රිතව අනවසරයෙන් පදිංචි පවුල් 42ක පුද්ගලයින් එම ආපදා තත්වයෙන් මුදවා ගැනීම සඳහා වෙනත් විකල්ප නිවාස යෝජනා ක්‍රමයක නැවත පදිංචි කරවීම හා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් අදාළ ඉඩම ඵලදායී භාවිතය සඳහා නිදහස් කර ගැනීම.

- බෙල්ලන්විල - අත්තිඩිය අභයභූමියේ සීමා මායිම් හඳුනා ගැනීම හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණයෙන් පිඹුරක් සකස් කිරීමට කටයුතු කිරීම මඟින් අනවසර ඉඩම් අල්ලා ගැනීම නවතා අභයභූමියේ ආරක්ෂාව තහවුරු කිරීම.
- සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටහැර ප්‍රදේශය නායයෑමේ අවදානමට ලක් වී සිටින පවුල් අතුරින් මධ්‍ය අවදානම් පවුල් 127ක් පදිංචි භූමිය ස්ථාවර කිරීමේ ව්‍යාපෘතියක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ක්‍රියාත්මක කර එම පවුල්වල ජීවිත හා දේපළ සුරක්ෂිතතාව සහතික කිරීමට කටයුතු ඇරඹීම.
- එසේම අධි අවදානම් පවුල් 08ක් පදිංචි ඉඩම් වෙනුවට, නායයෑමේ අවදානම රහිත විකල්ප ආරක්ෂිත ඉඩමක පදිංචි කරවීමේ කටයුතු ආරම්භ කරමින් එම පවුල්වල ජීවිත හා දේපළ සුරක්ෂිතතාව සහතික කිරීමට කටයුතු කිරීම.
- තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර පාමංකඩ නුගගහපුර නිවාස ක්‍රමයේ පස්කණ්ඩියක අස්ථාවර බව හේතුවෙන් පවුල් 66ක් ආපදා අවදානමට ලක් වී සිටි අතර අධිකරණමය ක්‍රියාමාර්ග පවා ගෙන තිබූ මෙම ගැටළුව, අදාළ පාර්ශවයන් එකඟතාවන්ට එළඹ, සමථයකට පත් කර, අදාළ බැම්මේ වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම මඟින් ආපදා අවදානමට ලක් වී සිටි පවුල්වල ජීවිත හා දේපළ සුරක්ෂිතතාව සහතික කිරීම.



- බොල්ගොඩ ජලාශයේ දැල් කූඩු තුළ මත්ස්‍ය වගා ව්‍යාපෘතිය විධිමත්ව හා නෛතිකභාවයකින් යුතුව ආරම්භ කිරීමට අදාළ මූලික පියවර ගැනීම.
- තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිරුළ ග්‍රාම නිලධාරී වසමේ හත්බෝධිය වත්ත ඉඩමේ පදිංචි පවුල් 236ක් නිරන්තරයෙන් දැඩි සුළං ආපදාවට ලක්වීමේ ගැටළුවට පිළියම් ලෙස, එම පවුල් පුනස්ථාපන ව්‍යාපෘතියට අදාළ කටයුතු ආරම්භ කිරීම. එමඟින් සුළං ආපදා අවදානමට ලක් වී සිටින පවුල් එම අවදානමෙන් මුදවා එම පවුල්වල ජීවිත හා දේපළ සුරක්ෂිතතාව සහතික කිරීම හා ඉහළ ආර්ථික වටිනාකමකින් යුත් අක්කර 02ක පමණ ඉඩමක් ආයෝජනය සඳහා නිදහස් කර ගැනීමට හැකිවීම.
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට යටතේ ඇති අබලන් හා අවදානම් සහගත වැකන්ද නිවාස ක්‍රමයේ පදිංචි පවුල් 59ක් විකල්ප නිවාස ලබා දී ඇතත් අනවසයෙන් දැනට පදිංචි නිවාසවලම රැඳී සිටින අතර එම පවුල් කඩිනමින් ඉවත් කිරීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග නීතිපති දෙපාර්තමේන්තුව හරහා ගැනීමට කටයුතු කිරීමෙන් පදිංචිකරුවන්ට විය හැකි ආපදා අනතුරු අවම කිරීමට අඩිතාලමක් දැමීම.

- නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩහමුල්ල ග්‍රාම නිලධාරී සේවා පියස හා පොදු සේවා මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ මූලික ඉදි කිරීම් කඩා දැමීම නිසා රජයට සිදු වූ පාඩුව රු.මි. 1.747කි. එම අධිකාරියේ යෝජිත නිවාස ව්‍යාපෘතියකට තෝරා ගන්නා ආයෝජකයින් විසින් ගෙවනු ලබන මූලික ගෙවීමකින් එම පාඩුව පියවීමට එකඟ වීම නිසා රජයට සිදු වූ පාඩුව ඌනපූරණය කිරීමට හැකිවීම.
- මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බොරලැස්ගමුව වැව ආශ්‍රිතව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදි කරන ලද ව්‍යාපෘතියක නඩත්තුව හා හිමිකාරිත්වය මහරගම නගර සභාවට පැවරීම මඟින් ව්‍යාපෘතියේ තිරසර බව සහතික කිරීම හා එම වැව අවට ප්‍රදේශයේ ආරක්ෂිත බව හා සුන්දරත්වය සුරැකීම.

2. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමේ කාර්යයන්වල දී වටිස්ඇප් සමූහ වැනි තාක්ෂණ යෙදවුම් භාවිතය මඟින් කඩදාසි භාවිතය අවම කිරීම හා පිරිවැය අඩු කිරීමට දායකවීම.
3. කොවිඩ්-19 වසංගතය හා රට තුළ පැවති අර්බුදකාරී කාල වකවානුවේ දී පවා මාර්ගගත ක්‍රමය ඔස්සේ Google Meet වැනි තාක්ෂණ යෙදවුම් භාවිතා කර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම මඟින් ආයතන අතර සම්බන්ධීකරණය හා තීරණ ක්‍රියාත්මක කිරීම බාධාවකින් තොරව ඉටු කිරීම.

**අභියෝග**

1. කොළඹ දිස්ත්‍රික්කයේ පැල්පත්වාසී ජනතාව වෙසෙන ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කිරීම.
2. අඩු පහසුකම් සහිත නිවාසවල ජීවත්වන ජනතාවගේ නිවාස හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
3. ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීම.
4. දිස්ත්‍රික්කය තුළ අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදායම ඉහළ නැංවීමේ දී ඔවුන්ව නිෂ්පාදන ක්ෂේත්‍රවලට යොමු කරවීම.
5. අනවසර හා කුලී පදනමින් පදිංචිව සිටින නිවැසියන්ගේ නිවාස පහසුකම් වැඩිදියුණු කිරීමට පවතින නෛතික ගැටළු.
6. අබලන් නිවාස ක්‍රමවල පදිංචි ජනතාව ඉවත් කිරීම සඳහා බලපාන නෛතික බාධා සහ එම නිවාස ක්‍රම අයත් ආයතන විසින් තීරණ ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී බව.

**ඉදිරි ඉලක්ක**

1. ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කමිටු සෑම වසමකම ස්ථාපිත කර ග්‍රාම නිලධාරී වසම ආර්ථික ලෙස සවිබල ගැන්වීම.
2. දැනට සිටින අඩු ආදායම්ලාභී ජනතාවගෙන් අවම ලෙස 25%ක් නිෂ්පාදන ආර්ථිකයට යොමුකිරීම.

3. වගා කළ හැකි සෑම ස්ථානයකම වගාව සඳහා ප්‍රජාව යොමුකිරීම.
4. දිස්ත්‍රික්කය තුළ දැනටමත් ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ නිෂ්පාදන අපනයනය සඳහා ප්‍රවර්ධනය කිරීම.
5. දිස්ත්‍රික්කයේ ඇති පුරන් කුඹුරු ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීම.
6. විසිතුරු මසුන් අපනයනය ඉහළ නැංවීම.
7. ධීවර ක්ෂේත්‍රයේ අගය එකතු කළ නිෂ්පාදන ඉහළ නැංවීම (උදා: කරවල, උම්බලකඩ).
8. වගාවන් සඳහා ජලය විධිමත්ව ලබාදීමට දිස්ත්‍රික්කයේ වැව් හා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම.
9. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගන්නා ලද ග්‍රාමීය ක්‍රීඩාපිටි හා පාසැල් ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම.
10. ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැනිවීම තුළින් සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීම සඳහා දායකවීම.

## 2.3. ගිණුම් අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල 255 වැය විෂය යටතේ ලද රු.මි.2,185.5 ප්‍රතිපාදනයෙන් රු.මි.1,961.59ක වියදමක් දරමින් උපරිම උපයෝජනය කිරීම.
2. වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අදාල වැය විෂයන් 51ක් සඳහා ලද රු.මි. 3,500.13 ප්‍රතිපාදනය කළමනාකරණය කරමින් රු.මි. 3,131.33ක වියදමක් දරා තිබීම.
3. ගම සමග පිළිසඳරක් වැඩසහනට අදාලව 255 වැය විෂය යටතේ වෙන් කරන ලද රු.මි. 946.5 ක ප්‍රතිපාදනයෙන් රු.මි. 825.19 ක උපරිම උපයෝජන වියදමක් දරමින් සියළු බිල්පත් ගෙවා අවසන් කිරීම.
4. ප්‍රවර්ථන වර්ෂයේ දී ඇතිවූ හදිසි ආපදා තත්වයන් සඳහා වෙන් කළ රු.මි. 4.348ක ප්‍රතිපාදනය උපයෝගී කර ගනිමින් රු.මි. 4.028 ක වියදමක් දරමින් , පීඩාවට පත් ජනතාවට සහ හානි වූ දේපළවලට වන්දි ගෙවීමට කටයුතු කිරීම.
5. විනාශයට පත් වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාව වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේ දී ඉල්ලුම් කරන ලද රු.මි. 258.5 ක වන්දි මුදලින් රු.මි. 256.28ක ප්‍රමාණයක් ගෙවා අවසන් කිරීම.
6. මූල්‍ය කළමනාකරණය
7. විධිමත්ව පවත්වාගෙන යාම තුළින් 2021 වසරට වඩා 2022 වසරේ විගණන විමසුම්වලට ලක්වීම 78.57% දක්වා අඩු කර ගැනීමට හැකිවීම.
8. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තිබූ භාවිතයෙන් ඉවත් කළ යුතු තත්වයේ පැවති විධායක සහ කාර්යාල පුටු 150ක් පමණ සහ අබලන් තත්වයේ පැවති ප්‍රධාන ශ්‍රවණාගාරයේ පුටු 115 ක් ද රු. 1,942,000.00ක වියදමින් අලුත්වැඩියා කර යළිත් භාවිතයට ගැනීම.

9. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල තිබූ අක්‍රිය තත්වයේ පැවති UPS අලුත්වැඩියා කිරීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස UPS 20ක් නව බැටරි යොදා අලුත්වැඩියා කිරීම.

**අභියෝග**

1. රට තුළ පැවති ඉන්ධන හිඟය හමුවේ සියළු නිලධාරීන් සේවයට ගෙන්වා ගැනීම අපහසුවීම.
2. ප්‍රවර්ථන වර්ෂය තුළ මූල්‍ය අර්බුදය හමුවේ, කරගෙන යමින් තිබූ බොහෝ සංවර්ධන වැඩසටහන් අතරමඟ නතර කිරීමට සිදුවීම.
3. කාර්තුමය ක්‍රමයට අයවැය ඉදිරිපත් කිරීම හේතුවෙන් ගිණුම් පියවීම් කටයුතු කාර්තුමය ක්‍රමයට කිරීමට සිදු වීම.
4. ITMIS දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේ දී ප්‍රායෝගිකව ඇතිවන අපසුතාවයන්ට මුහුණදීමට සිදුවීම.

**ඉදිරි ඉලක්ක**

1. 2023 වර්ෂය වෙනුවෙන් ලද රු.මි. 1,650 ප්‍රතිපාදන නිකුත් කිරීම.
2. 2018 අංක 19 දරන විගණන පනතට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, 2023 පෙබරවාරි 28 දිනට පෙර පිළියෙල කිරීම.
3. 2023 වසර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය ඇස්තමේන්තු 2022 සැප්තැම්බර් මස සකස් කිරීම.
4. 2023 වර්ෂය වෙනුවෙන් අක්මුදල් ලබා ගැනීම සඳහා අක්මුදල් අයදුම්පත්‍රය 2023 ජනවාරි 15 දිනට පෙර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.
5. අක්මුදල් සැසඳුම් වාර්තාව 2023 ජනවාරි 10 දිනට පෙර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.
6. වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් ලැබෙන සියළු ප්‍රතිපාදන උපයෝජනය කිරීම.
7. අක්මුදල් හා ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයන පරිදි නව CIGAS වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
8. 2023 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර රජයේ විගණන කාර්යාලය වෙත ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම හා ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
9. රැඳවුම් මුදල් හා අනෙකුත් තැන්පතු සම්බන්ධයෙන් වැය ලෙජර පවත්වා ගැනීම හා අවශ්‍ය වාර්තා මාසිකව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය නිලධාරීන්ට ණය හා අත්තිකාරම් ලබා දීම වෙනුවෙන් වූ අත්තිකාරම් බී ගිණුම පවත්වා ගැනීම.
11. රජයේ විගණන කාර්යාලය විසින් යොමු කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.
12. විශ්‍රාම වැටුප් ගෙවීම වෙනුවෙන් ලැබෙන ප්‍රතිපාදන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නිදහස් කිරීම සහ ඉදිරිපත් වන ගැටළු නිරාකරණය කිරීම මෙන්ම වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප්වලින් 2023 වසර තුළ රු.මිලි. 13ක ප්‍රමාණයක් අයකර ගැනීම.

13. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන් 160 දෙනකුගේ වැටුප් හා දීමනා සකස් කිරීම සඳහා රු.මි.88.7ක ප්‍රතිපාදන ප්‍රමාණයක් උපයෝගී කර ගැනීම.
14. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවශ්‍යතාවයට සරිලන මුද්‍රිත ආකෘති පත්‍ර හා ලේඛන සැපයීම.
15. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කර, 2023 වර්ෂයේ ජූනි 15 දිනට පෙර අවසන් වාර්තාව රජයේ විගණන කාර්යාලයට ඉදිරිපත් කිරීම.

## 2.4. අභ්‍යන්තර විගණන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල දී ගනු ලැබූ තීරණ අනුව, දීර්ඝ කාලයක් ගත නොවී පෙර පැවති සියලු හිඟ ණය ශේෂ (රු. 210,736.08) අයකර ගැනීමට හැකිවීම.

**අභියෝග**

1. 2022 වර්ෂය මුල් භාගයේ දී රට තුළ ඇති වී තිබූ කොවිඩ් වසංගත තත්ත්වය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යාමට අපහසු වූ බැවින් නියමිත පරිදි විගණන කටයුතු කිරීමට නොහැකිවීම.
2. වැය ශීර්ෂ 51 ක් හා ආදායම් ශීර්ෂ 15 ක් අතරින් 75% ක ප්‍රමාණයක් විගණනය කිරීමට සංවර්ධන නිලධාරීන් 7 දෙනෙකු පමණක් ප්‍රමාණවත් නොවීම.

**ඉදිරි ඉලක්ක**

1. විගණන සැලැස්මට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විගණන පරීක්ෂණ කටයුතු සිදු කිරීම (විගණන පරීක්ෂණ 14 ක්).
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්තුවකට වරක් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා විගණන කළමනාකරණ රැස්වීම්වල දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම (රැස්වීම් 04 ක්).
3. දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කාර්තුවකට වරක් ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම (රැස්වීම් 52 ක්).
4. කාර්යාලවලට යොමුකරනු ලබන විගණන විමසුම් සඳහා නියමිත කාලය තුළ පිළිතුරු ලබා ගැනීම.

## 2.5. ඉංජිනේරු අංශය

**අභියෝග**



1. ඩොලර් හිඟතාවය හේතුවෙන් රජයේ ආනයන සීමාවීම සහ දේශීය වෙළඳපලේ සැපයුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය වෙළඳපලේ පැවති ගොඩනැගිලි ඉදි කිරීමේ ද්‍රව්‍ය හිඟය.
2. ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය මිල සිඝ්‍ර ලෙස ඉහළ යාම.
3. ඉන්ධන මිල සීඝ්‍රයෙන් ඉහළ යාම සහ හිඟතාවය මත වැඩ බිම් ක්ෂේත්‍ර රාජකාරි සීමා කිරීමට සිදු වීම.
4. 2022 වර්ෂයේ නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022ට අනුව තෝරාගත් ඉදිකිරීම් පමණක් කිරීමට සිදුවීම.
5. පැවති සංචරණ සීමා හේතුවෙන් වැඩබිම් සඳහා කම්කරුවන් ගෙන්වා ගැනීම දුෂ්කර වීම.

**ඉදිරි ඉලක්ක**

1. හෝමාගම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අදියර iii ඉදිකිරීම්, අපේක්ෂිත කාල රාමුව තුළ නිම කිරීමට කටයුතු කිරීම.
2. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හරහා ලැබෙන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නියමිත කාලසීමාව තුළ සකස් කර දීම.
3. කඩුවෙල, මහරගම හා සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක විදුලි පද්ධති සඳහා සැලසුම් සකස් කිරීම හා අලුත්වැඩියා කටයුතු කිරීම.
4. තාක්ෂණ නිලධාරීන්ගේ සහ තාක්ෂණ සහයක නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ අරමුණින් වසරකට දෙවරක් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව පවත්වා, අනුමත දිස්ත්‍රික් මිල ගණන් හා කමිටු වාර්තා නියමිත වේලාවට අදාල ආයතනවලට ලබාදීම.

## 2.6. කෘෂිකර්ම අංශය

**විශේෂ ජයග්‍රහණ**



1. සෝජාන් ක්‍රමය යටතේ පුරන් කුඹුරු අක්කර 4.25ක් එළවළු බෝග වගාවට යොදා ගැනීම තුළින් පුරන් කුඹුරු වගා කිරීම සඳහා සාර්ථක නව වගා ක්‍රමවේදයක් හඳුන්වාදීම.
2. e-Agriculture වැඩසටහන යටතේ කෘෂි අංශයට අදාළ

නිලධාරීන් 317 දෙනෙක් සඳහා කෘෂිකාර්මික තොරතුරුවලට අදාළව සන්නිවේදන මෙවලම් හා ඩිජිටල් තාක්ෂණය පිලිබඳ දැනුම ලබා දීම තුළින් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.

**අභියෝග**

1. 2022 වර්ෂයේ නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022ට අනුව විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම නිසා අපේක්ෂිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
2. 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් සොයා ගැනීමට අපහසු වීම.

**ඉදිරි ඉලක්ක**

1. 2019, 2020, 2021 සහ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති නිරන්තර පසුවිපරම් කිරීම හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.
2. සීතාවක, පාදුක්ක හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා අපනයනය කේන්ද්‍රකර ගත්, අක්කර 03ක දේශීය වැල් අල බෝග වගාව හා අගය එකතු කළ දේශීය අල ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය.
3. සීතාවක, පාදුක්ක, හෝමාගම, මහරගම, කඩුවෙල, මොරටුව, කැස්බෑව සහ කොලොන්නාව යන කොට්ඨාශවල සෝජාන් ක්‍රමය යටත් පුරන් කුඹුරු අක්කර 05ක එළවළු බෝග වගා කිරීම.
4. සීතාවක, පාදුක්ක, හෝමාගම, මහරගම, කැස්බෑව, කඩුවෙල, මොරටුව, කොළඹ, කෝට්ටේ, තිඹිරිගස්යාය සහ කොලොන්නාව යන කොට්ඨාශවල තෝරා ගත් බිම්මල් වගාකරුවන් 10 දෙනෙකුගේ වගාවන් ප්‍රවර්ධනය සඳහා තාක්ෂණික උපකරණ සහ බිම්මල් ගෘහ ලබා දීම.
5. කඩුවෙල, හෝමාගම, කැස්බෑව, සීතාවක, මහරගම, මොරටුව, පාදුක්ක හා කොලොන්නාව යන කොට්ඨාශවල ආරක්ෂිත ගෘහ 15ක එළවළු බෝග වගාව ප්‍රවර්ධනය.
6. කෘ.ප.නි.ස. වසම් මට්ටමින් ගොවි සංවිධාන සහ ගොවීන් 300 දෙනෙකුට ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම මඟින් කෘෂිකාර්මික කටයුතු ඩිජිටල්කරණය සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.

## 2.7. පොහොර අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. 2022 වසරේ දී පොහොර නිෂ්පාදනකරුවන් හා ආනයනකරුවන්ට පොහොරවල ගුණාත්මකභාවය තහවුරු කොට වෙළඳ බලපත්‍ර 20ක් නිකුත් කිරීම සඳහා, අදාළ නිෂ්පාදන ආයතනවලින් හා ආනයනකරුවන්ගෙන් පොහොර නියැදි 314ක් ලබාගෙන, නිර්දේශ කර ජාතික පොහොර ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීම.

2. 2022 යල සහ මහ කන්න තුළ ඉලක්කගත ඉඩම් හෙක්ටයාර 7161ක, 100%ක් ඉක්මවා වී ගොවීන් 18618 දෙනකුට පොහොර බෙදා හැරීමට හැකි වීම.
3. 2022/23 මහ කන්නය සඳහා වී ගොවීන් 11,197 දෙනකුට රු.74,668,993.00ක වටිනාකමකින් යුතු පරිසර හිතකාමී පොහොර බෙදාදීමට හැකි වීම.



**අභියෝග**

1. රසායනික පොහොර භාවිතයෙන් ඉවත් වූ ගොවීන්ට බෙදාදීම සඳහා ගුණාත්මකභාවයෙන් උසස්, පරිසර හිතකාමී කාබනික පොහොර සපයා ගැනීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වීම.
2. රටේ පැවති ඉන්ධන හිඟය නිසා පොහොර ප්‍රවාහනයට ගැටලු මතු වීම.
3. ප්‍රාග්ධන ව්‍යාපෘති සීමා කිරීම නිසා ඇති වූ ප්‍රතිපාදන සීමාවන් හේතුවෙන් සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය ඉලක්කගත ප්‍රමාණයට ළඟාකර ගැනීමට නොහැකි විය.

**ඉදිරි ඉලක්ක**

1. 2022/23 වර්ෂයේ මහ කන්නයට අදාලව ක්‍රියාත්මක කරන ලද පොහොර සහනාධාර වැඩසටහනේ පසුවිපරම් කටයුතු.
2. පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනාගාර 19ක නිෂ්පාදනවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පසුවිපරම් කිරීම.
3. ජෛව පොහොර නිෂ්පාදනාගාර 09ක හා රසායනාගාර10ක් පිළිබඳව පසුවිපරම් කිරීම.

## 2.8. සමෘද්ධි අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන
   1.1. ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ ගෙවතු 91047ක් ස්ථාපිත කිරීම මඟින් ප්‍රතිලාභීන් වස විසෙන් තොර පෝෂදායී ආහාර රටාවකට හුරු කිරීම.
   1.2. ග්‍රාම නිලධාරී වසමක ගෙවතු 10 බැගින් වසම් 557ක බීජ පැකට් 5,570ක් බෙදා දෙන ලදී. එමඟින් 2022 වසරේ ආර්ථික අර්බුදය හමුවේ අපහසුතාවයට පත්ව සිටි සමෘද්ධිලාභී පවුල් 5570කට තම ගෙවත්තෙන් ම ආහාර වර්ග සපයා ගැනීමට හැකි විය.

2. සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන

2.1. අලෙවි පොළ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13හි වැඩසටහන් 13ක් ක්‍රියාත්මක වූ අතර දිස්ත්‍රික් අලෙවි පොළ සඳහා ව්‍යවසායකයින් 38 දෙනෙකු සහභාගී වූ අතර එමඟින් ඔවුනට අලෙවි අවස්ථා රැසක් ලබාගැනීමට හැකි විය.

3. සමාජ සංවර්ධන වැඩසටහන

3.1. සෞභාග්‍යා විශේෂ නිවාස වැඩසටහන යටතේ නිවාස නොමැති අඩු ආදායම්ලාභීන් හා සමෘද්ධිලාභීන් 111 දෙනෙකුට ආරක්ෂිත නිවාස ලබාදීමට හැකිවීම.

3.2. ජාත්‍යන්තර ළමා දින සැමරුම් වැඩසටහන යටතේ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ළමුන් 65 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදාදීම මඟින් පොත් පත් නොමැති දරුවන් පාසල් අධ්‍යාපනයට යොමු කරවීම..

3.3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක 1 බැගින් 5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන් 13ක් ක්‍රියාත්මක කරමින් දැනුමෙන් පෝෂණය වූ දරුවන් 2196ක පමණ පිරිසක් බිහි කිරීම..

4. සමාජ ආරක්ෂණ වැඩසටහන

4.1. දරු උපත් 124ක් සඳහා සමෘද්ධිලාභී මව්වරුන්ට රු.මි.1.24ක්ලබා දීම මඟින් දරු උපතක දී වියදම් පියවා ගැනීමට උපකාරී වීම.

4.2. සමෘද්ධිලාභී පවුල්වල විවාහ අවස්ථා 972ක් සඳහා රු.මි.9.72ක් ලබා දීම මඟින් සමෘද්ධිලාභී පවුල්වල විවාහ අවස්ථාවල වියදම් පියවා ගැනීමට සහය වීම.

4.3. රෝහල් ගතවීම් 2122ක් සඳහා රු.මි. 8.45ක් ලබා දී රෝගී අවස්ථාවල දැරීමට සිදුවන වියදම් පියවා ගැනීමට දායක වීම.

4.4. ප්‍රතිලාභී මරණ 1942ක් සඳහා රු.මි.38.84 ලබා දීමෙන් අවමංගල වියදම් පියවා ගැනීමට උපකාරී වීම.

4.5. විශේෂ දරු උපත් 13ක් සඳහා රු.65,000.00ක් ලබා දීම මඟින් නිවුන් දරු උපත්වලදී වියදම් පියවා ගැනීමට සහය වීම.

4.6. 2022 වර්ෂයේ දී ප්‍රතිලාභී සිසු දරුවන් 20626 දෙනකුට සඳහා රු.30,939,000.00ක මුදලක් ශිෂ්‍යත්වයක් ලෙස ලබා දීම මඟින් උසස් අධ්‍යාපනය සඳහා දායක වීමට හැකිවීම.

5. ප්‍රජාමූල වැඩසටහන

5.1. ජාතික රුක් රෝපණ දින පරිසර වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13හි පැළ 25,000ක් සිටුවමින් ‘‘සමෘද්ධි හරිත වර්ණ අස්වැද්දුම මාතෘ භූමි’’ වැඩසටහන මඟින් පරිසරය සුරැකීමේ කාර්යයට දායක වීම.

6. සමෘද්ධි සහනාධාර වැඩසටහන

6.1. රු.4500, රු.3200 හා රු.1900 වශයෙන් සමෘද්ධිලාභීන් සඳහා වාර්ෂිකව රු.මි.182.1ක සහනාධාර ලබාදීමෙන් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකවීම.

6.2. සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට මාසිකව රු.200,000 බැඟින් වාර්ෂිකව රු.මි.30.6ක් ලබාදීමෙන් නිවාස නොමැති සමෘද්ධිලාභීන් සඳහා නිවාස ඉදි කිරීමට සහාය වීම.

7. සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන

7.1. ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට විවිධ ණය වැඩසටහන් හරහා රු.මි.17,031.72ක් හා ණය 534,680ක් නිකුත් කිරීම මඟින් ජීවනෝපාය සංවර්ධනයට සහාය වීම.

**අභියෝග**

1. වසරේ මුල් කාර්තුවේ කොවිඩ් වසංගතය ව්‍යාප්ත වෙමින් පවතින කාලයක රාජකාරී ඉටුකිරීමට සිදුවීම හා කොළඹ දිස්ත්‍රික්කය අධි අවදානම් දිස්ත්‍රික්කයක් බවට පත්වීම හා නිලධාරීන් ගෙන්වීම කණ්ඩායම් වශයෙන් සිදු කිරීම.
2. ඉන්ධන හිඟය හා ප්‍රවාහන අපහසුතා හේතුවෙන් රාජකාරියට කැඳවීම සීමා කිරීම.
3. රැස්වීම් සීමා කිරීම හේතුවෙන් සන්නිවේදන ගැටළු ඇතිවීම (ප්‍රගති සමාලෝචන හා දැනුවත් කිරීම් සඳහා).
4. ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන නිසි වේලාවට නොලැබීම.
5. ප්‍රතිපාදන ලබාදුන් වැඩසටහන් සඳහා වසරේ අවසාන කාර්තුවේ දී අක්මුදල් ලැබීම නිසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විවිධ අපහසුතාවලට මුහුණ පෑම.
6. වසම්වල පවතින නිලධාරී හිඟය.

**ඉදිරි ඉලක්ක**

1. සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනයට සමෘද්ධි බැංකු හරහා ණය ලබාදීම මඟින් සහනාධාරලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාව ඉහළ නැංවීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 10 බැගින් 130 දෙනෙකු සවිබල ගැන්වීම.
2. ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධි අභිමානී 2023 පොළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් කොට්ඨාශයකින් 25 දෙනෙකු බැගින් සමෘද්ධි නිෂ්පාදකයින් 325 දෙනකුට වෙළඳපල අවස්ථා ලබාදීම.
3. සමාජ සංවර්ධන වැඩසටහන හා පරිසර සංවර්ධන වැඩසටහන යටතේ, විශේෂ නිවාස වැඩසටහන හා සෞභාග්‍යා සමෘද්ධි නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් කොට්ඨාශයකට නිවාස 09 බැගින් 117ක් ගොඩනැංවීම.
4. සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ දින 07ක් තුළ ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කිරීම.

5. සමෘද්ධි බැංකු ණය වැඩසටහන යටතේ කලාපයකට 10 දෙනෙකු බැගින් ණයලාභීන් සංඛ්‍යාව ඉහළ නැංවීම, ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා පුද්ගලයින් 420ක් යොමු කිරීම හා ඔවුන් සවිබල ගැන්වීම.

## 2.9. සංඛ්‍යාලේඛන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. නියැදි 239ක ශ්‍රමබල සමීක්ෂණ සිදු කර කොළඹ දිස්ත්‍රික්කයට අදාළ නිවැරදි තොරතුරු සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණ කාර්තුමය වාර්තා නිවැරදිව සකස් කළ හැකි වීම.
2. කොළඹ දිස්ත්‍රික්කයේ වී අස්වනු සමීක්ෂණයට අදාළව නියැදි 101ක් සිදු කිරීම මඟින් රටේ වාර්ෂික වී නිෂ්පාදනයට අදාළ නිවැරදි ඇස්තමේන්තු සකස් කළ හැකි වීම.
3. කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක මිල රැස් කිරීම් සම්බන්ධ තොරතුරු නිවැරදිව ලබා දීම තුළින් මාසිකව වී නිෂ්පාදකයාගේ මිල දර්ශකය, ජාතික පාරිභෝගික මිල දර්ශකය හා කොළඹ පාරිභෝගික මිල දර්ශකයන් නිවැරදිව සකස් කළ හැකි වීම.

**අභියෝග**

1. රට තුළ පැවති ඉන්ධන හා ආර්ථික අර්බුදය හේතුවෙන්, සමීක්ෂණ කටයුතු, ලැයිස්තුගත කිරීම් හා යාවත්කාලීන කිරීම් කාර්යක්ෂමව සිදු කිරීමේ ගැටලු මතු වීම

**ඉදිරි ඉලක්ක**

1. 2023/24 ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීම් අදියර සිදු කරමින් දිස්ත්‍රික්කයේ සංගණන කාණ්ඩ අනුව ගොඩනැඟිලි ඒකක හඳුනා ගැනීම.
2. වර්ෂයට අදාළව ශ්‍රමබල සමීක්ෂණ නියැදි 225ක, වී අස්වනු සමීක්ෂණ නියැදි 75ක හා වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සඳහා නියැදි ආයතන 150ක සාර්ථකව සමීක්ෂණ කටයුතු සිදු කිරීම.

## 2.10. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. 2022 වර්ෂයේ පැවති ඉන්ධන අර්බුදය හා දේශපාලන අස්ථාවරත්වය තුළ වුව ද දිස්ත්‍රික් පොළ හා ප්‍රාදේශීය අලෙවි පොළ 73ක් හරහා ව්‍යවසායකයින් 708ක් සඳහා රු. 18,603,149.00ක පමණ අලෙවි ආදායමක් ලබාදීමට හැකි වීම.
2. ජාතික ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා නව ව්‍යාපාර 194ක් බිහි කිරීමට හැකිවීම.



3. ව්‍යවසායකයින් සඳහා නව අලෙවි සම්බන්ධතා 305ක් සම්බන්ධීකරණය කර දීමට හැකි වීම හා ඒ හරහා CIB, Cargills, ලක්සල හා සතොස ආදී ආයතනවලින් රු 1,365,500.00ක ඇණවුම් ලබා දීමට හැකි වීම.
4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් හා සේවාලාභීන්ට අඩුපාඩුවක්ව පැවති ආපනශාලා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට හැකිවීම හා ඒ හරහා චක්‍ර රැකියා අවස්ථා 28ක් බිහි කිරීමට හැකි වීම.
5. සතිපොළ සංකල්පයට සමගාමීව හෝමාගම, පාදුක්ක, සීතාවක, අත්තිඩිය හා දෙල්කඳ යන ස්ථානයන්හි සතිපතා අලෙවි ප්‍රදර්ශන සඳහා අවස්ථාව ලබා ගැනීම හා ඒ හරහා ව්‍යවසායකයින් 22ක් සඳහා අලෙවි ආදායම් ලබා ගැනීමට හැකිවීම.
6. මෙතෙක් නීත්‍යානුකූල ව්‍යාපාර ලියාපදිංචි නොකළ ව්‍යවසායකයින් 207ක් සඳහා ව්‍යාපාර ලියාපදිංචි කිරීමට සම්බන්ධීකරණ කටයුතු කිරීම.
7. ව්‍යවසායකයින් 1033ක් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබාදීම (උදා: සබන්, රෙදි සෝදන කුඩු, විෂබීජ නාශක හා බෝතල් කළ ආහාර නිෂ්පාදනය)
8. පවත්නා ව්‍යාපාර 886ක, ආදායම, තාක්ෂණිකමය ගුණාත්මකභාවය සහ නිෂ්පාදන ධාරිතාවය යන අංශ සංවර්ධන කිරීමට හැකි වීම.
9. ව්‍යවසායකයින් 137 දෙනකුගේ නිෂ්පාදනවල ඇසුරුම් ප්‍රමිතිය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීම.

**අභියෝග**

1. පැවති ආර්ථික අස්ථාවරත්වය හා ව්‍යවසායකයින්ගේ ආදායම සීමාවීම හමුවේ අමුද්‍රව්‍ය ගැටලුව සඳහා විකල්ප සෙවීම.
2. වෙළෙඳපල පොළ අවස්ථා සීමිතවීම මත නව වෙළෙඳපල අවස්ථා සොයා දීම සීමා සහිත වීම.
3. පැවැති ඉන්ධන අර්බුදය හමුවේ සෘජුවම ව්‍යවසායකයින් වෙත ලභාවීමට පැවති අපහසුතාවය.
4. ලිපිද්‍රව්‍ය, ආහාර හා අන්තර්ජාල මිල ගණන් ඉහළ යෑම නිසා වැඩසටහන්වල ප්‍රමිතිය රඳවා ගැනීම.
5. රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු මඟින් ව්‍යවසායකයින් වෙත සපයන බැංකු ණය පූර්ණ කාලීනව නවතා දැමීම හා ඉහළ බැංකු පොලී යටතේ ව්‍යවසායකයින් සඳහා ණය අවස්ථා ලබාදීමට ඇති හැකියාව ඉතා සීමිත වීම.

**ඉදිරි ඉලක්ක**

1. පාසල් සිසුන්, වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන සිසුන්, විශ්ව විද්‍යාලවලින් පිටවන සිසුන් හා වෙනත් ප්‍රතිලාභීන් අභිප්‍රේරණය තුළින්, 2023 වසර තුළ නව ව්‍යාපාර 1700ක් බිහිකිරීම.

2. දැනට ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ව්‍යාපාර සම්බන්ධීකරණයෙන් ව්‍යවසායකයින් 1100ක් සඳහා නව අලෙවි සබඳතා උත්පාදනය කිරීම මඟින් ඔවුන්ගේ ආර්ථික මට්ටම ස්ථාවර කිරීම.
3. ව්‍යාපාර 1130 ක් ආර්ථික, තාක්ෂණික හා භෞතික වශයෙන් සංවර්ධනය කිරීම.
4. කාර්මික සංවර්ධන මණ්ඩලය, කාර්මික තාක්ෂණ ආයතනය, SLITA, ශ්‍රී ලංකා මෝස්තර පුහුණු ආයතනය, ලලිත් ඇතුලත්මුදලි පුහුණු මධ්‍යස්ථානය වැනි පුහුණු ආයතන සමඟ සම්බන්ධ වී තනි පුද්ගල හා කණ්ඩායම් වශයෙන් ප්‍රතිලාභීන් 1300 දෙනකුට ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍ය නව තාක්ෂණ දැනුම ලබා දීම.
5. ව්‍යාපාර පවත්වා ගෙන ගිය ද මෙතෙක් නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි නොවූ ව්‍යාපාර 850ක ව්‍යාපාර නාම ලියාපදිංචිය.
6. ව්‍යවසායකයින් 275ක් සඳහා නිෂ්පාදන ඇසුරුම්කරණ සඳහා අවශ්‍ය සහාය සැපයීම තුළින් උසස් තත්වයෙන් යුත් ඇසුරුම් නිර්මාණය කිරීම.
7. ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ඵලදායීතාව උදෙසා ව්‍යාපාර 225ක් පිරිවැයකරණය සඳහා යොමු කිරීම.

## 2.11. ඉඩම් පරිහරණ සැලසුම් අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. දිස්ත්‍රික්කයේ පවතින ඌන පරිහරණ ඉඩම් හඳුනා ගැනීම යටතේ 2022 වර්ෂයේ ඉඩම් හෙක්ටයාර 1500.51ක් හඳුනා ගැනීමට හැකි වීම.
2. එසේ හඳුනාගත් ඉඩම්වලින් හෙක්ටයාර 42.64ක් 2022 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කළ කොළොම්තොට වගා සංග්‍රාමය වැඩසටහන යටතේ නැවත වගා කිරීමට යොමු කළ හැකි වීම.



**අභියෝග**

1. කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදු වන ගැටලු.
2. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය සඳහා ක්ෂේත්‍ර කටයුතු හා සිතියම් කටයුතු ප්‍රායෝගිකව සිදු කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු.
3. ඉඩම් අයිතිය හා භුක්තිය හඳුනා ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී නිවැරදි හා යාවත්කාලීන වූ දත්ත ලබා ගැනීම.

**ඉදිරි ඉලක්ක**

1. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ඌන පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල පස හා ජල සංරක්ෂණය තුළින් ඵලදායීතාව ඉහළ නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

2. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ සිතියම් කටයුතු නිම කිරීම.
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් යාවත්කාලීන කිරීමේ කටයුතු නිම කිරීම.
4. ඉඩම් අයිතිය පිළිබඳ යාවත්කාලීන වූ නිශ්චිත තොරතුරු ලබා ගැනීම සඳහා සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ සමීක්ෂණය නිම කිරීම.
5. දිස්ත්‍රික්කයේ පවතින ආරක්ෂා කළ යුතු ජල මූලාශ්‍ර හඳුනා ගැනීම.

## 2.12. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කිරුම් හා මිනුම් උපකරණ සත්‍යෝක්ෂණය පිළිබඳව වෙළෙඳුන් දැනුවත් කිරීම 2021 වර්ෂයට වඩා 119.2%කින් වැඩි කර ගැනීම.

**අභියෝග**

1. 2022 මාර්තු මාසයේ රට තුළ ඇති වූ අර්බුදකාරී වාතාවරණය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් සත්‍යෝක්ෂණ කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යෑම අසීරු වීම.
2. නිල වාහන හිඟකම හේතුවෙන් ජංගම සත්‍යෝක්ෂණ මධ්‍යස්ථාන පැවැත්වීමේ හා සත්‍යෝක්ෂණ ආදායම් ඉලක්ක සපුරාලීමේ අසීරුතාවය.
3. ඉන්ධන අර්බුදය හා සංචිත ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත්ව නොලැබීම නිසා පාරිභෝගික පැමිණිලි හා තැත් කළ වැටලීම් ප්‍රමාණය අඩුවීමෙන් අපේක්ෂිත වැටලීම් ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වීම.

**ඉදිරි ඉලක්ක**

1. දිස්ත්‍රික් කිරුම් /හා මිනුම් උපකරණ සත්‍යෝක්ෂණ ආදායම 2021 වර්ෂයට වඩා 10%කින් ඉහළ නැංවීම.
2. තැත් කළ වැටලීම් 2021 වර්ෂයට වඩා 5%කින් ඉහළ නැංවීම.
3. වෙළෙඳුන් දැනුවත් කිරීම 2021 වර්ෂයට වඩා 80% කින් ඉහළ නැංවීම.

## 2.13. පුපුරන ද්‍රව්‍ය පාලන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. සීමිත පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයක් ආනයනය කළ ද සියළුම අවසර පත්‍ර 209ක් හා බලපත්‍ර 40ක් අතරේ සමානුපාතිකව බෙදා දීමට සැලැස්වීම මඟින් කර්මාන්තයේ බිඳ වැටීමකින් තොරව රැකගැනීම.



2. සේවාලාභීන්ගේ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම මඟින් අවසරපත්‍ර 209ක් හා බලපත්‍ර 40ක් කඩිනමින් ලබාදීම.
3. පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන් හා සැපයීම සිදු කරන සපයන්නා බලපත්‍රලාභීන් මාර්ගගත ක්‍රමයට දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පැවැත්වීම.
4. දිස්ත්‍රික්කය තුළ පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ගේ පුපුරන ද්‍රව්‍ය ගබඩා වලින් 95%ක් (145ක් පමණ) නවීකරණය කිරීම හා විධිමත් කිරීම.

**අභියෝග**

1. විදේශ සංචිත හිඟය හේතුවෙන් හා රුපියල අවප්‍රමාණ වීම නිසා පුපුරන ද්‍රව්‍යවල හා පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍යන්හි ආනයන පිරිවැය වැඩිවීම හේතුවෙන් පුපුරන ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ යාම.
2. විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් ලෙස පුපුරන ද්‍රව්‍ය ආනයනය කිරීමට බාධා ඇතිවීම.
3. පැවති හා පවතින ඉන්ධන හිඟය හේතුවෙන් කර්මාන්තය පවත්වාගෙන යාමට ගැටළු පැවතීම.
4. පශ්චාත් කොවිඩ් බලපෑම නිසා කර්මාන්තයේ නිරත ප්‍රමාණය අඩුවීම.
5. දිස්ත්‍රික්කයේ පුපුරන ද්‍රව්‍ය විධිමත් හා නියමිත තාක්ෂණික ක්‍රමවේදයන් යටතේ ගබඩා කිරීම සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට සුදුසු රජයේ ඉඩම් කොටසක් ලබා ගැනීමට නොහැකි වීම.
6. තොරතුරු පද්ධතිය භාවිතයට සේවාලාභීන් උනන්දු කරවීම හා ඒ සඳහා යොමු කරවීම.

**ඉදිරි ඉලක්ක**

1. දිස්ත්‍රික්කය තුළ පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ගේ ඉතිරි 5%ක් පමණ වන පුපුරන ද්‍රව්‍ය ගබඩා නවීකරණය කිරීම හා විධිමත් කිරීම.
2. තොරතුරු පද්ධතිය සම්පූර්ණ කර අන්තර්ජාලය හරහා පුපුරන ද්‍රව්‍ය සඳහා ඉල්ලුම් කිරීම මාර්ගගත ක්‍රමයට කිරීමට පහසුකම් සැලසීම.
3. සේවාලාභීන් සියලු දෙනා වෙත අවශ්‍ය අවසරපත්‍ර / බලපත්‍ර දින 14ක් ඇතුළත ලබාදීම.
4. සේවාලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් 04ක් පැවැත්වීම.

## 2.14. පර්යේෂණ හා සන්නිවේදන අංශය



**විශේෂ ජයග්‍රහණ**

1. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුව ද මාර්ගගත ක්‍රමය ඔස්සේ සැපයුම්කරුවන් 386ක් පමණ ලියාපදිංචි කිරීම.
2. කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ මාර්ගගත ක්‍රමයට සම්මන්ත්‍රණ හා රැස්වීම් 150ක් පමණ සාර්ථකව පැවැත්වීම.
3. සංස්කෘතික උත්සවය හා දිසාපති කුසලාන වර්ණ රාත්‍රිය සාර්ථකව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය පරිගණක තාක්ෂණ සහය ලබා දීම.

**අභියෝග**

1. කාර්යාලීය නිලධාරීන්ගේ අන්තර්ජාල භාවිතය, පරිගණකය ක්‍රියාකරවීම නවීන තාක්ෂණික යෙදවුම් පිළිබඳ දැනුම අසතුටුදායක මට්ටමක පැවතීම.
2. අවශ්‍ය තාක්ෂණික උපකරණ හිඟ වීම.

**ඉදිරි ඉලක්ක**

1. කාර්යාලයේ සියලුම පරිගණක හා උපාංග ක්‍රියාකාරීව පවත්වාගෙන යාම.
2. කාර්යාලයේ සියලුම නිලධාරීන්ට අඛණ්ඩ අන්තර්ජාල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම මගින් කාර්යාලයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම.
3. කාර්යාලය සඳහා අවශ්‍ය සියලුම ග්‍රැෆික් නිර්මාණ සිදු කිරීම මඟින් අඩු පිරිවැයකින් නිර්මාණශීලීව කාර්යාලීය අවශ්‍යතා සිදු කිරීම.
4. EGN ව්‍යාපෘතියට සහයෝගය ලබාදෙමින් ප්‍රදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරීන් අතර සම්බන්ධීකරණය හා ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමෙන් කාර්යක්ෂම මහජන සේවයක් ලබා දීමට අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් සැපයීම.
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මගින් අවශ්‍ය ඕනෑම පරිශීලකයෙකුට ඕනෑම ස්ථානයක සිට වෙබ් අඩවිය භාවිතයෙන් පහසුවෙන් තොරතුරු හා සේවා ලබා ගැනීමට සහය වීම.
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරවල මල්ටිමීඩියා පහසුකම සැලසීම මඟින් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස රැස්වීම් පැවැත්වීමට සහය වීම.
7. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන සියලුම නිලධාරීන්ට SSYSCGAA මාර්ගගත ගිණුම් නිර්මාණය කිරීම මගින් ආයතනික කටයුතු කාර්යක්ෂමව සහ ලිපි ද්‍රව්‍ය පිරිවැය අඩු කරමින් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම.

8. MISCO ඒකාබද්ධ සේවා මානව සම්පත් කළමනාකරණ පද්ධතියේ කටයුතු සිදු කිරීම මගින් ඒකාබද්ධ සේවයට නව බඳවා ගැනීම්, වාර්ෂික ස්ථාන මාරු වැනි දත්ත ආයතන අංශයට සහ අදාල නිලධාරීන්ට අවශ්‍යතාවය අනුව ලබා දීම.

## 2.15. මාධ්‍ය අංශය

**විශේෂ ජයග්‍රහණ**



1. “Voice of Colombo” හා දිසාපති කුසලාන වර්ණ රාත්‍රිය සාර්ථකව සිදුකර ගැනීම සඳහා අවශ්‍ය පටිගත කිරීම් හා සංස්කරණ කටයුතු සිදු කිරීම.
2. දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලද සංවර්ධන හා සුබසාධන වැඩසටහන්වල ඡායාරූප විධිමත් ලෙස පරිගණක දෘඩ තැටිවල ගබඩාකර තැබීම.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සම්බන්ධීකරණය කරමින් සංවර්ධන හා සුබසාධන වැඩසටහන්වල තොරතුරු ලබා ගැනීමට වට්සැප් සමූහයක් ආරම්භ කිරීම.
4. මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික හා වෙබ් අඩවි යන ක්ෂේත්‍රයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳව පළවන පුවත් ගබඩා කර තබා ගැනීම.
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය You Tube වැනලයක් ආරම්භ කිරීම.

**අභියෝග**

1. මාධ්‍ය ආවරණ කටයුතුවල දී අවශ්‍ය වන ප්‍රවාහන පහසුකම නොමැති වීම.
2. ඡායාරූප ගැනිමට සඳහා ඉහළ ප්‍රමිතියෙන් යුතු වෘත්තීමය කැමරාවක් (DSLR) හා විඩියෝ කැමරාවක් නොමැති වීම.

**ඉදිරි ඉලක්ක**

1. පුවත්පත්, ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය තුළ සෘජුවම තොරතුරු වාර්තාකරණයට අවශ්‍ය පසුබිම සකසා ගැනීම.
2. ගුවන් විදුලි මාධ්‍ය ඔස්සේ දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ සජීවී තොරතුරු ලබාදීම.
3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ Facebook පිටුව (District Secretariat Colombo) තවදුරටත් වැඩිදියුණු කර වඩාත් සක්‍රීයව පවත්වාගෙන යෑම.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරීන්ට වැඩමුළුවක් පැවැත්වීම හා පුහුණුවක් ලබා දීම.
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය YouTube වැනලය සඳහා කෙටි වීඩියෝපට වැනි වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

## 2.16. සමාජ ආරක්ෂණ අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා පුද්ගලයින් 847ක් දායක කර ගැනීම.
2. කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුද තත්වය හමුවේ වුව ද විශ්‍රාමිකයන් 66 දෙනෙකු සඳහා අඛණ්ඩව විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.

**අභියෝග**

1. පැවති ආර්ථික අර්බුද තත්වයය හේතුවෙන්, ක්ෂේත්‍ර රාජකාරි සීමාවීම, දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීමට අපහසුවීම හා ඒ සඳහා ප්‍රතිලාභීන්ගේ සහභාගිත්වය දුර්වල මට්ටමක පැවතීම.
2. ප්‍රතිපාදන සීමිත වීම නිසා විවිධ වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට නොහැකි වීම.
3. ආර්ථික අර්බුද තත්වය හමුවේ ඒක පුද්ගල ආදායම පහත වැටීම නිසා පුද්ගලයින් විශ්‍රාම වැටුප් හිමිකමක් ලබා ගැනීමට සම්බන්ධවීම පසෙකලා එදිනෙදා පරිභෝජන වියදම් පියවා ගැනීම කෙරෙහි යොමු වීම.
4. ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පවත්නා වෙළඳපල අවස්ථා අවම වීම හා ජීවන වියදම අධික වීම වැනි හේතූන් නිසා වාරික මුදල් නිසි පරිදි අයකර ගැනීමේ අපහසුතාවය.

**ඉදිරි ඉලක්ක**

1. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට වැඩි දායක පිරිසක් බඳවා ගැනීම (දායකයන් 2400ක ප්‍රමාණයක්) සඳහා ස්වාධීන අලෙවි ජාලය ප්‍රවර්ධනය කිරීම.
2. විදේශ විනිමය මෙරටට ගෙන්වා ගැනීම සඳහා වන ‘‘මනුසවි’’ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට විදේශ රටවල්වල සේවයේ නියුතු පිරිස් හා විදේශගත වීමට අපේක්ෂා කරන පිරිස් විදේශ සේවා පුහුණු මධ්‍යස්ථාන හරහා දැනුවත් කිරීම.
3. ප්‍රාදේශීය ලේකම්ගේ ලිඛිත ඉල්ලීමක් ඇතිව පෞද්ගලික අංශයේ ආදායම් උපයන ජනතාව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම.
4. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකත්වය ලබා සිටින අවු. 18ට වැඩි පුද්ගලයින් සඳහා වන අර්ධ ආබාධිත, පූර්ණ ආබාධිත හා මරණ පාරිතෝෂික සඳහා වන පාරිතෝෂික ප්‍රතිලාභ ඉල්ලුම් කළ පුද්ගලයින්ට ලබා දීම.
5. ‘‘ආරක්ෂාව’’ යෝජනා ක්‍රමයට දායක වී ශිෂ්‍යත්වය, සා/පෙළ සහ උ/පෙළ විභාගවලින් අදාළ නිර්ණායක සපුරා සමත් වන සියලු දෙනා සඳහා වන අධ්‍යාපන ප්‍රතිලාභ 100% මට්ටමින්ම ලබා දීම.

## 2.17. පාරිභෝගික සම්බන්ධතා අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. මුළු වැටලීම් 666ක් සිදු කර නඩු පැවරීම් 405කින් දඩ මුදල් රු.10,404,500ක් අය කර ගැනීම.
2. වැටලීම් කණ්ඩායම් දෙකක් සඳහා වාහන දෙකක් අනුයුක්ත කර ගැනීම.

**අභියෝග**

1. කාර්යාල කටයුතු සඳහා කළමනාකරණ සේවයේ නිලධාරීන් ඇතුළුව ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිවීම.
2. ක්ෂේත්‍ර රාජකාරි සඳහා ප්‍රමාණවත් විමර්ශන නිලධාරීන් නොමැතිවීම.
3. ක්ෂේත්‍ර රාජකාරි සඳහා ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිවීම.
4. ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් ඉන්ධන නොලැබීම හා සීමාවීම. (QR කේතය අනුව සතියකට ඩීසල් ලීටර 20)
5. කාර්යාල උපකරණ හිඟය.

**ඉදිරි ඉලක්ක**

1. පාරිභෝගික පැමිණිලි සඳහා (1977 ක්ෂණික ඇමතුම්) ප්‍රමුඛතාවය ලබාදීම හා ඒවාට කඩිනමින් විසඳුම් ලබාදීම.
2. සාර්ථක වැටලීම්වලට අදාළව කඩිනමින් නඩු පවරා, නීතිමය කටයුතු අවසන් කිරීම.
3. ප්‍රධාන කාර්යාලය මගින් දෙනු ලබන ඉලක්ක ලභා කර ගැනීමට කටයුතු කිරීම.

## 2.18. බෞද්ධ කටයුතු අංශය

**විශේෂ ජයග්‍රහණ**



1. කොළඹ දිස්ත්‍රික්කයේ සුදුසුකම් ලත් දහම් පාසල් ගුරු භවතුන් 9037 දෙනකුට ලබාදෙන පුස්තකාල දීමනාව 5%කින් වර්ධනය කිරීමට හැකිවීම.
2. 2022 කොළඹ දිස්ත්‍රික් දහම් පාසල් ගුරු සිසු සංගණන වාර්තාව නියමිත වේලාවට සකස් කිරීම හේතුවෙන් නිල ඇඳුම් හා පෙළ පොත් සුදුසුකම්ලත් අයට ලබාදීමට හැකි වීම.
3. ඌන සංවර්ධිත විහාරස්ථාන, ඌන සංවර්ධිත දහම් පාසල් හා පුණ්‍යාග්‍රාම වැඩසටහන් යටතේ ව්‍යාපෘති 65ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හි ක්‍රියාත්මක කිරීඹ.
4. දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ 2021/2022 අධ්‍යයන වර්ෂය සිසුන් 161 දෙනකුගෙන් ආරම්භ කිරීමට හැකිවීම.

5. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රමාණවත් ප්‍රත්‍ය පහසුකම් නොමැති පිරිවෙන් 28ක් සඳහා අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් ලබා දීම.

**අභියෝග**

1. විහාරස්ථාන හා දහම් පාසල් සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
2. ප්‍රධානාචාර්යවරුන් දහම් සරසවිය උසස් ඩිප්ලෝමාව හැදෑරීමට උනන්දුවක් නොදැක්වීම.
3. ප්‍රධානාචාර්යවරුන් දහම් ගුරු විභාගයට පෙනීසිටීම දක්වන උනන්දුව අඩු බැවින් එම විභාග පවත්වාගෙන යෑමට අසීරුවීම
4. කොරෝනා රෝග තත්ත්වය ව්‍යාප්තවීම හා රටේ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් 2022 වසරේ සංවර්ධන වැඩසටහන් සීමා කිරීමට සිදුවීම.

**ඉදිරි ඉලක්ක**

1. දහම් පාසල් ගුරු භවතුන් 600කට හා දහම් පාසල් දූ දරුවන් 1200 කට (බුද්ධ වන්දනා, ධර්ම දේශනා ආශ්‍රිතව පවත්වන) වැඩසටහන් 06ක් ක්‍රියාත්මක කරවීම.
2. උසස් ඩිප්ලෝමාවට සහභාගි වන දහම් පාසැල් ගුරුභවතුන් 161ක් 2021 වර්ෂයට සාපේක්ෂව 50%කින් වැඩි කිරීම.
3. දහම් ගුරු විභාගයට පෙනී සිටින ගුරුවරුන් සංඛ්‍යාව 50%කින් වැඩි කිරීම.
4. දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලය විසින් දහම් පාසැල් සිසුන් 100 දෙනකුට ශිෂ්‍යත්ව පිරිනැමීම.

## 2.19. මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ අංශය



**විශේෂ ජයග්‍රහණ**

1. පෝෂණ මලු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ගැබිණි මව්වරුන් අතරින් 10,400ක් සඳහා පෝෂණ මලු 85,889ක් ලබා දීම.
2. පෙර පාසල් 77ක දරුවන් 2,376ක් සඳහා උදැසන ආහාර වේලක් ලබා දීම.
3. පෙර පාසල් ගුරුවරියන් 1,802ක් සඳහා මාසිකව එක් අයෙකුට රු.2500.00 ක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
4. රු.49,876,753.00ක ලෝක බැංකු ආධාරවලින් පෙර පාසල් 121ක යටිතල පහසුකම් හා සෙල්ලම් මිදුල් සංවර්ධනය කිරීම

5. ‘‘අහරින් සපිරි කොළොම් තොටක්’’ වැඩසටහන යටතේ සාර්ථක ගෙවතු 600ක් නිර්මාණය කිරීම.

**අභියෝග**

1. ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ල ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ආර්ථිකමය වශයෙන් හැකියාවක් ඇති පුද්ගලයින්ට මෙම ප්‍රතිලාභය හිමි වන අවස්ථාවල දී ඔවුන් එය නිසි අයුරින් භාවිතා නොකිරීම.
2. ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා පැවති කාල වකවානුවේ දී මුල් ළමාවිය වයසේ පසුවන බහුතරයක දරුවන් ද නිවසට කොටු වී සිටීම හේතුවෙන් දරුවන්ට විධිමත් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම අතපසු වීම.
3. මුල් ළමාවිය සංවර්ධන අවධිය තුළ දරුවන්ගේ ඇතිවන සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රබලතාව පිළිබඳව දෙමව්පියන් හා පෙර පාසල් ගුරුවරුන් වැනි අදාල පාර්ශ්ව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නොහැකිවීම.
4. දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දරුවන්ගේ පියවරුන්ගේ සහභාගිත්වය අවම වීම.
5. ළමා මිතුරු සෙල්ලම් පාදක අධ්‍යාපනය පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් පුහුණුවීම් ලබා තිබුණ ද බහුතරයක් ගුරුවරුන් එය ප්‍රායෝගිකව භාවිතා නොකරන අතර ඒ සම්බන්ධයෙන් අදාළ නීතිමය පියවර ගැනීමට මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ නිලධාරීට බලතල නොමැතිවීම.

**ඉදිරි ඉලක්ක**

1. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සෑම පෙර පාසලකම ක්‍රියාත්මක කිරීම.
2. අධි අවධානම් තත්වයේ පසුවන හා උග්‍ර ආර්ථික අපහසුතා පවතින ගැබිණි මව්වරුන්ට පමණක් පෝෂණ මල්ල ප්‍රතිලාභ ලබාදීම.
3. දරුවන්ගේ මන්ද පෝෂණ තත්වය අවම කිරීම සඳහා එම අවශ්‍යතාවය සහිත සෑම පෙර පාසල් දරුවෙකුටම උදෑසන ආහාර වේල ලබාදීම.
4. මුල් ළමාවියේ පසු වන සෑම දරුවෙකුටම සෙල්ලම් පාදක ක්‍රමයක් තුළින් තම හැකියාවන් ඉස්මතු කර ගත හැකි ආකාරයකට පෙර පාසල තුළ අත්දැකීම් ලබාදීමට හැකි පරිසරයක් ගොඩනැංවීම.

## 2.20. ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. ආර්ථික අර්බුදය හේතුවෙන් අපහසුතාවයට පත් දරුවන් සිටින පවුල් 1000ක් සඳහා පෝෂණ මලු බෙදා දීමට හැකිවීම.
2. ආහාර සුරක්ෂිතතා කමිටුව හරහා දරුවන් 250ක් සිටින පාසලක් සඳහා දිවා ආහාරය බෙදාදීමට හැකිවීම.
3. වීදි ආශ්‍රිතව ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් 200ක් සඳහා වියළි ආහාර පාර්සල් 200ක් බෙදාදීමට හැකිවීම.
4. දරුවන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් ළමා ආරක්ෂක සැලසුම් 13ක් ක්‍රියාත්මක කිරීම.
5. "අහරින් සපිරි කොළොම්තොටක්" වැඩසටහන යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 31ක සහ ළමා සමාජ 30ක දරුවන් 250 දෙනකුගේ ගෙවතු වගා නිර්මාණය කිරීම තුළින් ඔවුන්ගේ පෝෂණීය ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය සහ බෝග වගාව පිළිබඳව දරුවන් තුළ උනන්දුව ප්‍රවර්ධනය.
6. යුනිසෙෆ් ආයතනය හරහා ආර්ථික දුෂ්කරතා සහිත පවුල් 60ක් සඳහා රු.300,000.00ක මූල්‍යමය ආධාර ලබාදීමට හැකිවීම.
7. රාජ්‍ය නොවන ආයතන මැදිහත් කරගනිමින් ආර්ථික දුෂ්කරතා සහිත දරුවන් 600ක් සඳහා අධ්‍යාපන උපකරණ කට්ටල ලබාදීමට හැකිවීම.

**අභියෝග**

පැවති ඉන්ධන, විදුලිය සහ ආහාර හිඟකම ඇතුළු ආර්ථික අර්බුදය හමුවේ,

1. රාජ්‍ය අනුග්‍රහයෙන් ලබා දුන් මූල්‍යමය ප්‍රතිපාදන සීමාවීම.
2. ක්ෂේත්‍ර රාජකාරි නිසි පරිදි ඉටු කර ගැනීමට නොහැකිවීම.
3. දරුවන් විවිධ රැස්වීම් සහ වැඩසටහන් සඳහා සහභාගී කරගැනීමට නොහැකිවීම සහ එම සියළු වැඩසටහන් තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ පැවැත්වීමට සිදුවීම.
4. ළමාරක්ෂාව සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීම් සීමා කිරිමට සිදුවීම.
5. පාසැල් අධ්‍යාපනය මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පැවැත්වීමේ දී ඇතැම් දරුවන්ට ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ නොමැතිවීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා සහභාගීවීමේ අවස්ථාවන් සීමාවීම හා අහිමිවීම. එම දරුවන් සියළු දෙනාට අවශ්‍ය උපකරණ ලබාදීමට නොහැකිවීම.
6. නැවත පාසැල් ආරම්භයත් සමඟම දරුවන් විශාල සංඛ්‍යාවක් පාසැල් වෙත නොපැමිණීම සහ සියළු දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීමට නොහැකිවීම.
7. ඉන්ධන අර්බුදය හේතුවෙන් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 12ක් පැවැත්වීමට නොහැකිවීම.

**ඉදිරි ඉලක්ක**

1. පවතින ආර්ථික අර්බුදය හමුවේ විවිධ ආර්ථික අපහසුතාවයන්ට ලක් වී ඇති ළමුන් සහ පවුල් 2500කට සහන සැලසීම.
2. දෙමාපිය භාරකරුවන්, ළමා නිවාසගත ළමුන් සහ පාසැල් ළමුන් සඳහා විවිධ දැනුවත්කිරීමේ වැඩසටහන් 250ක් පැවැත්වීම.
3. හඳුනා ගන්නා පාසැල් නොයන සහ කඩින් කඩ පාසැල් යන ළමුන් 95%ක් පාසැල්ගත කිරීම.
4. අවදානම් ළමුන් වෙනුවෙන් ආරක්ෂණ සැලසුම් 130 ක් ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.
5. අවාසි සහගත ළමුන් සහ ප්‍රජාව වෙනුවෙන් ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ විවිධ වැඩසටහන් 10ක් ක්‍රියාත්මක කිරීම.
6. ළමා සංවර්ධන මධ්‍යස්ථාන 30ක ළමාරක්ෂාව, යොවුන් විය, පෞරුෂ සංවර්ධනය ආදී වැඩසටහන් 40ක් පැවැත්වීම.
7. පිහිටුවා ඇති ළමා සමාජ සංඛ්‍යාව 500 දක්වා ඉහළ නැංවීම.

## 2.21. ළමා ආරක්ෂක අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. අපයෝජනයට පත්ව රෝහල්ගත වූ ළමයින් 42කට සිද්ධි සම්මන්ත්‍රණ පවත්වා ප්‍රතිකාර සැලසුම් සකස් කොට නැවත සමාජගත කිරීම.
2. ළමා උපකාරක සේවාව (1929) වෙතින් යොමු කරන ලද අපයෝජනයට පත් වූ ළමුන් 85 දෙනෙකු පිළිබඳ විමර්ශන පවත්වා නැවත සමාජගත කිරීම.

**අභියෝග**

1. ප්‍රවාහනය සඳහා අවශ්‍ය ඉන්ධන නොමැති වීම නිසා පැමිණිලි විමර්ශනය සඳහා යාමට දුෂ්කර වීම හා සේවාලාභීන්ට සේවාවන් වෙත යොමු වීමේ දුෂ්කරතා මතුවීම.
2. වැඩි වූ භාණ්ඩ මිල නිසා රජයෙන් ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
3. කඩදාසි හිඟකම නිසා පුස්තකාල සේවා සැපයීමේ දී අධික වියදම් දැරීමට සිදුවීමෙන් පුස්තකාල සේවා සැපයීම අඩු වීම.

**ඉදිරි ඉලක්ක**

1. පාසල් ළමා ආරක්ෂක කමිටු 40ක් අධීක්ෂණය කිරීම.
2. ළමා උපකාරක සේවාව (1929) වෙතින් යොමු වන ළමුන් 130ක් සඳහා මැදිහත්වීම් සිදු කොට සමාජගත කිරීම.
3. ළමා නිවාස 42ක් අධීක්ෂණය කිරීම.
4. ළමා ආරක්ෂාව සඳහා සිවිල් සමාජ සංවිධාන 30ක් සවිබල ගැන්වීම.

5. අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම.
6. දරුවන් සමඟ වීදියේ ව්‍යාපාර කරන පවුල් 10ක් සඳහා මැදිහත් වීම.

## 2.22. වනිතා සංවර්ධන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. ගෘහ මූලික කාන්තාවන් 30 දෙනකු ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට හැකි වීම.
2. ගෘහස්ථ හිංසනයට පත් කාන්තාවන් 20 දෙනෙකු හා ළමුන් 31 දෙනෙකු සඳහා තාවකාලික නවාතැන් ලබා දීමට හැකි වීම.
3. රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ඉදි කිරීම තුළින් ව්‍යවසායිකාවන් 32 දෙනෙකු සඳහා අලෙවි පහසුකම් සැපයීම හා ඔවුන්ගේ මාසික ආදායම වැඩි වීම.



4. "අහරින් සපිරි කොළොම්තොටක්" වගා සංග්‍රාමය යටතේ කාන්තා සංවිධාන සාමාජිකාවන් 5680 දෙනකුගේ ගෙවතු නිර්මාණය කිරීම හා එමඟින් වස විසෙන් තොර පෝෂණීය ආහාර පරිභෝජනය වැඩි වීම.

**අභියෝග**

1. 2022 වසරේ පැවති ඉන්ධන, විදුලිය, ආහාර ඇතුළු ආර්ථික අර්බුදය හේතුවෙන්,
    - ක්ෂේත්‍ර රාජකාරි සීමිත වීම.
    - කාන්තා කාර්ය සංවිධාන රැස්වීය නොහැකිවීම/සාමාජික පැමිණීම සීමිත වීම.
    - ප්‍රතිපාදන සීමිත වීම.
    - සැලසුම් කරන ලද විවිධ වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට නොහැකි වීම.
2. කාන්තාවන්ට හිංසන/ප්‍රචණ්ඩත්වය සිදුවන අවස්ථාවල දී වනිතා සංවර්ධන නිලධාරිනියන් වශයෙන් මැදිහත්වීමේ දී විධිමත් බලතල නොතිබීම හේතුවෙන් අපහසුතාවයට පත්වීම සහ ඔවුන්ගේ ආරක්ෂාවට තර්ජන ඇතිවීම.
3. ගෘහස්ථ හිංසනයට පත් කාන්තාවන් පිළිබඳ සියලුම සත්‍ය සිදුවීම් නිලධාරීන් වෙත වාර්තා නොවීම.
4. හඳුනා ගන්නා ලද ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්විය යුතු කාන්තාවන් සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර ඉදිරිපත් කළ ද ඉන් කිහිපයකට පමණක් ප්‍රතිපාදන වෙන්වීම(ප්‍රතිපාදන නොමැතිවීම).
5. මෙවැනි කාන්තාවන් ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි කිරීමේ දී වෙළඳපල අවස්ථා අවම වීම.

6. ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සුළු පරිමාණ ණය (රු.5,000 සිට 30,000), කාන්තා බලමණ්ඩල හරහා ලබා දුන්න ද ඉන් ඔබ්බට මූල්‍ය ආයතන මඟින් ණය ලබා ගැනීමේ දී පනවා ඇති දැඩි ණය කොන්දේසි (උදා: රජයේ සේවක ඇප කොන්දේසි) හේතුවෙන් කාන්තාවන් අපහසුතාවයට පත්වීම.
7. පැවති රජයන් විසින් වරින් වර විවිධ ස්වයං රැකියා ණය ක්‍රම හඳුන්වා දුන්න ද ඉතා කුඩා මට්ටමින් ස්වයං රැකියා ආරම්භ කර පවත්වා ගෙන යන කාන්තාවන් සඳහා එම ණය යෝජනා ක්‍රමවලින් ණය ලබා ගැනීමට නොහැකිවීම.
8. හිංසනයට පත් කාන්තාවන් සඳහා තාවකාලික රඳවා තබා ගැනීමට රැකවරණ මධ්‍යස්ථානයක් නොමැතිකම.
9. විවිධ පෞද්ගලික ආයතන විසින් ක්ෂුද්‍ර ණය දෙන ආයතන ගම් මට්ටමින් පිහිටුවීම හේතුවෙන් බහුතරයක් කාන්තාවන් එම සමිතිවල සාමාජිකත්වය ලබා ගැනීම හා ක්ෂණික ණය ලබා ගැනීමට පෙළඹීම.
10. කාන්තා කාර්ය සංවිධාන ව්‍යවස්ථාවල පවතින ඇතැම් කරුණු සංශෝධනය නොවීම.

**ඉදිරි ඉලක්ක**

1. කාන්තාවන් 100 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
2. කාන්තාවන් 30 දෙනකු ස්වයං රැකියාගත කිරීම .
3. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් කාන්තා සංවර්ධන කමිටු 14ක් පිහිටුවීම.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් කාන්තාවන් 2000 දෙනෙකුගේ ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි පොල 100ක් පැවැත්වීම.

## 2.23. සමාජ සේවා අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. 2022 වර්ෂයේ දී පැවැත් වූ ආබාධිත මලල ක්‍රීඩා උළෙලට ආබාධිත තරුණ තරුණියන් 180ක් සහභාගී කරවීම. එහි තරඟ ඉසව්වලින් ප්‍රථම ස්ථාන හිමි කරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 32 දෙනකු 2023 වර්ෂයේ ජාතික තරඟ සඳහා ඉදිරිපත් කිරීම.
2. ආබාධිත පුද්ගලයන්ගේ ස්ව ශක්ති අභිමානී වැඩසටහනේ ප්‍රථම ස්ථාන හිමිකර ගත් 10දෙනකු 2023 වර්ෂයේ ජාතික තරඟ සඳහා යොමු කිරීම.
3. වැඩිහිටි නිවාස හා ආබාධිත නිවාසවල "දෙටු පුරවැසි සාර කෙත" වැඩසටහන යටතේ ගෙවතු වගා වැඩසටහන් 80ක් ආරම්භ කිරීම හා සාර්ථක වූ ගෙවතු 20ක් සඳහා පොහොර කිලෝ ග්‍රෑම් 70 බැගින් ලබාදීම.

4. විශ්ව පාරමී පදනමේ අනුග්‍රහයෙන් වැඩිහිටි හා අබාධිත නේවාසිකයින්ගේ මානසික සංතෘප්තිය වර්ධනය කිරීමට සංගීත රසවින්දන වැඩසටහන් 11ක් පැවැත්වීම.
5. පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙන් අඩු ආදායම්ලාභී තනි මාපිය පවුල් (වැන්දඹු) 05කට වියළි ආහාර සලාක, පාසැල් උපකරණ ලබාදීම.
6. පාසැල් අධ්‍යාපනයට දරුවන් දිරිගැන්වීම, දරුවන් අධ්‍යාපනයට යොමු කිරීම සඳහා 2022 වර්ෂයේ ආරම්භ කළ නැණමිණ ශිෂ්‍යත්ව වැඩසටහනේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 1288ක් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම.

**අභියෝග**

1. මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
2. 2020 වර්ෂයේ සිට පවත්නා කොරෝනා උවදුර හා රටේ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් සංවර්ධන වැඩසටහන් සීමා කිරීමට සිදු වීම.
3. ආබාධ සහිත පුද්ගලයන්ගේ ආබාධිත බව අවම කර ගැනීමට ලබාදෙන ආධාර හා උපකරණ සංචිතවල හිඟකම.

**ඉදිරි ඉලක්ක**

1. ආබාධ සහිත දරුවන් 15 දෙනකුගෙන් යුත් දිස්ත්‍රික් නැටුම් කණ්ඩායමක් ස්ථාපිත කිරීම.
2. වැඩිහිටි හා ආබාධිත නිවාස 20ක (2022) ආරම්භ කර ඇති දෙටු පුරවැසි සාරකෙත වැඩසටහන යටතේ නව නිවාස 30ක ගෙවතු වගා කටයුතු ආරම්භ කිරීම.
3. විශ්ව පාරමී පදනමේ අනුග්‍රහයෙන් වැඩිහිටි හා අබාධිත නේවාසිකයින්ගේ මානසික වර්ධනය කිරීමට සංගීත රසවින්දන වැඩසටහන් 36ක් පැවැත්වීම.
4. සමාජ සේවා අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන ආධාර ලබන පියා අහිමි දරුවන් 1200කට විදේශ පරිත්‍යාග යටතේ යට ඇඳුම් ලබා දීම.

## 2.24. විදාතා නිලධාරී

**විශේෂ ජයග්‍රහණ**

1. පාරිභෝගිකයන්ට ගුණාත්මක නිෂ්පාදන ලබාදීමේ අරමුණින් නිෂ්පාදන සඳහා ප්‍රමිති හා තත්ව සහතික 05ක් ලබා දීම.
2. කාර්මික තාක්ෂණ ආයතනයේ සම්පත්දායකත්වයෙන් කර්මාන්ත 16ක් සඳහා තාක්ෂණික පුහුණුව ලබා දීම.
3. හරිත කඩමණ්ඩි 06ක් පැවැත්වීම, රජ වාසල අලෙවි ප්‍රදර්ශනය සඳහා ව්‍යවසායකයින් 10 බැගින් යොමු කිරීම, දියත උයන වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම, ව්‍යවසායකයින් 400ක් සඳහා අලෙවි පහසුකම් ලබාදීම.

4. ව්‍යවසායකයින් නව තාක්ෂණය සඳහා යොමු කිරීමට අන්තර්ජාල අලෙවි ප්‍රවේශය ආරම්භ කිරීම.
5. අපනයන අගයදාම වැඩසටහන හරහා අපනයනකරුවන් 07 දෙනකු හා නිෂ්පාදකයින් 110 දෙනකු සම්බන්ධීකරණය කිරීම.
6. ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම.
7. නිෂ්පාදකයින් 400 දෙනකු සඳහා පරිගණක පුහුණුව හා අන්තර්ජාල වෙළඳාම පුහුණු කිරීම මඟින් ඔවුන් නව තාක්ෂණය සඳහා යොමු කිරීම.

**අභියෝග**

1. කොවිඩ් 19 වසංගත තත්වය, ඉන්ධන අර්බුදය, ප්‍රවාහන අපහසුතා සහ ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් නිලධාරීන් හට ක්ෂේත්‍ර තොරතුරු එක්රැස් කිරීමට අපහසුතා පැවතීම.
2. ආර්ථික අර්බුදය හේතුවෙන් කර්මාන්ත වසා දැමීම.
3. පර්යේෂණ ආයතනවලින් දත්ත හා තාක්ෂණික වාර්තා ලබා ගැනීමේ දී ප්‍රමාදවීම් සිදු වීම.

**ඉදිරි ඉලක්ක**

1. කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන වියදම 10% අඩු කිරීම තුළින් ආදායම ඉහළ නැංවීම සඳහා විකල්ප බලශක්ති හඳුන්වාදීම.
2. ව්‍යවසායකයින් 24 දෙනකුගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා තත්ව හා ප්‍රමිති සහතික ලබාදීම.
3. විවිධ ක්ෂේත්‍රවල තෝරා ගත් ව්‍යවසායකයින් 26දෙනෙකුගේ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම.
4. පාරිභෝගිකයන්ට අඩු මිලට භාණ්ඩ ලබාදීම හා ව්‍යවසායකයින්ගේ ආදායම වැඩි දියුණු කිරීම සඳහා අලෙවි පොළ 07ක් සංවිධානය කිරීම.
5. කර්මාන්තකරුවන්ගේ ආදායම වැඩි කිරීම සඳහා නිෂ්පාදන 100ක් ඩිජිටල්කරණය හා ජාලගත කිරීම.
6. විදාතා වැඩසටහන ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා විදාතා මධ්‍යස්ථාන 13ක් අධීක්ෂණය කර වාර්තා ලබාදීම.

## 2.25. මානව සම්පත් සංවර්ධන අංශය / රැකියා කේන්ද්‍රය

**විශේෂ ජයග්‍රහණ**

1. කොළඹ දිස්ත්‍රික්කයේ සාමාන්‍ය පෙළ අසමත් සිසුන් 8578 දෙනකුගේ තොරතුරු රැස් කර වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 18ක් පැවැත්වීම.



2. අභියෝගකාරී අවස්ථාවේ දී මාර්ගගත ක්‍රමයට රැකියා පොළ වැඩසටහන් 02ක් පවත්වමින් නව රැකියා අවස්ථා 298ක් රැකියා අපේක්ෂිතයින්ට සොයාදීමට කටයුතු කිරීම.
3. ව්‍යවසායකත්ව වැඩසටහන් 02ක් පවත්වා සුළු පරිමාණ ව්‍යාපාරිකයින් 39 දෙනෙකු සඳහා සාර්ථකව ව්‍යාපාරය ආරම්භ කර පවත්වාගෙන යාමට අවශ්‍යය දැනුම ලබාදීම.

**අභියෝග**

1. රැකියා අපේක්ෂිතයන් වැඩි පිරිසක් රජයේ රැකියා බලාපොරොත්තුවීම නිසා විශේෂ ක්ෂේත්‍රගත රැකියා සඳහා යොමු නොවන අතර කුසලතා සහිත රැකියා අපේක්ෂිතයන් අඩුවීම. උදා: විදුලි කාර්මික, ජලනළ කාර්මික.
2. රැකියා අපේක්ෂිතයන් බලාපොරොත්තු වන රැකියා සොයාදීම.
3. පවතින රැකියා ඇබෑර්තු සඳහා යොමු කිරීමට රැකියා අපේක්ෂිතයින් සෙවීම.
4. රැකියා අපේක්ෂිතයින් බලාපොරොත්තු වන ආදායමට සරිලන රැකියාවක් සොයාදීම.
5. වයස අවුරුදු 55 ඉක්ම වූ පුද්ගලයින් පෞද්ගලික අංශයේ විධායක රැකියා සෙවීම.
6. අර්ධ කාලීන රැකියා (Part Time Jobs) සොයන්නන් සඳහා රැකියා අවස්ථා ප්‍රමාණවත් නොමැතිවීම.

**ඉදිරි ඉලක්ක**

1. දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනක් සහ ප්‍රාදේශීය රැකියා පොළවල් 10ක් පවත්වා රැකියාගත කිරීම් 300 සිදුකිරීම සහ තවත් සෘජු රැකියා අවස්ථා 150ක් ලබාදීමට කටයුතු කිරීම.
2. පිළිගත් වෘත්තීය ආයතන 10ක් පමණ සම්බන්ධ කර ගනිමින් වෘත්තීය පොළ වැඩසටහනක් පවත්වා වෘත්තීය පුහුණුව සඳහා 100 දෙනෙකු යොමු කිරීම.
3. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 02ක් පැවැත්වීම සහ ව්‍යවසායකයින්/ස්වයං රැකියාලාභීන් 50 දෙනකු බිහිකිරීම.
4. රැකියා කේන්ද්‍රයේ ලියාපදිංචි වන රැකියා අපේක්ෂිතයින්ගෙන් 200ට වැඩි පිරිසකට වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම.

## 2.26. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව සා.පෙළ හා උ.පෙළ සිසුන්, පාසැල් හැරගිය තරුණ තරුණියන්, දෙමව්පියන් හා ගුරුවරුන් ආදී ප්‍රතිලාභීන් 9274ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 248ක් පැවැත්වීම.



2. වෘත්තීය පුහුණු පාඨමාලා සහ ආධුනිකත්ව පුහුණුව සඳහා නවක පුහුණුලාභීන් 1182ක් යොමු කිරීම.
3. පෙර දැනුම ඇගයීම (RPL) මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබා ගැනීමට ශිල්පීන් 190ක් යොමු කිරීම.
4. විදේශ රැකියා සඳහා යොමු වීමට තරුණයන් තුළ ඇති වූ විශේෂ නැඹුරුව මත ජපන් රැකියා සඳහා යොමු වීමට අපේක්ෂිත තරුණ තරුණියන් 172ක්, ජපන් භාෂා පුහුණු පාඨමාලා සඳහා NAITA සහ VTA ආයතන වෙත යොමු කිරීම.

**අභියෝග**

1. 2022 වසරේ දෙවන හා තෙවන කාර්තුවල දී රටේ පැවති විදුලි කප්පාදුව හා ඉන්ධන ගැටළුව ඇතුලු අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් භෞතික හා මාර්ගගත වැඩසටහන් සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වීම.
2. නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර් ජාල පහසුකම් වැනි රාජකාරී කටයුතු සඳහා අත්‍යවශ්‍ය මූලික පහසුකම් නොලැබීම නිසා වැඩසටහන් සිදු කිරීමේ දී අපහසුතා ඇතිවීම.
3. වර්තමානයේ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ඇතිවී කිබෙන අධික ඉල්ලුමට සරිලන පරිදි ආයතනවල ධාරිතාවය ප්‍රසාරණය නොවීම හා ඇතැම් පාඨමාලා යාවත්කාලීන නොවීම.
4. දෙමළ මාධ්‍යයෙන් පවත්වන පාඨමාලා සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.
5. තෘතීයික හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව යටතේ පිහිටුවන ලද අනු කමිටු ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම.

**ඉදිරි ඉලක්ක**

1. නාගරික වතු නිවාස ආශ්‍රිත පාසල් හැර ගිය තරුණ තරුණියන් 250ක් සඳහා විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 05ක් පැවැත්වීම සහ අවම වශයෙන් 200 දෙනකු පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.
2. පාසල්වියේ දී ම සිසුන්ට අනාගත වෘත්තීය ඉලක්ක කරා මහ පෙන්වීමට සහ වැඩ ලෝකය පිළිබඳව අවබෝධයක් ලබාදීමට පාසල් 25ක වෘත්තීය මාර්ගෝපදේශන ඒකක 25ක් ස්ථාපිත කිරීම.
3. කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින විවිධ වෘත්තීය ක්ෂේත්‍රවල NVQ3 සිට NVQ 7 දක්වා මට්ටම්වල සහතිකලාභී නිපුණ ශිල්පීන්ගේ තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් සකස් කිරීම.
4. NVQ සහතිකලාභී ශිල්පීන් 200ක් නිපුණතා බලපත්‍රය (Skill Passport) ලබා ගැනීම සඳහා යොමු කිරීම.

5. වෘත්තීය පුහුණු හා ආධුනිකත්ව පුහුණු පාඨමාලා සඳහා තරුණ තරුණියන්1000ක් යොමු කිරීම, ප්‍රතිලාභීන් 8000ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 250ක් පැවැත්වීම

## 2.27. රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. කොවිඩ්-19 වසංගත සමයේ දී හා රට තුළ උද්ගත වූ ආර්ථික අර්බුද කාලසීමාව තුළ දී සහනධාර අවශ්‍යතාව ඇති පවුල් 234,000 කට පමණ සහනාධාර ලබාදීමට හැකිවීම.

**අභියෝග**

1. දිස්ත්‍රික්කයේ ඇති ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන 400ට අධික ප්‍රමාණයක සම්බන්ධීකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා එක් නිලධාරියකු ප්‍රමාණවත් නොවීම.
2. ආයතන සම්බන්ධීකරණයේ දී රාජ්‍ය නොවන සංවිධාන සහභාගිත්වයෙන් අමාත්‍යාංශ හා විවිධ ආයතනවල සිදු කරන ලද වැඩසටහන් සඳහා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක සහභාගී කරවා නොගැනීම හා දැනුවත් නොකිරීම.
3. රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණයේ දී දුරකථන පහසුකම් වැනි තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් නොවීම.

**ඉදිරි ඉලක්ක**

1. රාජ්‍ය නොවන සංවිධාන මඟින් නිම කරනු ලබන ව්‍යාපෘතිවල තොරතුරු රැස් කර නැවත පරිශීලනයට ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
2. නිර්දේශ කිරීම සඳහා ඉල්ලීම් කරනු ලබන ආයතන අතුරින් සුදුසු සෑම ආයතනයක්ම ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කිරීම.
3. ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් කරනු ලබන ආයතන අතුරින් නිර්දේශ කරන ලද සෑම ආයතනයක්ම ලියාපදිංචි කිරීම.
4. ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති හා දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක සියලුම ආයතන අධීක්ෂණය කිරීම.
5. වැඩ බලපත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලීම් කරනු ලැබූ විදේශිකයන් අතුරින් බලපත්‍ර ලබාදීමට සුදුසුකම් ඇති සෑම විදේශිකයෙක්ට ම බලපත්‍ර ලබාදීම.
6. ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන විසින් ඉදිරිපත් කරන සෑම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක්ම අනුමත කිරීම, ප්‍රගති සමාලෝචනය හා අධීක්ෂණය.

## 2.28. විදේශ රැකියා ප්‍රවර්ධන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. විදේශ ගතවීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විගමනික පවුල් සඳහා සංවර්ධන සැලසුම් 10ක සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් නැවත මෙරටට පැමිණි විගමනිකයන් 10ක් දේශීය ආදායම් මාර්ග ඇති කිරීම මඟින් ආර්ථිකව සවිබල ගන්වා පුනර්විගමනය වළක්වා නැවත සමාජගත කිරීම.
2. විදෙස්ගත ශ්‍රමිකයන් නැවත සමාජගත කිරීමට හා නැවත, නැවත වන විගමනය වැළැක්වීම සඳහා රු50,000 බැගින් 13 දෙනෙකුට ස්වයංරැකියා ප්‍රදානයන් ලබාදීම මඟින් ඔවුන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම හා නව සුළු පරිමාණ ව්‍යාපාර 13ක් ඇති කිරීම.
3. විදේශ රැකියා අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම, ප්‍රවර්ධනය සඳහා රැකියා පොළ පැවැත්වීම සහ එහ දී 137 දෙනකු නියෝජිත ආයතන මඟින් තෝරා ගැනීම, අයදුම්කරුවන් 18 දෙනකු සඳහා විදේශ රැකියා අවස්ථා උදාවීම.

**අභියෝග**

1. කොවිඩ් ආපදා තත්වය යටතේ නිලධාරින්ට ප්‍රතිලාභීන් එක්රැස් කළ නොහැකි වීම හා ක්ෂේත්‍රයට ගොස් තොරතුරු එක්රැස් කළ නොහැකි වීම.
2. ප්‍රවාහන අපහසුතා නිසා අදාල ක්ෂේත්‍ර පරීක්ෂණයන් සහ රාජකාරවලට වාර්තා කළ නොහැකි වීම.
3. සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන නොමැති වීම.
4. අන්තර්ජාල, පරිගණක පහසුකම් හා දුරකථන පහසුකම් නොමැති වීම.
5. නිලධාරින් අතර පවතින ඍණ ආකල්ප.
6. සමාජීය වශයෙන් ජනතාවගේ පවතින යැපුම් මානසිකත්වය.
7. සංවර්ධන සැලසුම් ක්‍රමවේදය සංකල්පීය වශයෙන් අධිනාගරික ප්‍රදේශවල ක්‍රියාත්මත කළ නොහැකි වීම

**ඉදිරි ඉලක්ක**

1. පුහුණු ශ්‍රමිකයන් 40 දෙනෙකු විදේශ රැකියා සඳහා යොමු කිරීම මඟින් ඔවුන් ආර්ථිකව සවිබල ගැන්වීම.
2. පවුල් සඳහා සංවර්ධන සැලසුම් 50ක් සාර්ථක කර ගැනීම මඟින් නැවත පැමිණි විගමනිකයන් 50ක් සඳහා දේශීය ආදායම් මාර්ග ඇති කිරීම මගින් ආර්ථිකව සවිබල ගැන්වීම.
3. 2023 වසරේ විගමනය වන විගමනික ශ්‍රමිකයන් පිළිබඳ දත්ත පද්ධතියක් සැකසීම.

4. රු.50,000.00 ස්වයංරැකියා ප්‍රදාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් ඔවුන් ආර්ථිකව සවිබල ගැන්වීම හා නව සුළු පරිමාණ ව්‍යාපාර 50ක් ඇති කිරීම.
5. විගමනික පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ප්‍රතිලාභීන් 130කට රු.5,000.00 බැගින් අධ්‍යාපන ආධාර ලබාදීම.

## 2.29. පරිසර අංශය

**විශේෂ ජයග්‍රහණ**



1. ප්‍රතිපාදන නොමැති වුව ද දිස්ත්‍රික්කය පුරා පැළ 700ක් සිටුවීම මඟින් පරිසර ගැටලු අවම වීම.
2. රත්මලාන කොට්ඨාශයේ කටුකුරුඳුවත්ත බඩෝවිට ඇළ මාර්ගය පිරිසිදු කිරීම සඳහා බාධකයක් MAS ආයතනයේ අනුග්‍රහයෙන් ඉදි කිරීම සහ බාධකයක් යෙදීමේ අවශ්‍යතාවය පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම.

**අභියෝග**

1. ඉන්ධන අර්බුදය හේතුවෙන් පැවති ප්‍රවාහන ගැටලු නිසා නිලධාරීන්ට ක්ෂේත්‍රයට ගොස් තොරතුරු කාර්යක්ෂමව එක්රැස් කළ නොහැකි වීම.
2. සුරකිමු ගංඟා හා හරිත ශ්‍රී ලංකා ජාතික වැඩසටහන් හා සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රතිපාදන නොමැතිවීම.
3. කාර්යාලීය පහසුකම් (අන්තර්ජාල, පරිගණක, දුරකථන වැනි) හා ලිපිද්‍රව්‍ය නොමැති වීම.
4. පරිසර පැමිණිලි සොයා බැලීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීමේ දුෂ්කරතාවය.
5. රට තුළ පැවැති අර්බුදකාරී තත්ත්වය යටතේ පරිසර කමිටු පැවැත්වීම.

**ඉදිරි ඉලක්ක**

1. දිස්ත්‍රික්කයේ පාරිසරික ගැටලු හා පරිසර දූෂණ තත්වයන් පාලන කිරීම සඳහා දිස්ත්‍රික් පරිසර කමිටු 06ක් පැවැත්වීමට කටයුතු කිරීම.
2. දිස්ත්‍රික්කයේ ජල පද්ධති ආශ්‍රිත ගැටලු හා ජල දූෂණ තත්වයන් පාලනය කිරීම සඳහා දිස්ත්‍රික් සුරකිමු ගංඟා කමිටු 06ක් පැවැත්වීමට කටයුතු කිරීම.
3. දිස්ත්‍රික්කයේ පරිසර නීතිය හා කසළ බැහැර කිරීමේ වැඩසටහන් 09ක් ක්‍රියාත්මක කිරීම.
4. කොළඹ දිස්ත්‍රික්කය පුරා වන ගහනය වැඩි කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් සහ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කිරීම.

5. පාරිසරික වගකීම්වලට බැඳුණු දරු පරපුරක් බිහි කිරීම උදෙසා පරිසර නියමු වැඩසටහන් 12ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

## 2.30. ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ භාෂා අංශය මඟින් පවත්වන ලද, පාසල් ව්‍යාපෘති තරගාවලියේ දී කොළඹ දිස්ත්‍රික් ව්‍යාපෘතිය ජයග්‍රහණය කිරීම. එම ජයග්‍රහණ මත තෝරාගත් පාසල් 3කට රු.50,000 බැගින් පුස්තකාල සඳහා රු.150,000.00ක ත්‍රෛ භාෂා පොත් ප්‍රදානය කිරීම.
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගත් ද්වීභාෂා ව්‍යාපෘති තරගාවලියේ දී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ජයග්‍රහණය කිරීම හා හිමි වූ රු.150,000ක ත්‍යාග මුදලින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම.

**අභියෝග**

1. පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරි සීමිත වීම.
2. භාෂා පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් ප්‍රමාණවත් රජයේ ප්‍රතිපාදන නොමැතිවීම.

**ඉදිරි ඉලක්ක**

1. ආගමික නායකයින්, තරුණ ප්‍රජාව හා සිවිල් ප්‍රජාව තුළ ආකල්ප වර්ධනය, සහජීවනය හා ජාතික සමඟිය සම්බන්ධයෙන් කතිකාවත් වැඩසටහන් 05ක් සංවිධානය කිරීම.
2. ආන්තීකරණයට ලක් වූ ජනතාව නහා සිටුවීමේ වැඩසටහන් 05ක් පැවැත්වීම.
3. සමාජ සංස්කෘතික ජනවාර්ගික ගැටුම් ඇතිවීම වැලැක්වීමට අවශ්‍ය සමාජ හිතකර පරිසරයක් ඇති කිරීම වෙනුවෙන් සංස්කෘතික වැඩසටහන් 05ක් පැවැත්වීම.
4. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ භාෂා අංශය මඟින් පවත්වනු ලබන භාෂා සතියට සමගාමීව ව්‍යාපෘති 5ක් සංවිධානය කිරීම.
5. පාසල් හැරගිය දරුවන් 300ක් හා රාජ්‍ය නිලධාරීන් 300 දෙනකුගේ සහභාගිත්වයෙන් භාෂා පාඨමාලා 20ක් සංවිධානය කිරීම.

## 2.31. සංස්කෘතික අංශය

**විශේෂ ජයග්‍රහණ**



1. රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී තත්වය හමුවේ, දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරන ලද

සාහිත්‍ය තරග සහ සාහිත්‍ය උත්සව සැලසුම් කළ පරිදි පැවැත්වීම.

2. 23 වන ලන්ඩන් රේන්බෝ සිනමා උළෙලේ දී හොඳම අධ්‍යක්ෂණය වෙනුවෙන් හිමි සම්මානය හා බැංගලෝර් ජාත්‍යන්තර සිනමා උළෙලේ දී දකුණු ආසියාවේ හොඳම සිනමා පටයට හිමි සම්මානය හිමි කරගනිමින් දෙස් විදෙස් ප්‍රේක්ෂකයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ The Newspaper සිංහල සිනමාපටයට දායකත්වය සැපයූ ශිල්පීන් ඇගයීම.

**අභියෝග**

1. දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන සීමිත ප්‍රතිපාදන උපයෝගී කරගෙන උසස් ප්‍රමිතියකින් යුතු වැඩසටහන් පැවැත්වීම.
2. පවතින තරඟකාරී අධ්‍යාපන ක්‍රමය හමුවේ පාසල් දරුවන්ගෙන් බහුතරය සාහිත්‍ය හා කලා කටයුතුවලින් බැහැරවීම නැවැත්වීම හා සාහිත්‍ය හා කලා කටයුතුවලට සම්බන්ධ කර ගැනීම.

**ඉදිරි ඉලක්ක**

1. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සංස්කෘතික සිතියම හා සම්පත් පැතිකඩ සකස් කිරීම.
2. “අගහිඟ කලාකරු ආධාර ” වැඩසටහන යටතේ කලාකරුවන් 100 දෙනකුට දීමනා ලබාදීම.
3. වෛද්‍යාධාර ඉල්ලුම් කරන කලාකරුවන් අතරින් 75%කට මූල්‍යාධාර ලබාදීම.
4. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සංස්කෘතික බල මණ්ඩලය සක්‍රීයව පවත්වාගෙන යාම.
5. අක්‍රිය මට්ටමේ පවතින කලායතන 60ක් අතුරින් කලායතන 20ක් සක්‍රීය කිරීමට කටයුතු කිරීම.
6. කලාභූෂණ සම්මාන උළෙල සඳහා දිස්ත්‍රික්කයෙන් කලාකරුවන් 10ක් නිර්දේශ කිරීමට කටයුතු කිරීම.
7. දිස්ත්‍රික්කය තුළ සර්ව ආගමික වැඩසටහන් 20ක් පැවැත්වීම.
8. දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති ළමා සමාජ 13හි ළමුන් 320ක් සඳහා හඳුනාගත් ජන ක්‍රීඩා 10ක පුහුණුව ලබා දීම.
9. දේශීය ආහාර හා දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධන වැඩසටහන් 20ක් පාසල් 20ක පැවැත්වීම.
10. සාම්ප්‍රදායික කලා නිර්මාණ සඳහා වෙළඳපලක් සකසා දීමට දිස්ත්‍රික්කය තුළ අලෙවි පොල 6ක් පැවැත්වීම (ගොක්කොළ කලාව, වෙස්මුහුණු කලාව, බතික් කලාව හා පන් කලාව වැනි).
11. දිස්ත්‍රික් සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව පවත්වනු ලබන සාහිත්‍ය තරඟ ජයග්‍රාහකයින් අතරින් ජාතික ජයග්‍රහණ 15ක් කොළඹ දිස්ත්‍රික්කයට ලබාගැනීම.
12. වාර්ෂිකව සංවිධානය කරනු ලබන විවිධ ජාතීන්ට හා ආගම්වලට අනුකූල වන උත්සව 50ක් සංවිධානය කිරීම.

## 2.32. ආපදා සහන සේවා අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. ආපදා සහන සේවා සැපයීමට අවශ්‍ය වන සම්බන්ධීකරණය සිදු කිරීම හා  ස්වාභාවික ආපදාවන් හේතුවෙන්  විපතට පත් පවුල් 2156කට අයත් පුද්ගලයින් 8382 දෙනකුට ආපදාව වාර්තා වූ පළමු දිනයේ  සිට දින 07ක් දක්වා පිසූ ආහාර ලබාදෙමින් ඔවුන්ට ආපදා සහන සැලසීම.
2. ආපදාවන්ට ලක්  වූ  නිවාස හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ස්ථාන 588ක් නිසි පරිදි  යථාවත් කර අවසන් කිරීම.

**අභියෝග**

1. රට තුළ පැවති ඉන්ධන හිඟය හා ඉන්ධන සීමා කිරීම සහ ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ ආපදාවන් හේතුවෙන්  විපතට පත් ජනතාව වෙත කඩිනම් ආපදා සහන සේවා සැලසීම.

**ඉදිරි ඉලක්ක**

1. 2023 වර්ෂයේ දිස්ත්‍රික්කයේ ඇතිවීමට නියමිත ආපදාවන් සඳහා, සහන සේවා කටයුතු  විධිමත්ව සිදු කිරීම.

## 2.33. ඵලදායිතා ප්‍රවර්ධන අංශය

**ඉදිරි ඉලක්ක**

1. ගෘහස්ථ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ පවුල් 10000ක් ඵලදායිතා සංකල්ප පිළිබඳව දැනුවත් කර ඒ අතුරින් පවුල් 500ක් ඵලදායී නිවෙස් බවට පත් කිරීම.
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගත් කුඩා පරිමාණ ව්‍යවසායකයින් 80ක් සවිබල ගැන්වීම සඳහා  වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. ආයතනවල ඉල්ලීම් අනුව ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් 180 ක් පැවැත්වීම.
4. ආයතන 72ක ඵලදායිතා විගණන 288ක් පැවැත්වීම.
5. පාසල් ඵලදායිතා සහතිකපත්‍ර පාඨමාලා 72ක් පැවැත්වීම.
6. ඵලදායිතා සංකල්ප පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 70ක් පවත්වා එමඟින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට රු.39,000.00ක ආදායමක් ලබා දීම.

## 2.34. උපදේශන අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. සේවාලාභීන් සඳහා ජාතික මට්ටමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යෑම.

2. සේවාලාභීන්ගේ ගැටලු සහගත තත්වයන් තක්සේරු කිරීම උදෙසා මනෝ විද්‍යාත්මක තක්සේරු මාපකයක් භාවිත කිරීම.
3. විශේෂ උපදේශන වැඩසටහන් සහ සායන 18ක් තුළින් හඳුනාගත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් 328ක් මනෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම.

**අභියෝග**

1. පවතින ආර්ථික ගැටලු හමුවේ ඉලක්කගත වැඩසටහන් නිසිලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම හා ඒ සඳහා ඉලක්කගත කණ්ඩායම්වල සහභාගිත්වය ලබා ගැනීම.
2. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම.
3. මනෝ උපදේශන කටයුතු වල දී සේවාලාභීන්ගේ පෞද්ගලිකත්වය රැකෙන පරිදි කටයුතු ඉටු කිරීමට නොහැකි වීම.
4. උපදේශන සේවාව පිළිබඳව ඇති අඩු දැනුම හා අවබෝධය නිසා සේවා අපේක්ෂිතයන් යොමු වීම අඩු වීම.

**ඉදිරි ඉලක්ක**

1. "ඵලදායී පුරවැසියෙක් - සාර්ථක පවුලක්" යන තේමාව යටතේ පුද්ගලයන් ගැටලුවලට පාත්‍ර වීමට පෙරාතුව ගලවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම හා ආර්ථික වශයෙන් බිඳ වැටී සිටින ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් උපදේශන වැඩසටහන් 48ක් පැවැත්වීම.
2. "පාසල් දරුවන්ගේ චිත්තවේගී බුද්ධිය සංවර්ධනය කිරීම යටතේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනික ගැටලු හා තාක්ෂණය අවභාවිතය වැළැක්වීම සඳහා වැඩසටහන් 24ක් ක්‍රියාත්මක කිරීම.
3. "සුවපත් සිතක් සවිමත් දැයක් බිහිකිරීම" යටතේ බෝ නොවන රෝග සඳහා හේතු වන මානසික සෞඛ්‍ය ගැටලු, පරිසර දූෂණය, විෂ සහිත ආහාර පරිභෝජනය වැරදි ආහාර රටා වෙනස් කර ගැනීමට ප්‍රජාව යොමු කිරීම හා මත් උවදුරට ඇබ්බැහි වී සිටින්නන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සවිබල ගැන්වීම වෙනුවෙන් උපදේශන සායන හා වැඩසටහන් 24ක් පැවැත්වීම.

## 2.35. සමඨ පුහුණු අංශය

**විශේෂ ජයග්‍රහණ**

1. 2003 අංක 21 දරන සමඨ මණ්ඩල විශේෂ වර්ගවල ආරවුල් පනත යටතේ ඉඩම් ආරවුල් විසඳීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයට විශේෂිත වූ ඉඩම් සමඨ මූල මණ්ඩලයක් පිහිටුවීම.
2. සමඨ මූල මණ්ඩල 13ක ආරවුල් 10,000ක් ඉක්මවා කටයුතු අවසන් කර තිබීම.

3. සමථ මූල මණ්ඩල 13ක සාකච්ඡා කිරීම පිණිස ආරවුල් 2272 ක් අධිකරණ මඟින් යොමුකර තිබීම.

**අභියෝග**

1. රජයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි නොලැබීම මත පුහුණු වැඩමුළු හා සමථ මූල මණ්ඩල රැස්වීම් වාර සංඛ්‍යාව අඩුකිරීමට සිදුවීම.
2. සමථ මූල මණ්ඩල නැවත ආරම්භයේ දී සමථකරණ කටයුතු ඉටුකිරීම පිණිස ප්‍රමාණවත් යටිතල පහසුකම් ලබා නොදීම.
3. ජනතාව සමථකරණය පිළිබඳ දැනුවත් නොවීම හා තම ආරවුල් උසාවිය මඟින්ම විසඳා ගත යුතු බවට වන ඍණාත්මක ආකල්ප පැවතීම.
4. 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතට කරන ලද සංශෝධන අනුව රුපියල් ලක්ෂ 5ට නොවැඩි මූල්‍ය ආරවුල් මුල් අවස්ථාවේ දී සමථ මූල මණ්ඩල වෙත යොමු විය යුතුවීම. ඒ හේතුවෙන් සමථකරණයට යොමුවන මූල්‍ය ආරවුල් ප්‍රමාණය ඉහළ යෑම.
5. පාර්ශවයන් සමථකරණයෙන් වූ එකඟතාවයන් ක්‍රියාත්මක නොකරන අවස්ථා පැවතීම.
6. පාසැල් සමථකරණ වැඩමුළු සඳහා පාසැල් සම්බන්ධකර ගැනීමේ දී විදුහල්පතිවරුන් හා දෙමාපියන් වෙතින් ගැටළු මතුවීම.

**ඉදිරි ඉලක්ක**

1. කොළඹ දිස්ත්‍රික්කය තුළ අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් යුත් සමථ මූල මණ්ඩල 13ක් ඇති කිරීම. ගැසට් කරන ලද සමථ මූල මණ්ඩල 06ක් සඳහා දින 05 බැගින් වූ පුහුණු වැඩමුළු පවත්වා නිර්දේශිත වාර්තා 06ක් බාරදීම (දින ගණන 30කි. වාර්තා 06කි)
2. සමථකරණ ආරවුල් සාකච්ඡා කිරීමට හා නිසි මඟ පෙන්වීමට වාර්ෂිකව පවත්වන සමථ මූල මණ්ඩල 24 අධීක්ෂණය කිරීම.
3. සමථ මණ්ඩල 13හි සහ ඉඩම් සමථ මූල මණ්ඩලයෙහි ප්‍රමාණාත්මක තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක වාර්තා මාස 12 තුළ අඛණ්ඩව පවත්වා ගැනීම.
4. සියළුම පාර්ශවයන්ට සාධාරණත්වය ලබාදීම සහ ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාවය පිළිබඳ සැලකිලිමත්ව සමථකරුවන් 40ක් බැගින් තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණ 05කට සම්බන්ධවීම.
5. සමථ මූල මණ්ඩල කෙරෙහි ජනතා විශ්වාසය ඇති කරලීම පිණිස, යොමුවන



පෙත්සම් පිළිබඳ රහස්‍ය වාර්තා මසකට 01ක් බැගින් ලබාදීම.

6. සමාජගත වන නීතිවේදීන් සමථකරණයට සංවේදී කරවීම පිණිස නීති විද්‍යාලය තුළ වර්ෂයකට වැඩමුළු 2ක් පවත්වා සිසුන් 800ක් දැනුවත් කිරීම.
7. සෑම මසකම ප්‍රගතිය සමාලෝචනය කර ප්‍රගති වාර්තා 12ක් ලබාදීම.
8. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමථකරණයට යොමු කරවීම පිණිස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13හි වැඩමුළු 02ක් බැගින් මාස 12ට අදාළව පැවැත්වීම.
9. පාසැල් දරුවන් සමථකරණය මඟින් ආරවුල් විසඳා ගැනීමට යොමු කරලීම පිණිස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13හි වැඩමුළු 02ක් බැගින් සිදු කිරීම (13*02*12) සහ පාසැල් සමථ ඒකක 05ක් පවත්වා ගැනීම.

කේ. ජී. විජේසිරි,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය.

# 3 පරිච්ඡේදය

## සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 රු. | | සටහන | 2022 රු. | 2021 රු. | |
|---|---|---|---|---|---|
| | | | කළාප | | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසිඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| 5,824,576,000 | භාණ්ඩාගාර අග්‍රිම | | 5,824,576,000 | 7,290,059,000 | ඒසිඒ-3 |
| 1,403,553,090 | නැන්පතු | | 1,403,553,090 | 3,501,268,932 | ඒසිඒ-4 |
| 73,964,747 | අත්තිකාරම් ගිණුම් | | 73,964,747 | 76,158,363 | ඒසිඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **7,302,093,837** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **7,302,093,837** | **10,867,486,295** | |
| **7,302,093,837** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **7,302,093,837** | **10,867,486,295** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | - | 1,850,417 | |
| **7,302,093,837** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **7,302,093,837** | **10,865,635,878** | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 849,100,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිල | 5 | 790,926,377 | 745,648,815 | |
| 247,887,691 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 216,194,713 | 198,121,177 | ඒසිඒ-2(ii) |
| 9,458,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 7,742,475 | 1,502,602,624 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 554,309 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 503,664 | 349,600 | |
| **1,107,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,015,367,229** | **2,446,722,216** | |
| | මූලධන වියදම් | | | | |
| 45,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 43,183,684 | 66,725,349 | |
| 85,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 76,085,585 | 341,558,089 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසිඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | |
| 2,500,000 | හැකියා වර්ධනය | 14 | 1,767,336 | 2,328,644 | |
| 946,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 825,194,184 | - | |
| **1,079,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **946,230,789** | **410,612,082** | |
| 1,903,594,238 | නැන්පතු ගෙවීම් | | 1,903,594,238 | 3,249,758,762 | ඒසිඒ-4 |
| 66,375,016 | අත්තිකාරම් ගෙවීම් | | 66,375,016 | 71,369,673 | ඒසිඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| **1,969,969,254** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **1,969,969,254** | **3,321,128,435** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 3,931,567,272 | 6,178,462,733 | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **3,370,526,565** | **4,687,173,145** | |
| | | 130-1-17-0-1001 | 68,500.00 | 68,064.05 | 68,064.05 | 99.36 |
| | | 130-1-17-0-1002 | 155.00 | 150.53 | 150.53 | 97.11 |
| | | 130-1-17-0-1003 | 30,709.50 | 30,795.93 | 30,795.93 | 100.28 |
| | | 130-1-17-0-1101 | 350.00 | 215.93 | 215.93 | 61.70 |
| | | 130-1-17-0-1201 | 375.00 | 375.00 | 375.00 | 100.00 |
| | | 130-1-17-0-1202 | 502.54 | 443.61 | 443.61 | 88.27 |
| | | 130-1-17-0-1205 | 0.00 | 0.00 | - | |
| | | 130-1-17-0-1301 | 527.68 | 466.86 | 466.86 | 88.47 |
| | | 130-1-17-0-1302 | 200.00 | 191.56 | 191.56 | 95.78 |
| | | 130-1-17-0-1402 | 2,113.40 | 282.25 | 282.25 | 13.36 |
| | | 130-1-17-0-1409 | 50.00 | 31.51 | 31.51 | 63.02 |
| | | 130-1-17-0-1506 | 840.00 | 829.00 | 829.00 | 98.69 |
| | | 130011 | 13,300.00 | 12,830.08 | 12,830.08 | 96.47 |
| 3 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 201-2-2-0-1409-(014) | 185.00 | 137.50 | 137.50 | 74.32 |
| | | 201-2-2-0-1101 | 1,112.90 | 890.27 | 890.27 | 80.00 |
| | | 201-2-2-0-1201 | 99.93 | 96.16 | 96.16 | 96.23 |
| | | 201-1-1-0-1409 | 12.80 | - | - | 0.00 |
| | | 201-2-2-011-2205 | 217.30 | 183.20 | 183.20 | 84.31 |
| | | 201-2-2-0-1409(007) | 78.50 | 72.50 | 72.50 | 92.36 |
| | | 201-2-2-015-1501 | 51,027.30 | 49,564.50 | 49,564.50 | 97.13 |
| | | | 0.00 | - | - | |
| 4 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 206-2-3-0-1409 | 10.00 | 9.29 | 9.29 | 92.90 |
| | | 206-2-3-13-1409 | 855.50 | 845.90 | 845.90 | 98.88 |
| | | 206-2-3-0-1101 | 327.75 | 263.48 | 263.48 | 80.39 |
| | | 206-2-2-0-2401 | 14.00 | 13.97 | 13.97 | 99.75 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 206-1-1-0-1402 | 11.25 | 8.93 | 8.93 | 79.33 |
| | | 206-2-3-4-1508 | 2,370.93 | 2,248.64 | 2,248.64 | 94.84 |
| | | 206-2-3-0-1402 | 55.50 | 38.80 | 38.80 | 69.92 |
| | | 206-2-3-3-1508 | 248.50 | 229.37 | 229.37 | 92.30 |
| | | 206-2-3-0-1201 | 44.25 | 39.78 | 39.78 | 89.89 |
| | | 206-2-3-6-1409 | 10.00 | 9.95 | 9.95 | 99.50 |
| | | 206-2-3-0-2102 | 23.64 | - | - | 0.00 |
| | | 206-2-2-1-1409 | 140.00 | 189.90 | 189.90 | 135.64 |
| | | 206-2-2-2-1409 | 540.00 | 390.00 | 390.00 | 72.22 |
| | | | 0.00 | - | - | |
| 5 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 208-2-3-0-2001 | 5,500.00 | - | - | 0.00 |
| | | | 0.00 | - | - | |
| 6 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 210-1-2-0-1101 | 85.00 | 74.72 | 74.72 | 87.90 |
| | | 210-1-2-0-1201 | 12.00 | 12.00 | 12.00 | 100.00 |
| | | 210-1-2-0-1402 | 18.73 | 18.60 | 18.60 | 99.31 |
| | | 210-1-2-0-1205 | 19.50 | 17.25 | 17.25 | 88.46 |
| | | 210-1-2-0-1409(21) | 9.00 | 9.00 | 9.00 | 100.00 |
| | | 210-1-2-0-1002 | 15.00 | 3.99 | 3.99 | 26.59 |
| | | | 0.00 | - | - | |
| 7 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 216-2-2-0-1001 | 9,802.29 | 9,526.18 | 9,526.18 | 97.18 |
| | | 216-2-2-0-1003 | 3,372.14 | 3,359.40 | 3,359.40 | 99.62 |
| | | 216-2-2-0-1101 | 344.00 | 285.08 | 285.08 | 82.87 |
| | | 216-2-2-0-1201 | 54.25 | 51.46 | 51.46 | 94.86 |
| | | 216-2-2-0-1402 | 139.00 | 120.49 | 120.49 | 86.68 |
| | | 216-2-2-0-1506 | 111.58 | 79.40 | 79.40 | 71.16 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 216-2-3-1-1501 | 692.30 | 623.64 | 623.64 | 90.08 |
| | | 216-2-3-8-1508 | 622.45 | 460.95 | 460.95 | 74.05 |
| | | 216-2-3-5-2509 | 160.54 | 130.18 | 130.18 | 81.09 |
| | | 216-2-2-0-1002 | 17.65 | 17.65 | 17.65 | 100.00 |
| | | | 0.00 | - | - | |
| 8 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 217-2-2-0-1101 | 400.00 | 383.62 | 383.62 | 95.91 |
| | | 217-2-2-0-1201 | 51.00 | 48.00 | 48.00 | 94.12 |
| | | 217-2-2-4-2202 | 117.71 | 117.71 | 117.71 | 100.00 |
| | | 217-2-2-5-2202 | 1,110.98 | 1,044.76 | 1,044.76 | 94.04 |
| | | 217-2-2-6-2202 | 935.00 | 919.22 | 919.22 | 98.31 |
| | | 217-2-2-3-2202 | 138.04 | 138.03 | 138.03 | 100.00 |
| | | | 0.00 | - | - | |
| 9 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 219-2-2-2-1409(101) | 557.00 | 510.84 | 510.84 | 91.71 |
| | | | 0.00 | - | - | |
| 10 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 227-1-1-0-1001 | 15,427.86 | 15,106.88 | 15,106.88 | 97.92 |
| | | 227-1-1-0-1003 | 6,488.94 | 6,390.11 | 6,390.11 | 98.48 |
| | | 227-1-1-0-1201 | 570.50 | 552.25 | 552.25 | 96.80 |
| | | 227-1-1-0-1002-11 | 69.85 | 63.65 | 63.65 | 91.13 |
| | | 227011 | 490.00 | 197.93 | 197.93 | 40.39 |
| | | 227-1-1-0-1506 | 232.59 | 231.20 | 231.20 | 99.40 |
| | | 227-1-1-0-1101 | 3.91 | 3.87 | 3.87 | 98.98 |
| | | | 0.00 | - | - | |
| 11 | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | 248-1-1-0-2001 | 2,356.59 | 2,240.88 | 2,240.88 | 95.09 |
| | | | 0.00 | - | - | |
| 12 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 252-1-1-0-1002 | 104.73 | 72.81 | 72.81 | 69.52 |
| | | 252-1-1-0-1409-34 | 202.36 | 181.94 | 181.94 | 89.91 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 252-1-1-0-1202 | 131.33 | 110.87 | 110.87 | 84.42 |
| | | 252-1-1-0-1402 | 45.30 | 39.64 | 39.64 | 87.50 |
| | | 252-1-1-0-1201 | 30.50 | 30.50 | 30.50 | 100.00 |
| | | 252-1-1-0-1302 | 23.31 | 23.31 | 23.31 | 100.00 |
| | | 252-1-1-0-1301 | 0.50 | 0.50 | 0.50 | 100.00 |
| | | 252-1-1-0-1101 | 505.00 | 491.39 | 491.39 | 97.31 |
| | | | 0.00 | - | - | |
| 13 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 286-2-1-0-1409(74) | 25.50 | - | - | 0.00 |
| | | | 0.00 | - | - | |
| | | | 0.00 | - | - | |
| 14 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 303-2-1-0-1501 | 7,258.00 | 6,915.00 | 6,915.00 | 95.27 |
| | | | 0.00 | - | - | |
| 15 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 307-2-1-10-2104 | 5,897.03 | 5,649.30 | 5,649.30 | 95.80 |
| | | 307-2-1-0-2001 | 3,100.00 | 3,078.68 | 3,078.68 | 99.31 |
| | | | 0.00 | - | - | |
| 16 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | 326-1-1-0-1201 | 18.00 | 14.25 | 14.25 | 79.17 |
| | | 326-1-1-0-2001 | 772.41 | 772.41 | 772.41 | 100.00 |
| | | | 0.00 | - | - | |
| 17 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව | 327-2-1-0-1101 | 408.00 | 322.03 | 322.03 | 78.93 |
| | | 327-2-1-0-2507 | 361.14 | 350.32 | 350.32 | 97.01 |
| | | 327-2-1-0-2401 | 42.00 | 33.80 | 33.80 | 80.48 |
| | | 327-2-1-0-1201 | 26.00 | 23.25 | 23.25 | 89.42 |
| | | 327-2-1-0-2509 | 136.10 | 118.50 | 118.50 | 87.07 |
| | | | 0.00 | - | - | |
| 18 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 328-2-1-5-2509 | 17.16 | 13.44 | 13.44 | 78.30 |
| | | 328-2-1-2-2509 | 94.80 | 94.00 | 94.00 | 99.16 |
| | | 328-1-1-0-1101 | 699.00 | 591.54 | 591.54 | 84.63 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 328-1-1-0-1201 | 25.20 | 21.30 | 21.30 | 84.52 |
| | | 328-2-1-4-2509 | 60.80 | 57.30 | 57.30 | 94.24 |
| | | 328-2-1-3-2509 | 36.00 | 30.00 | 30.00 | 83.33 |
| | | 328-1-1-0-1402 | 15.50 | 13.50 | 13.50 | 87.10 |
| | | | 0.00 | - | - | |
| 19 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | 334 -1-1-0-1001 | 8,857.17 | 8,512.77 | 8,512.77 | 96.11 |
| | | 334 -1-1-0-1003 | 470401.18 | 397,552.28 | 397,552.28 | 84.51 |
| | | 334 -1-1-0-1201 | 430.75 | 411.20 | 411.20 | 95.46 |
| | | 334 -1-1-0-1101 | 567.51 | 421.93 | 421.93 | 74.35 |
| | | 334011 | 1003.74 | 997.74 | 997.74 | 99.40 |
| | | 334-1-1-0-1302 | 41.46 | 24.15 | 24.15 | 58.24 |
| | | 334-1-1-0-1002 | 1.75 | - | - | 0.00 |
| 20 | බුද්ධශාසන ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 101-2-6-9-2205 | 609.75 | 520.25 | 520.25 | 85.32 |
| | | 101-2-6-0-1409(8) | 3,768.30 | 138.44 | 138.44 | 3.67 |
| | | 101-2-6-8-2205 | 1,810.00 | 1,808.01 | 1,808.01 | 99.89 |
| | | 101-2-5-0-2001 | 509.40 | 286.80 | 286.80 | 56.30 |
| 21 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 102-1-16-1001 | 463.99 | 463.99 | 463.99 | 100.00 |
| | | 102-1-16-1003 | 247.50 | 247.50 | 247.50 | 100.00 |
| | | 102-1-16-1201 | 7.50 | 7.49 | 7.49 | 99.87 |
| 22 | ආරක්ෂක අමාත්‍යාංශය | 103-2-18-1001 | 2,982.80 | 2,915.76 | 2,915.76 | 97.75 |
| | | 103-2-18-1003 | 1,145.99 | 1,081.18 | 1,081.18 | 94.34 |
| | | 103-2-18-1101 | 193.00 | 178.02 | 178.02 | 92.24 |
| | | 103-2-18-1506 | 69.65 | 23.14 | 23.14 | 33.23 |
| | | 103-2-18-1-1501 | 3,481.30 | 2,786.38 | 2,786.38 | 80.04 |
| | | 103-2-18-7-2506 | 916.03 | 967.12 | 967.12 | 105.58 |
| | | 103-2-18-1201 | 44.00 | 41.00 | 41.00 | 93.18 |
| | | 103-2-18-3-1508 | 1,514.17 | 1,514.17 | 1,514.17 | 100.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 103-2-18-5-2202 | 400.00 | 400.00 | 400.00 | 100.00 |
| 23 | අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 110-1-5-0-1001 | 4,700.41 | 4,280.52 | 4,280.52 | 91.07 |
| | | 110-1-5-0-1003 | 2,606.61 | 2,530.39 | 2,530.39 | 97.08 |
| | | 110-1-5-0-1101 | 126.00 | 85.67 | 85.67 | 67.99 |
| | | 110-1-5-0-1201 | 81.00 | 75.75 | 75.75 | 93.52 |
| | | 110-1-5-0-1506 | 208.34 | 173.76 | 173.76 | 83.40 |
| | | 110-1-3-0-1409 (43) | 170.05 | 169.76 | 169.76 | 99.83 |
| | | 110-1-5-2-2509 | 834.00 | 824.14 | 824.14 | 98.82 |
| | | 110-1-5-13-2509 | 1,951.00 | 1,872.64 | 1,872.64 | 95.98 |
| | | 110-1-4-5-2202 | 1,040.00 | 1,038.46 | 1,038.46 | 99.85 |
| | | 110-1-3-0-1409 (42) | 9,221.00 | 8,212.69 | 8,212.69 | 89.07 |
| | | 110-1-3-0-1409 (44) | 63.37 | 57.80 | 57.80 | 91.20 |
| | | 110-1-3-0-1409 (46) | 84.50 | 77.00 | 77.00 | 91.12 |
| | | 110-1-3-0-1409 (47) | 36.4 | 31.60 | 31.60 | 86.81 |
| | | 110-1-3-0-1409 (48) | 39.00 | 24.57 | 24.57 | 62.99 |
| | | 110-1-3-0-1409 (49) | 0.75 | 0.75 | 0.75 | 100.00 |
| | | 110-1-3-0-1201 | 25.25 | 19.89 | 19.89 | 78.78 |
| 24 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 111-1-21-1001 | 1,101.91 | 1,140.75 | 1,140.75 | 103.52 |
| | | 111-1-21-1003 | 514.80 | 531.84 | 531.84 | 103.31 |
| | | 111-1-21-1101 | 24.75 | 22.45 | 22.45 | 90.69 |
| 25 | විදේශ අමාත්‍යාංශය | 112-2-2-5-1509 | 53.10 | 15.00 | 15.00 | 28.25 |
| | | 112-2-2-5-1503 | 431.82 | 431.82 | 431.82 | 100.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | වෙළඳ අමාත්‍යාංශය | 116-1-3-0-1001 | 1,344.79 | 1,276.77 | 1,276.77 | 94.94 |
| | | 116-1-3-0-1003 | 657.90 | 629.39 | 629.39 | 95.67 |
| 27 | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | 117-2-4-52-2105(11) | 60.00 | 59.98 | 59.98 | 99.96 |
| 28 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 118-1-2-0-1001 | 7,135.27 | 6,475.48 | 6,475.48 | 90.75 |
| | | 118-1-2-0-1003 | 2,977.45 | 2,679.84 | 2,679.84 | 90.00 |
| | | 118-1-2-0-1002 | 50.00 | 42.09 | 42.09 | 84.18 |
| | | 118-1-2-0-1101 | 90.00 | 84.45 | 84.45 | 93.83 |
| | | 118-1-2-0-1201 | 40.00 | 40.00 | 40.00 | 100.00 |
| | | 118-1-2-0-1202 | 559.30 | 553.90 | 553.91 | 99.03 |
| | | 118-1-2-0-1401 | 600.00 | 600.00 | 600.00 | 100.00 |
| | | 118-1-2-0-1402 | 78.38 | 78.84 | 78.84 | 100.59 |
| | | 118-1-2-0-1409 | 70.00 | 79.86 | 79.86 | 114.08 |
| | | 118-2-3-62-2509 | 4,109.94 | 2,230.43 | 2,230.43 | 54.27 |
| | | 118-2-3-68-2509 | 5,515.00 | 4,355.45 | 4,355.45 | 78.97 |
| | | 118-1-2-0-1506 | 29.67 | 37.97 | 37.97 | 128.00 |
| | | 118-1-2-0-1302 | 23.80 | 23.80 | 23.80 | 99.99 |
| | | 118011 | 70.00 | 70.00 | 70.00 | 100.00 |
| | | 118-1-22-1202 | 20.00 | 20.00 | 20.00 | 100.00 |
| | | 118-1-22-1409 | 10.00 | 4.95 | 4.95 | 49.50 |
| | | 118-2-23-001-1504 | 41.72 | - | - | - |
| 29 | අධ්‍යාපන හා කර්මාන්ත අමාත්‍යාංශය | 126-2-19-30-1201 | 54.35 | 52.85 | 52.85 | 97.24 |
| | | 126-2-19-30-1402 | 21.00 | 13.05 | 13.05 | 62.13 |
| | | 126-2-19-30-1403 | 48.90 | 27.39 | 27.39 | 56.00 |
| | | 126-2-19-30-1404 | 243.27 | 216.00 | 216.00 | 88.79 |
| | | 126-2-19-30-1409 | 28.50 | 13.36 | 13.36 | 46.86 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 126-2-19-30-2002 | 9.00 | 9.00 | 9.00 | 100.00 |
| | | 126-2-19-30-1301 | 40.65 | 40.65 | 40.65 | 100.00 |
| | | 126-1-18-1101 | 142.20 | 140.35 | 140.35 | 98.70 |
| | | 126-1-18-1201 | 29.75 | 27.25 | 27.25 | 91.60 |
| | | 126-2-19-30-1302 | 51.70 | 47.00 | 47.00 | 90.91 |
| | | 126-2-19-30-1002 | 5.00 | 8.58 | 8.58 | 171.47 |
| | | 126-2-5-2-2001 | 2,998.09 | 2,934.30 | 2,934.30 | 97.87 |
| | | 126-2-21-2-2401 | 20.00 | 18.00 | 18.00 | 90.00 |
| 30 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130-1-2-0-1001 | 154,243.88 | 145,091.86 | 145,091.86 | 94.07 |
| | | 130-1-2-0-1003 | 104,433.62 | 95,211.99 | 95,211.99 | 91.17 |
| 31 | ධීවර අමාත්‍යාංශය | 151-1-2-1-1501 | 258,585.50 | 256,283.00 | 256,283.00 | 99.11 |
| 32 | පරිසර අමාත්‍යාංශය | 160-1-2-0-1001(11) | 384.55 | 383.22 | 383.22 | 99.65 |
| | | 160-1-2-0-1003(11) | 183.60 | 183.60 | 183.60 | 100.00 |
| | | 160-2-3-124-2509(11) | 3,825.00 | 2,106.69 | 2,106.69 | 55.08 |
| | | 160-2-3-145-2509 | 7.20 | 7.20 | 7.20 | 100.00 |
| 33 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | 171-2-6-4-2509 | 987.03 | 957.08 | 957.08 | 96.97 |
| | | 171-2-7-1001 | 1,418.78 | 1,380.97 | 1,380.97 | 97.34 |
| | | 171-2-7-1003 | 514.80 | 493.46 | 493.46 | 95.85 |
| | | 171-2-7-1201 | 6.60 | 6.60 | 6.60 | 100.00 |
| | | 171-2-7-1101 | 110.00 | 105.70 | 105.70 | 96.09 |
| | | 171-2-7-1506 | 48.21 | 28.82 | 28.82 | 59.79 |
| | | 171-2-8-3-1409 | 19,062.50 | 18,692.50 | 18,692.50 | 98.06 |
| | | 171-2-8-12-2202(13) | 315.00 | 300.00 | 300.00 | 95.24 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 171-2-8-2-1501 | 2,115.24 | 2,112.00 | 2,112.00 | 99.85 |
| | | 171-2-6-7-2509 | 1,670.65 | 1,644.09 | 1,644.09 | 98.41 |
| | | 171-2-8-1101 | 56.00 | 53.94 | 53.94 | 96.32 |
| | | 171-2-8-001-1501 | 60,852.00 | 17,428.00 | 17,428.00 | 28.64 |
| | | 171-2-6-1101 | 112.00 | 101.13 | 101.13 | 90.29 |
| | | 171-2-8-1201 | 3.50 | 3.25 | 3.25 | 92.86 |
| | | 171-2-7-4-1501 | 2,560.00 | 2,190.90 | 2,190.90 | 85.58 |
| | | 171-2-9-003-1501 | 36,072.00 | 22,494.20 | 22,494.20 | 62.36 |
| | | 171-2-9-004-1501 | 150.00 | 142.50 | 142.50 | 95.00 |
| | | 171-2-7-1-1501 | 15,820.00 | 14,482.30 | 14,482.30 | 91.54 |
| | | 171-2-6-1201 | 7.5 | 6.91 | 6.91 | 92.19 |
| 34 | තාක්ෂණ අමාත්‍යාංශය | 186-2-3-008-2509 | 324.41 | 177.53 | 177.54 | 54.73 |
| 35 | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | 189-1-02-002-1503 | 143.94 | 143.94 | 143.94 | 100.00 |
| | | 189-1-02-002-1509 | 17.70 | 5.70 | 5.70 | 32.20 |
| 36 | කම්කරු හා විදේශ රැකියා රාජ්‍ය අමාත්‍යාංශය | 193-1-7-0-1101 | 424.60 | 390.67 | 390.67 | 92.01 |
| | | 193-1-14-0-1101 | 290.00 | 185.87 | 185.87 | 64.09 |
| | | 193-1-14-1-2509 | 8.20 | 8.09 | 8.09 | 98.60 |
| | | 193-1-7-1-2401 | 85.50 | 85.50 | 85.50 | 100.00 |
| 37 | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 194-2-8-0-1101 | 606.59 | 532.94 | 532.94 | 87.86 |
| | | 194-2-8-0-1201 | 181.16 | 181.16 | 181.16 | 100.00 |
| | | 194-2-8-0-1402 | 52.23 | 44.70 | 44.70 | 85.58 |
| | | 194-2-8-0-1403 | 25.00 | 25.00 | 25.00 | 100.00 |
| | | 194-2-8-0-1409 | 70.62 | 29.85 | 29.85 | 42.27 |
| | | 194-2-8-4-2202(26) | 4,303.99 | 1,823.25 | 1,823.25 | 42.36 |
| | | 194-2-8-0-1302 | 130.87 | 117.88 | 117.88 | 90.07 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 194-2-7-8-1409 | 850.00 | 697.00 | 697.00 | 82.00 |
| | | 194-2-8-0-2002 | 55.10 | 55.10 | 55.10 | 100.00 |
| 38 | බුද්ධශාසන ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 401-2-3-18-2509 | 60.00 | 60.00 | 60.00 | 100.00 |
| 39 | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 402-2-1-0-2001 | 3,116.12 | 2,573.70 | 2,573.70 | 82.59 |
| 40 | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | 403-2-4-3-1409 | 38,705.00 | 34,432.50 | 34,432.50 | 88.96 |
| | | 403-2-4-2-1501 | 3,764.96 | 2,660.07 | 2,660.07 | 70.65 |
| | | 403-2-4-1-1501 | 210,140.00 | 154,480.50 | 154,480.50 | 73.51 |
| | | 403-2-3-4-2509 | 43.16 | 43.16 | 43.16 | 100.00 |
| | | 403-2-3-7-2509 | 308.95 | 304.90 | 304.90 | 98.69 |
| | | 403-2-4-0-1101 | 252.00 | 209.74 | 209.74 | 83.23 |
| | | 403-2-7-11-2001 | 9,041.47 | - | - | - |
| | | 403-2-4-6-2509(13) | 20.00 | - | - | - |
| | | 403-2-3-0-1101 | 348.00 | 294.87 | 294.87 | 84.73 |
| 41 | වේවැල්, පිත්තල, මැටි ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 408-2-3-1-1101 | 525.53 | 444.90 | 444.90 | 84.66 |
| | | 408-2-3-1-1201 | 63.00 | 58.50 | 58.50 | 92.86 |
| | | 408-2-3-1-1402 | 63.00 | 36.99 | 36.99 | 58.71 |
| | | 408-2-3-1-1403 | 129.78 | 67.42 | 67.42 | 51.95 |
| | | 408-2-3-1-1404 | 675.27 | 675.27 | 675.27 | 100.00 |
| | | 408-2-3-1-1409 | 96.54 | 64.96 | 64.96 | 67.29 |
| | | 408-2-3-8-2509 | 220.60 | 139.30 | 139.30 | 63.15 |
| | | 408-2-3-1-1002 | 3.57 | 3.57 | 3.57 | 100.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 42 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | 412-1-2-1-2509 | 63.40 | 55.12 | 55.12 | 86.94 |
| | | 412-1-2-0-1101 | 574.00 | 472.51 | 472.51 | 82.32 |
| | | 412-1-2-0-1201 | 161.00 | 15278 | 152.78 | 94.89 |
| | | 412-1-2-2-2509 | 23.00 | 23.00 | 23.00 | 100.00 |
| | | 412 (011) | 340.00 | 190.00 | 190.00 | 55.88 |
| 43 | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 414-2-7-4-1501 | 24,037.50 | 23,145.00 | 23,145.00 | 96.29 |
| | | 414-2-7-1-1501 | 149,452.50 | 143,686.50 | 143,686.50 | 96.14 |
| | | 414-2-7-0-1001 | 3,839.74 | 3,731.79 | 3,731.79 | 97.19 |
| | | 414-2-7-0-1003 | 1,544.40 | 1,562.91 | 1,562.91 | 101.20 |
| | | 414-2-7-0-1201 | 19,800.00 | 18,600.00 | 18.60 | 93.94 |
| | | 414-2-7-0-1101 | 132.00 | 113.46 | 113.46 | 85.95 |
| | | 414-2-7-8-2509 | 242.50 | 215.16 | 215.16 | 88.73 |
| | | 414-2-7-0-1506 | 131.48 | 123.29 | 123.29 | 93.77 |
| | | 414-2-3-3-2509 | 10,588.94 | 8,993.32 | 8,993.32 | 84.93 |
| | | 414-2-3-4-2509 | 210.39 | 210.39 | 210.39 | 100.00 |
| 44 | දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය | 416-1-2-0-1001 | 3,201.29 | 3,104.89 | 3,104.89 | 96.99 |
| | | 416-1-2-0-1003 | 1,450.80 | 1,400.85 | 1,400.85 | 96.56 |
| | | 416-1-2-0-1201 | 16.50 | 15.00 | 15.00 | 90.91 |
| | | 416-1-2-0-1101 | 69.75 | 49.99 | 49.99 | 71.67 |
| 45 | නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය | 421-2-6-2-2401 | 53.10 | 49.95 | 49.95 | 94.07 |
| | | 421-1-3-0-1101 | 490.40 | 291.56 | 291.56 | 59.45 |
| | | 421-1-3-0-1201 | 31.00 | 29.67 | 29.67 | 95.71 |
| | | 421-2-6-15-2509 | 35.00 | 35.00 | 35.00 | 100.00 |
| 46 | දහම් පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | 422-1-2-1-2205 | 800.00 | - | - | - |
| 47 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 426-1-2-0-1202 | 58.00 | 58.00 | 58.00 | 100.00 |
| | | 426-1-2-1001 | 188.05 | 156.56 | 156.56 | 83.25 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 426-1-2-0-1202 | 43.00 | 58.00 | 58.00 | 134.88 |
| | | 426-1-2-0-1003 | 45.90 | 30.60 | 30.60 | 66.67 |
| | | 426-1-2-0-1409 | 25.00 | 23.00 | 23.00 | 92.00 |
| | | 426-1-2-0-1002 | 30.79 | 30.79 | 30.79 | 99.99 |
| 48 | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය | 435-2-3-2-2506 | 29,360.80 | 29,360.80 | 29,360.80 | 100.00 |
| 49 | ප්‍රාථමික සෞඛ්‍ය සේවා වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 441-2-3-3-1501 | 451,420.00 | 419,780.40 | 419,780.40 | 92.99 |
| | | 441-2-3-4-1501 | 1,447.50 | 1,260.00 | 1,260.00 | 87.05 |
| 50 | ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය | 442-2-7-7-2506 | 3,432.52 | 3,061.40 | 3,061.40 | 89.19 |
| | | 442-2-7-0-1001 | 7,608.68 | 7,248.66 | 7,248.66 | 95.27 |
| | | 442-2-7-0-1003 | 3,354.00 | 3,349.46 | 3,349.46 | 99.86 |
| | | 442-2-7-0-1101 | 439.00 | 389.05 | 389.05 | 88.62 |
| | | 442-2-7-0-1201 | 104.50 | 102.86 | 102.86 | 98.43 |
| | | 442-2-7-0-1301 | 116.45 | 183.26 | 183.26 | 157.37 |
| | | 442-2-7-3-1508 | 1,895.34 | 381.20 | 381.20 | 20.11 |
| | | 442-2-7-5-2202 | 1,700.00 | 1,400.00 | 1,400.00 | 82.35 |
| | | 442-2-7-1-1501 | 1,195.90 | 1,124.80 | 1,124.80 | 94.05 |
| | | 442-2-7-0-2001 | 487.23 | 472.62 | 472.62 | 97.00 |
| | | 442-2-7-0-1506 | 25.43 | 71.86 | 71.86 | 282.55 |
| | | 442-2-7-6-2202 | 952.80 | - | - | - |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. , 000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 603,421.78 | 603,421.78 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 591,880.64 | 591,880.64 | - | - |
| 9153 | ඉඩම් | 1,841,537.00 | 1,841,537.00 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 1,482,923.05 | 1,482,923.05 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

- විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ කෙටුම්පත මේ සමඟ අමුණා ඉදිරිපත් කෙරේ.
- එම සම්පිණ්ඩන වාර්තාවේ අවසන් වාර්තාව කාර්ය සාධන වාර්තාවේ අවසානයට අමුණා ඇත.

**ගණන්දීමේ නිලධාරී**
**කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 විගණන මතය**

---

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දිනකදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**1.2 විගණන මතය සඳහා පදනම**

---

කෙටුම්පත් වාර්ථාවට ලැබෙන පිළිතුරු / පැහැදිලි කිරීම් සලකාබලා විගණන මතය පසුව නිකුත් කරනු ලැබේ.

## 1.3 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2021 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේහි 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.8,777,578,248ක් වූ මූල්‍ය නොවන වත්කම් වටිනාකමක් පැවති තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA-06) 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ ශේෂය ඉහත කී වටිනාකමට වෙනස් ශේෂයක් විය. ආරම්භක ශේෂය ලෙස රු.4,452,639,832 ක වටිනාකාමක් සටහන් කර තිබ්මෙන් රු.4,324,938,416ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | 2021/12/31 දිනට ශේෂය | 2022/01/01 දිනට ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කෙරීගෙන යන වැඩ | 5,807,786,770 | 1,482,923,047 | (4,324,863,723) |
| වෙනත් යන්ත්‍ර සහ උපකරණ | 412,484,553 | 412,409,861 | (74,692) |
| | | | (4,324,938,415) |

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව විගණනයට ඉදිරිපත් කළ CIGAS මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්ථාවන්හි ආරම්භක ශේෂවල එකතුව රු.4,509,205,410ක් වුවද ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.8,777,578,248ක් වූයෙන් ආරම්භක ශේෂයන්හි පහත සඳහන් නොසැසදීම් නිරීක්ෂණය විය.

| දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | 2021/12/31 දින ශේෂය | 2022/01/01 දින ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 6,572,479,126 | 2,247,615,402 | (4,324,863,724) |
| හෝමාගම | 113,047,281 | 162,642,858 | 49,595,577 |
| රත්මලාන | 123,818,664 | 130,788,664 | 6,970,000 |

| | | | |
|---|---|---|---|
| ජයවර්ධනපුර කෝට්ටේ | 212,115,192 | 212,175,500 | 60,308 |
| කොළොන්නාව | 21,871,578 | 21,736,578 | (135,000) |
| | | | ---------- |
| | | | (4,268,372,839) |
| | | | ========== |

(ඇ) මූල්‍ය ප්‍රකාශනයෙහි ACA-06 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි ප්‍රවාහන උපාංග යටතේ වාහන 38කට අදාලව රු.165,144,288 ක් වූ අතර එතුල ඇතුළත් නොවූ අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුවූ වාහන 04කට අදාල රු.15,500,000ක් නිරීක්ෂණය විය.

(ඈ) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දේපල පිරියත හා උපකරණ පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට කෙරීගෙන යන වැඩ රු.5,807,786,770ක් සහ එයට සමාලෝචිත වර්ෂය තුල එකතු කිරීම් රු.61,094,600ක් හා ඉවත්කිරීම් රු.4,385,958,383ක් ගලපා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** අංක HA/F/DA/48/AUDITGQ/2022 හා 2022 ඔක්තෝබර් 10 දිනැති ලිපියෙන් නිලමැදුර පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල සහ එය පිහිටා ඇති ඉඩම ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරාදීමට අවශ්‍ය කටයුතු අවසන් කරන මෙන් දන්වා තිබුණු අතර ඒ අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් යටතේ 2014 සිට 2021 දක්වා වැය විෂය විස්තරය 255-01-01-00-2104 ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර තිබුණු නිලමැදුර පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ලට අදාල වටිනාකම වන රු.4,385,958,383ක් 2022 නොවැම්බර් මස මෙම කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කළ බව 2022 නොවැම්බර් 28 දින ප්‍රධාන ගණකාධිකාරී විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා තිබුණි. තවද මෙම කාර්යාල ගොඩනැගිල්ලට අදාල වටිනාකම ගිණුම් පොත්පත්වලින් ඉවත් කළද, ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තවදුරටත් මෙම කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබුණි.

**(ii)** එසේ වුවත් 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණවලට අදාලව ඉදිරිපත් කළ ACA -6 වාර්තාවෙහි මෙම පැවරීම සිදුකළ පසුව ද කෙරීගෙන යන වැඩ ලෙස රු.1,482,923,047ක් දක්වා තිබුණද, මෙම කෙරීගෙන යන වැඩ අදාල වූ ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඉ) මූල්‍ය නොවන වත්කම් පරීක්ෂා කිරීමේදී අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතුවු තක්සේරු කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති අවස්ථා මෙන්ම තක්සේරු කර නොමැති නිසා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති අවස්ථාද නිරීක්ෂණය විය. පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලට අදාල තක්සේරු කරන ලද නිල සෙවන කාර්යාල 07 ක වටිනාකම රු.12,467,993ක්ද තක්සේරු කර නොමැති ගොඩනැගිලි 03ක්ද නිරීක්ෂණය විය.

**1.6.2 මූල්‍ය වත්කම්**

(අ). රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.196,040,972 ක් හා භාණ්ඩාගාර පොත් අනුව රු.197,181,641 ක් ලෙස සටහන්ව තිබීමෙන් ශේෂ අතර රු.1,150,694ක් වූ නොසැසඳුණු හර ශේෂයක් වාර්තා වී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේ සිට පැවත එන මෙම වෙනසට වසර 09 කට වැඩි කාලයක් ගතවී තිබුණද මේ දක්වා නිවැරදි කර නොතිබුණි.

(ආ). රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.196,040,972 ක් වුවද අත්තිකාරම් "බී" ගිණුමේ ඇමුණුම 3හි ඇති කේවල ශේෂ සාරාංශ වාර්තාව අනුව එය රු.196,042,997ක් වූයෙන් රු.2,025 වෙනසක් නිරීක්ෂණය වූ අතර එයට හේතු වී තිබුණේ ණය මුදල් සඳහා වූ පොළිය රු.2000ක් හා මුද්දර ගාස්තු රු.25ක් අත්තිකාරම් ගිණුමට ගිණුම් ගත කිරීමය.

(ඇ). සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැනට සේවයෙහි නොමැති සේවකයන් 39 දෙනෙකුට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු.5,156,396 ක් පැවතුණි. ඉන් රු.910,886 කට අදාල ණය ශේෂ 13ක් වර්ෂ 5 ක් හෝ ඊට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි.

(ඈ). අංක 118 දරන අයවැය චක්‍රලේඛ විධිවිධාන අනුව නිලධාරියෙක් ස්ථාන මාරු වී ගොස් මාස තුනක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලාගත යුතු වුවද කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට ස්ථාන මාරු වී ගිය නිලධාරියකුට අදාලව අයකර ගත් ණය වාරික දෙකක් රු.6,480ක් වැරදියට ගිණුම්ගත කිරීම හා තව නිලධාරියකුගේ ණය ශේෂ පවරාගැනීමේදී රු.7,950ක් වැඩිපුර බැර කිරීමෙන් ඇති වුණු රු.14,430ක ආපදා ණය ශේෂ දෙකක් මාස 3ත් 12ත් අතර කාල පරාසයක් ගතවී තිබුණද නිරවුල් කර නොතිබුණි.

(ඉ). අංක 118 දරන අයවැය චක්‍රලේඛ විධිවිධාන අනුව නිලධාරියෙක් ස්ථාන මාරු වී ගොස් මාස තුනක් ගතවීමෙන් පසු සංස්ථාපිත ආයතන අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලාගත යුතු වුවද කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයට ස්ථාන මාරු වී ගිය ආර්. රාජසුරේෂ් (කා.සේ.නි) ආපදා ණය රු.156,977ක ශේෂය මාස 3ත් 12ත් අතර කාල පරාසයක පැවතුණද නිරවුල් කර නොතිබුණි.

### 1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

භාණ්ඩාගාර ප්‍රකාශය (SA - 30) අනුව තැන්පතු ගිණුම් ශේෂය රු.453,883,095 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව එම ශේෂය රු.463,883,095ක් වූයෙන් රු.10,000,000 වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට පොදු තැන්පත් (පැරණි) ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට රු.10,000,000 ක් වූ නිරවුල් නොකරන ලද හර ශේෂය හේතු වී තිබුණි. වර්ෂ 14 කට අධික කාලයක් ගතවී තිබුණද, මෙම වාර්තාවේ දිනය වනවිටත් නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 වියදම් කළමනාකරණය

---

සමාලෝචිත වර්ෂයට අදාල වූ ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,186ක් වූ අතර ඉන් රු. මිලියන 1,962ක් වර්ෂය තුළ වැයකර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය රු. මිලියන 224 වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10ක් විය.

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

---

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව "බැඳීම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය" ආවරණය වන පරිදි සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බව සඳහන් වේ. එසේ වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල CIGAS වාර්තා පරීක්ෂා කිරීමේදී එසේ සිදුකර නොතිබුණි.

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩිහිටි දීමනා ගෙවීම්

**(i)** තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉවත්වයන හා අලුතින් එකතුවන දීමනාලාභීන් පිළිබඳ තොරතුරු පරීක්ෂා කළ හැකි වන පරිදි වැඩිහිටි දීමනාලාභීන්ගේ අනුමත ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි දීමනාලාභීන්ගේ ගෙවීම් ලේඛනය පරීක්ෂාකිරීමේදී දැනට ප්‍රතිලාභී ලේඛනයේ සිටින ප්‍රතිලාභියකු යම් හේතුවක් මත ප්‍රතිලාභී ලේඛනයෙන් ඉවත් වීමේදී එම පුරප්පාඩු වූ ප්‍රතිලාභියා වෙනුවට පොරොත්තු ලේඛනයෙන් නව ප්‍රතිලාභියෙකු ප්‍රතිලාභ ගෙවීම් ලේඛනයට ඇතුළත් කිරීමේදී එම අලුතින් ඇතුළත් වන ප්‍රතිලාභියා සඳහා නව විෂය අංකයක් ලබා දෙනවා වෙනුවට නව ප්‍රතිලාභියා සඳහා ප්‍රතිලාභ ගෙවීම් ලේඛනයෙන් ඉවත්වන ප්‍රතිලාභින්ට හිමිව තිබූ විෂය අංක ලබාදීමක් සිදුවන බව ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. එවිට ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබාගත් දිනයන්ට අනුකූලව ප්‍රතිලාභී සාමාජික අංක නොපැවතීම නිසා මාසිකව ඉදිරිපත් කරන ගෙවීම් ලේඛනයේ අලුතින් ඇතුළත් වූ ප්‍රතිලාභීන් සහ මෙතෙක් ප්‍රතිලාභ ලබාගත් සමස්ථ ප්‍රතිලාභින් සංඛ්‍යාව හඳුනාගත නොහැකිවේ. එය ප්‍රතිලාභින්ට දීමනා ලබාදීමේදී අක්‍රමිකතාවයන් ඇති වීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

**(ii)** කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් 2022 අගෝස්තු 05 දින ලිපි අංක DIST.CMB/ACC/2022 මගින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කර තිබූ ලිපියේ දක්වා ඇති පරිදි අතිරේක දීමනා ලබා ගැනීමේදී නිත්‍ය දීමනාවන් එකකට වඩා ලබා ගන්නා ප්‍රතිලාභීන්ට අතිරේක දීමනා ලබා ගැනීමේදී එක් නිත්‍ය දීමනාවක් වෙනුවෙන් පමණක් එක් අතිරේක දීමනාවක් ලබාදිය යුතු ලෙස දක්වා තිබුණද, අතිරේක දිමනා ලබා දීමේදී ඒ අනුව කටයුතු කර නොතිබීමෙන් දෙවර බැගින් දීමනාව ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 446ක් වූ අතර එලෙස ලබාගෙන තිබූ දීමනාවල වටිනාකම රු.2,676,000ක් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව සිදුකරන ලද නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව වැය විෂය විස්තරය 160-2-3-124-2509-11 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු.3,786,000 ක ප්‍රතිපාදන යටතේ හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ දිවයින පුරා පැළ තවාන් 650ක් ඇති කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උපයෝජනය කළ යුතු

වුවද, ඉන් රු.2,106,690ක් පමණක් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද, පාදුක්ක, ජයවර්ධනපුර කෝට්ටේ, දෙහිවල, රත්මලාන හා මහරගම වෙනුවෙන් ලබාදී තිබුණු පිළිවෙලින් රු.304,500, රු.152,250, රු.152,250 රු.456,750ක් හා රු.609,000ක් උපයෝජනය කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන ස්වදේශ කටයුතු චක්‍රලේඛය - 10 ඡේදය | ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන්කරගෙන අවම වශයෙන් මාස 4කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු යෙදිය යුතුවේ. නමුත් කරන ලද නියැදි විගණන පරීක්ෂාවන්ට අනුව දෙහිවල, හෝමාගම, තිඹිරිගස්යාය හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) අංක 05/2008 දරන 2008 පෙබරවාරි 6 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනයක් විසින් පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමේදී පුරවැසි ප්‍රඥප්තිය විධිමත්ව සකස් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම, ඇගයීම හා වැඩි දියුණු කිරීම යන පියවරයන් පසු කළ යුතු වේ. දෙහිවල, හෝමාගම හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර තිබුණද උක්ත චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ බවට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

---

(අ) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06ක කාලයක් ඉක්ම වූ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව වටිනාකම රු.96,896ක් වූ චෙක්පත් 08ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි අනුව මාසයක කාලයක් ඉක්මවන හදුනා නොගත් ලැබීම් සම්බන්ධයෙන් බැංකුව විමසා සැසදුම් ප්‍රකාශය තුල අදාල ගැලපීම් සිදුකළ යුතු වුවත් 2022 පෙබරවාරි 25 සිට 2022 නොවැම්බර් දක්වා කාලයට අයත් රු.37,675ක්වූ ලැබීම් අවස්ථා 5ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

(ආ) ක්‍රියාකාරී සැලැස්මෙහි නිවාස 152 ක සුර්ය පැනල සවිකිරීම, තෝරාගත් විරැකියාවෙන් පෙලෙන කණ්ඩායම්වලට ස්වයං රැකියා පුහුණු පාඨමාලා 65ක් පැවැත්වීම, පුද්ගලයින් 1000කට පුහුණුව ලබාදීම, සතිපොළ 10ක් සංවර්ධනය කිරීම හා ක්‍රීඩා උපකරණ 2500ක ප්‍රමාණයක් ලබාදීම වැනි එකදු ක්‍රියාකාරකමක්වත් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි.

(ආ) ගම සමඟ පිළිසඳරක් - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

(i) මෙම ව්‍යාපෘතිය සඳහා 2022 අයවැය ඇස්තමේන්තු මඟින් රු.946,500,000ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.825,194,184ක් සමාලොචිත වර්ෂයේ වියදම් කර තිබුණු අතර රු.121,305,816ක් හෙවත් සියයට 13ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ප්‍රගති වාර්තාව - 2022 හා මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිපාදන හා වියදම අතර පහත සඳහන් නොසැසඳිම් නිරීක්ෂණය විය.

| විස්තරය | ප්‍රතිපාදන | | | වියදම | | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අනුව | ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව | වෙනස | මූල්‍ය ප්‍රකාශන අනුව | ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව | වෙනස |
| ---------- | ---------- | ---------- | --------- | ---------- | ---------- | ---------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 255/1/01/008/2509/068 | 333,500,000 | 334,062,417 | 562,417 | 313,829,030 | 315,009,518 | 1,180,488 |
| 255/1/01/008/2509/069 | 228,500,000 | 210,859,773 | 17,640,227 | 193,227,450 | 192,661,991 | 565,459 |
| 255/1/01/008/2509/071 | 323,000,000 | 268,842,802 | 54,157,198 | 261,002,386 | 247,034,214 | 13,968,145 |
| 255/1/01/008/2509/070 | 61,500,000 | 59,977,715 | 1,522,285 | 57,135,318 | 57,135,318 | - |
| | ---------- | ---------- | ---------- | ---------- | ---------- | ---------- |
| එකතුව | 946,500,000 | 873,742,707 | 72,757,293 | 825,194,184 | 811,841,041 | 13,353,143 |
| | ========= | ========= | ======= | ======== | ======== | ========= |

(iii) ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව වැය විෂය 255-1-1-8-2509-068 යටතේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවලංගු වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.582,000 ක වියදමක් දරා තිබුණි.

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

ග්‍රාමීය ජන සමාජයේ නිෂ්පාදන ආර්ථිකයට ජවයක් ලබා දීම මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රමුඛ අවශ්‍යතාවය ඉටු කිරීමට ගම සමඟ පිළිසඳරක් - 2022 වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම සමඟ පිළිසඳරක් ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් දක්වයි.

(අ) ව්‍යාපෘති අංක 2022/Q/RCC/THI/RUG/LH/003 යටතේ කිරුළ ග්‍රාම නිලධාරී වසමේ රාත්‍රී ආපනශාලාවක් පවත්වාගෙන යන ව්‍යවසායකයකු සඳහා සිය නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට අවශ්‍යවන උපකරන ලබා දීම වෙනුවෙන් රු.400,000ක් අනුමතකර තිබුණි. ඒ අනුව ‘‘පස්දෙනෙකුගෙන් සමන්විත පවුලකට අවශ්‍ය කෑම ප්‍රමාණය එක් පාර්සලයකින්’’ සංකල්පය පෙරදැරි කරගෙන King Rice නමින් අවන්හලක් ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකර තිබූ අතර ව්‍යාපෘති ලිපි ගොනුව අනුව රු.386,825ක් වටිනා භාණ්ඩ ප්‍රතිලාභියා වෙත භාරදී තිබුණද එම භාණ්ඩ භාරදීම සිදුකළ දිනය එහි සඳහන්ව නොතිබුණි. භාණ්ඩ භාරදීමේදී භාණ්ඩය / උපකරණයේ නම හා ප්‍රමාණය පමණක් සඳහන් කර තිබුණද, වැඩි විස්තර දක්වා නොතිබීම මත පසුවිපරම් කිරීමේදී එම භාණ්ඩය/ උපකරණද යන්න තහවුරු කරගත හැකි වන පරිදි ප්‍රමාණාත්මක

තොරතුරු දක්වා නොතිබුණි. මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකළ බවට ලිඛිත තොරතුරු නිරීක්ෂණය නොවුණි.

(ආ) ව්‍යාපෘති අංක 2022 AQ/RCC/THI/RUG/LH/011 යටතේ වනාතමුල්ල ග්‍රාම නිලධාරී වසමේ කුළු බඩු නිෂ්පාදනයේ යෙදීමට අපේක්ෂිත නවක ව්‍යවසායකයකු සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම වෙනුවෙන් රු.500,000ක් අනුමත කර තිබුණි. කුළු බඩු අඹරා පැකට් කර අලෙවි කිරීම සඳහා ප්‍රතිලාභියා වෙත රු.500,000ක් භාණ්ඩ / උපකරණ භාරදී තිබුණද භාණ්ඩ භාරදීම සිදුකළ දිනය හෝ එහි සඳහන් කර නොතිබුණු අතර ප්‍රතිලාභියා සමග ගිවිසුමකටද එළඹී නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය 3Phrase විදුලි සම්බන්ධතාව ලබාගැනීමට නොහැකිවීමෙන් 2023 මාර්තු වන විටත් අරම්භ කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති අංක 2022 Q1/RCC/THI/RUG/LH/017 යටතේ බටහිර කුප්පියාවත්ත ග්‍රාම නිලධාරී වසමේ කොළ කැඳ, පත්තර, රෙදි බෑග් අලෙවියේ නිරත අය අතරින් තෝරාගත් ව්‍යවසායකයන්ගේ අලෙවිය ප්‍රවර්ධනය සඳහා ජංගම කරත්ත ලබා දීම වෙනුවෙන් රු.500,000 අනුමත කර තිබුණි. ඒ අනුව රු.117,000ක් වූ (VAT රහිත මිල) ජංගම කරත්ත 04ක් තැඹිලි වෙළඳාම, බෑග් අලෙවිය, කෙටි ආහාර නිෂ්පාදනය හා සිල්ලර වෙළඳාම සිදු කිරීම සඳහා පුද්ගලයින් 04 දෙනෙකු සඳහා ලබා දී තිබුණි. ලිපි ගොනුව අනුව ලබාදුන් භාණ්ඩවල වර්තමාන තත්ත්වය හොඳ තත්ත්වයේ පවතී යනුවෙන් පසු විපරම් ආකෘතියේ සඳහන් කර තිබුණද විගණනය විසින් අදාල ප්‍රතිලාභින්ගේ දුරකතනයෙන් කරන ලද විමසීම්වලදී ජංගම කරත්ත භාවිතාකර අලෙවි කටයුතු කිරීම සඳහා අවසර ලබාගැනීමේ ගැටලු හේතුවෙන් අලෙවි කටයුතු සඳහා එම ජංගම කරත්ත යොදා ගැනීමට නොහැකිව පවතින බව සඳහන් කරන ලදී. එම ගැටළු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. එසේම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය හා ඇතිවි තිබූ ගැටළු පිළිබඳව පසු විපරම් වාර්තාවේ කිසිදු සඳහනක් කර නොතිබුණි.

### 3.3. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු. 286,662,533 ක වියදමින් නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අංක අමප/16/0433/721/004 හා 2016 මාර්තු 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබූ අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබුණි. එසේම උපදේශක ආයතනය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

විසින් සකස් කළ ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් 2016 අගෝස්තු 12 දින ජාතික තරගකාරී ලංසු කැඳවීමේ තීරණය කර තිබුණ අතර 2016 අගෝස්තු 19 දින පල කළ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම අනුව ලංසුකරුවන් 08 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඉන් ලංසුකරුවන් තිදෙනකුගෙන් ලැබුණු ලංසු ප්‍රතික්ෂේප වී තිබුණි. ඉතිරි ලංසුකරුවන් 05ගේ ලංසු ඇගයීම් කර, අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු Trio Construction (pvt) Ltd ආයතනය තෝරාගෙන තිබුණි. එම ආයතනය ඉදිරිපත් කර තිබූ රු.152,753,294ක්වූ ලංසු වටිනාකම මෙම ගොඩනැගිල්ල සඳහා වූ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු වී තිබූ බැවින් එකී සමාගම සමග සාකච්ඡාකර පසුව එම ආයතනය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්දේසි දෙකකට යටත්ව අනුමැතිය ලබාදී තිබුණි. එම කොන්දේසි ලෙස මූලික කොන්ත්‍රාත් මුදලින් සියයට 10ක් දක්වා කාර්යය සාධන සුරක්ෂණය ඉහළ දැමීමත් සහ කොන්ත්‍රාත් කාලය තුළ ඉතා සමීපව ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සිදු කිරීම විය. කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු කිරීම පිළිබඳ පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

**(i)** 2017 ජනවාරි 06 දින වැඩ ආරම්භකර දින 350ක කාලයක් තුල කොන්ත්‍රාත්තුව නිම කළ යුතු නමුදු 2018 පෙබරවාරි 28 දක්වා කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු 2018 මාර්තු සිට කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබීම මත 2018 ජූලි 31 දින එම කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කාර සමාගම වන Trio Construction (pvt) Ltd ආයතනයට එරෙහිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලද පරිදි කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් කාර්යයන් පිළිබඳව සමීපව අධීක්ෂණයක් කර නොතිබුණි

**(ii)** කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කරන අවස්ථාව වන විට සමස්ත කොන්ත්‍රාත්තුවේ කාර්යයන්වලින් සියයට 20ක වැඩ ප්‍රමාණයක් පමණක් ඉටුකර තිබුණු අතර ඒ සඳහා ගතකළ කාලය දින 430ක් විය. ඒ අනුව දින 70ක දී සිදු කළ යුතු වූ වැඩ කොටස් වෙනුවෙන් දින 430ක් වැයකර තිබුනෙන් දින 360ක ප්‍රමාද කාලයක් සිදුව තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු ගණනය කර අයකර ගැනීම සිදු කර නොතිබුණි.

**(iii)** ඒ වගේම කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වන විට කොන්ත්‍රාත් වටිනාකමින් එනම් රු.152,753,293න් කළ වැඩ ප්‍රමාණය රු.43,071,625ක් වීමෙන්

එවකට වටිනාකම රු.109,681,668 ක වැඩ ප්‍රමාණයක් තව දුරටත් කිරීමට තිබුණි. නමුත් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වන විට උක්ත කොන්ත්‍රාත්කරු වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (VATරහිත) රු.30,550,658ක්ද ඇතුළුව රු.62,173,287ක් ගෙවීම් කර තිබුණි.

(ආ). ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමන ලද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම ආසිරි කන්ස්ට්‍රක්ෂන් සමාගමට 2021 අප්‍රේල් 21 දින සිට 2022 අප්‍රේල් 21 දක්වා දින 365ක කාලයක් හා වටිනාකම රු.147,418,009ක්වූ කොන්ත්‍රාත්තු ලබාදී තිබුණි. 2022 නොවැම්බර් 11 දින වන විට කොන්ත්‍රාත් කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කර තිබුණු අතර එම කොන්ත්‍රාත්කරු සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.22,053,602ක් ද ඇතුලුව රු.113,001,510ක් ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) 2018 මාර්තු මස සිට Trio Construction (Pvt) Ltd විසින් අදාල කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණු අතර නැවත එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආසිරි කන්ස්ට්‍රක්ෂන් සමාගම විසින් 2021 අප්‍රේල් 21 දින ආරම්භ කර තිබීම මත වසර තුනක කාලයක් ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.

(ඈ). මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ආරම්භකර මේ දක්වා වසර 6ක කාලයක් ඉකුත්ව තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් හට ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 120කට අධික මුදලක් ගෙවීම් සිදුකර තිබුණු නමුත් මේ දක්වා ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්ත්වයට ඉදිකිරීම් කටයුතු අවසන්ව නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් 2017 සිට මේ දක්වා වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 180, රු.මිලියන 188 හා රු.මිලියන 57.5ක් වශයෙන් උපයෝජනය කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**---**

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පානීය ජලය බෙදාහැරීමේ කටයුතු සඳහා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති අංක WPLO - 2896 දරන ජල බවුසරය නඩත්තු කටයුතු පමණක් සිදු කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රදවා තබාගෙන තිබූ අතර 2020 වර්ෂයේ සිට ජලය බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණෙන් නිෂ්කාර්ය වත්කමක් බවට පත්ව තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අය කිරීමට අදාලව 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 දරන ස්වදේශ කටයුතු චක්‍රලේඛයේ 4 ඡේදය අනුව මූල්‍ය වගකීම් දරන නිලධාරීන් විසින් අදාල ඇප මුදල රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමයේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීම් ගිණුම ආරම්භ කොට මාස 3ක් ඇතුළත සම්පූර්ණ ඇප මුදල තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය. එසේම 5 ඡේදය ප්‍රකාරව එම ඉතිරි කිරීමේ පාස් පොත මූල්‍ය අංශය භාරයේ තබා ගැනීමටත්, නිලධාරියා ස්ථාන මාරුවී යන විට අදාල ආයතන ප්‍රධානියා වෙත පාස් පොත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134 (2) DMA/1-2019අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | මු.රෙ. අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 7.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබේ. | අනුකූල වේ. | | |
| 7.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 7.4 | මු.රෙ. 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 7.5 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම. | අනුකූල වේ. | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර කිරීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ. | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අප හරණය කර තිබීම | අනුකූල නොවේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1)ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පේ්‍රෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අගි්‍රම. එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අගි්‍රම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අගි්‍රම ගිණුමේ ශේෂය. භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබුනු ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුව ආදායමට බැර කර තිබීම | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/ 2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපරේතමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියේ හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතන පිළිබඳ මහජනතාවයේ ප්‍රශංසා චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරක දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/ 2018 1 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛය 2,3 ඡේදය පරිදි පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20.** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන **ඡේද** මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම් | අනුකූල වේ. | | |

# ස්තූතියි...

අභියෝගාත්මක වසරක දී සපුරා ගන්නා ලද

සාධනීය ඉලක්ක පෙළගස්වමින්

මෙම වාර්තාව සැකසීමට අවශ්‍ය දත්ත හා තොරතුරු

ලබා දී දායකත්වය දැක් වූ

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ

අංශ ප්‍රධානීන් ඇතුලු සහය ලබා දුන් සියලුම දෙනාට

ස්තූතියි...

## 4.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

- විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ කෙටුම්පත මේ සමඟ අමුණා ඉදිරිපත් කෙරේ.
- එම සම්පිණ්ඩන වාර්තාවේ අවසන් වාර්තාව කාර්ය සාධන වාර්තාවේ අවසානයට අමුණා ඇත.

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. WPCG/CL/A/DSC/2/22/29 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යටෝක්ත වාර්තාව සහ විගණනයේදී පරීක්ෂා කර සහතික කරන ලද භාෂාත්‍රයෙන් යුත් මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ආර්. ජී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්. ජී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් - 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2. ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. WPCG/CL/A/DSC/2/22/29 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දිනකදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2021 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.8,777,578,248ක් වූ මූල්‍ය නොවන වත්කම් වටිනාකමක් පැවති තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ACA-06) 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ ශේෂය ඉහත කී වටිනාකමට වෙනස් ශේෂයක් විය. ආරම්භක ශේෂය ලෙස රු.4,452,639,832 ක වටිනාකමක් සටහන් කර තිබීමෙන් රු.4,324,938,416ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | 2021/12/31 දිනට ශේෂය | 2022/01/01 දිනට ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කෙරීගෙන යන වැඩ | 5,807,786,770 | 1,482,923,047 | (4,324,863,723) |
| වෙනත් යන්ත්‍ර සහ උපකරණ | 412,484,553 | 412,409,861 | (74,692) |
| | | | (4,324,938,415) |

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව විගණනයට ඉදිරිපත් කළ CIGAS මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්ථාවන්හි ආරම්භක ශේෂවල එකතුව රු.4,509,205,410ක් වුවද ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.8,777,578,248ක් වූයෙන් ආරම්භක ශේෂයන්හි පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | 2021/12/31 දින ශේෂය | 2022/01/01 දින ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 6,572,479,126 | 2,247,615,402 | (4,324,863,724) |
| හෝමාගම | 113,047,281 | 162,642,858 | 49,595,577 |
| රත්මලාන | 123,818,664 | 130,788,664 | 6,970,000 |
| ජයවර්ධනපුර කෝට්ටේ | 212,115,192 | 212,175,500 | 60,308 |
| කොළොන්නාව | 21,871,578 | 21,736,578 | (135,000) |
| | | | (4,268,372,839) |

(ඇ) කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දේපල පිරියත හා උපකරණ පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට කෙරීගෙන යන වැඩ රු.5,807,786,770ක් සහ එයට සමාලෝචිත වර්ෂය තුල එකතු කිරීම් රු.61,094,600ක් හා ඉවත්කිරීම් රු.4,385,958,383ක් ගලපා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අංක HA/F/DA/48/AUDITGQ/2022 හා 2022 ඔක්තෝබර් 10 දිනැති ලිපියෙන් නිලමැදුර පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල සහ එය පිහිටා ඇති ඉඩම ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරාදීමට අවශ්‍ය කටයුතු අවසන් කරන මෙන් දන්වා තිබුණු අතර ඒ අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් යටතේ 2014 සිට 2021 දක්වා වැය විෂය විස්තරය 255-01-01-00-2104 ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර තිබුණු නිලමැදුර පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ලට අදාල වටිනාකම වන රු.4,385,958,383ක් 2022 නොවැම්බර් මස මෙම කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කළ බව 2022 නොවැම්බර් 28 දින ප්‍රධාන ගණකාධිකාරී විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා තිබුණි. තවද මෙම කාර්යාල ගොඩනැගිල්ලට අදාල වටිනාකම ගිණුම් පොත්පත්වලින් ඉවත් කළද, ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තවදුරටත් මෙම කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබුණි.

(ii) එසේ වුවත් 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණවලට අදාලව ඉදිරිපත් කළ ACA -6 වාර්තාවෙහි මෙම පැවරීම සිදුකළ පසුවද කෙරීගෙන යන වැඩ ලෙස රු.1,482,923,047ක් දක්වා තිබුණද, මෙම කෙරීගෙන යන වැඩ අදාල වූ ගොඩනැගිලි ඉදිනිරිම පිළිබද විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පරීක්ෂා කිරීමේදි අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතුවු තක්සේරු කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති අවස්ථා මෙන්ම තක්සේරු කර නොමැති නිසා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති අවස්ථාද නිරීක්ෂණය විය. පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලට අදාල තක්සේරු කරන ලද නිල සෙවන කාර්යාල 07 ක වටිනාකම රු.12,467,993ක්ද තක්සේරු කර නොමැති ගොඩනැගිලි 03ක්ද නිරීක්ෂණය විය.

**1.6.2 මූල්‍ය වත්කම්**

(අ). රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.196,040,972 ක් හා භාණ්ඩාගාර පොත් අනුව රු.197,181,641 ක් ලෙස සටහන්ව තිබීමෙන් ශේෂ අතර රු.1,150,694ක් වූ නොසැසඳුණු හර ශේෂයක් වාර්තා වී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේ සිට පැවත එන මෙම වෙනසට වසර 09 කට වැඩි කාලයක් ගතවී තිබුණද මේ දක්වා නිවැරදි කර නොතිබුණි.

(ආ). සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැනට සේවයෙහි නොමැති සේවකයන් 39 දෙනෙකුට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු.5,156,396 ක් පැවතුණි. ඉන් රු.910,886 කට අදාල ණය ශේෂ 13ක් වර්ෂ 5 ක් හෝ ඊට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි.

(ඇ). අංක 118 දරන අයවැය චක්‍රලේඛ විධිවිධාන අනුව නිලධාරියෙක් ස්ථාන මාරු වී ගොස් මාස තුනක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලාගත යුතු වුවද කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට ස්ථාන මාරු වී ගිය නිලධාරියකුට අදාලව අයකර ගත් ණය වාරික දෙකක් රු.6,480ක් වැරදියට ගිණුම්ගත කිරීම හා තව නිලධාරියකුගේ ණය ශේෂ පවරාගැනීමේදී

රු.7,950ක් වැඩිපුර බැර කිරීමෙන් ඇති වුණු රු.14,430ක ආපදා ණය ශේෂ දෙකක් මාස 3ත් 12ත් අතර කාල පරාසයක් ගතවී තිබුණද නිරවුල් කර නොතිබුණි.

(ඇ). අංක 118 දරන අයවැය වක්‍රලේඛ විධිවිධාන අනුව නිලධාරියෙක් ස්ථාන මාරු වී ගොස් මාස තුනක් ගතවීමෙන් පසු සංස්ථාපිත ආයතන අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලාගත යුතු වුවද කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයට ස්ථාන මාරු වී ගිය ආර්. රාජසුරේෂ් (කා.සේ.නි) ආපදා ණය රු.156,977ක ශේෂය මාස 3ත් 12ත් අතර කාල පරාසයක පැවතුණද නිරවුල් කර නොතිබුණි. කෙසේ වුවද, දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කළ පිළිතුරු ලිපිය අනුව ණය මුදල මාසික වාරික වශයෙන් අයකර ගනු ලබන බව සඳහන් කර ඇත.

### 1.6.3 නැන්පතු ගිණුම් ශේෂ

භාණ්ඩාගාර ප්‍රකාශය (SA - 30) අනුව නැන්පතු ගිණුම් ශේෂය රු.453,883,095 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව එම ශේෂය රු.463,883,095ක් වූයෙන් රු.10,000,000 වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට පොදු නැන්පත් (පැරණි) ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට රු.10,000,000 ක් වූ නිරවුල් නොකරන ලද හර ශේෂය හේතු වී තිබුණි. වර්ෂ 14 කට අධික කාලයක් ගතවී තිබුණද, මෙම වාර්තාවේ දිනය වනවිටත් නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයට අදාල වූ ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,186ක් වූ අතර ඉන් රු. මිලියන 1,962ක් වර්ෂය තුළ වැයකර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය රු. මිලියන 224 වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10ක් විය.

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව "බැඳීම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය" ආවරණය වන පරිදි සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බව සඳහන් වේ. එසේ වුවත්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල CIGAS වාර්තා පරීක්ෂා කිරීමේදී එසේ සිදුකර නොතිබුණි.

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩිහිටි දිමනා ගෙවීම්

(i) නිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉවත්වයන හා අලුතින් එකතුවන දිමනාලාභීන් පිළිබඳ තොරතුරු පරීක්ෂා කළ හැකි වන පරිදි වැඩිහිටි දිමනාලාභීන්ගේ අනුමත ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි දිමනාලාභීන්ගේ ගෙවීම් ලේඛනය පරීක්ෂාකිරීමේදී දැනට ප්‍රතිලාභී ලේඛනයේ සිටින ප්‍රතිලාභියකු යම් හේතුවක් මත ප්‍රතිලාභී ලේඛනයෙන් ඉවත් වීමේදී එම පුරප්පාඩු වූ ප්‍රතිලාභියා වෙනුවට පොරොත්තු ලේඛනයෙන් නව ප්‍රතිලාභියෙකු ප්‍රතිලාභ ගෙවීම් ලේඛනයට ඇතුළත් කිරීමේදී එම අලුතින් ඇතුළත් වන ප්‍රතිලාභියා සඳහා නව විෂය අංකයක් ලබා දෙනවා වෙනුවට නව ප්‍රතිලාභියා සඳහා ප්‍රතිලාභ ගෙවීම් ලේඛනයෙන් ඉවත්වන ප්‍රතිලාභින්ට හිමිව තිබූ විෂය අංක ලබාදීමක් සිදුවන බව ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. එවිට ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබාගත් දිනයන්ට අනුකූලව ප්‍රතිලාභී සාමාජික අංක නොපැවතීම නිසා මාසිකව ඉදිරිපත් කරන ගෙවීම් ලේඛනයේ අලුතින් ඇතුළත් වූ ප්‍රතිලාභීන් සහ මෙතෙක් ප්‍රතිලාභ ලබාගත් සමස්ථ ප්‍රතිලාභින් සංඛ්‍යාව හඳුනාගත නොහැකිවේ. එය ප්‍රතිලාභින්ට දීමනා ලබාදීමේදී අක්‍රමිකතාවයන් ඇති වීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

(ii) කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් 2022 අගෝස්තු 05 දින ලිපි අංක DIST.CMB/ACC/2022 මගින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කර තිබූ ලිපියේ දක්වා ඇති පරිදි අතිරේක දීමනා ලබා ගැනීමේදී නිත්‍ය දීමනාවන් එකකට වඩා ලබා ගන්නා ප්‍රතිලාභීන්ට අතිරේක දීමනා ලබා ගැනීමේදී එක් නිත්‍ය දීමනාවක් වෙනුවෙන් පමණක් එක් අතිරේක දීමනාවක් ලබාදිය යුතු ලෙස දක්වා තිබුණද, අතිරේක දීමනා ලබා දීමේදි ඒ අනුව කටයුතු කර නොතිබීමෙන් දෙවර බැගින් දීමනාව ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 426ක් වූ අතර එලෙස ලබාගෙන තිබූ දීමනාවල වටිනාකම

රු.2,676,000ක් නිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව සිදුකරන ලද නියැදි විගණනයේදි නිරීක්ෂණය විය. කෙසේ වුවද ඉන් රු.2,152,000ක් මේවන විට අයකරගෙන ඇති බව දිස්ත්‍රික් ලේකම් විසින් එවන ලද පිළිතුරු ලිපියේ සඳහන් කර තිබුණි.

(ආ) ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව වැය විෂය විස්තරය 160-2-3-124-2509-11 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු.3,786,000 ක ප්‍රතිපාදන යටතේ හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ දිවයින පුරා පැළ තවාන් 650ක් ඇති කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උපයෝජනය කළ යුතු වුවද, ඉන් රු.2,106,690ක් පමණක් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද, පාදුක්ක, ජයවර්ධනපුර කෝට්ටේ, දෙහිවල, රත්මලාන හා මහරගම වෙනුවෙන් ලබාදී තිබුණු පිළිවෙලින් රු.304,500, රු.152,250, රු.152,250 රු.456,750ක් හා රු.609,000ක් උපයෝජනය කර නොතිබුණි.

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන ස්වදේශ කටයුතු චක්‍රලේඛය - 10 ඡේදය | ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන්කරගෙන අවම වශයෙන් මාස 4කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු යෙදිය යුතුවේ. නමුත් කරන ලද නියැදි විගණන පරීක්ෂාවන්ට අනුව දෙහිවල, හෝමාගම, නිඹිරිගස්යාය හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) අංක 05/2008 දරන 2008 පෙබරවාරි 6 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනයක් විසින් පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමේදී පුරවැසි ප්‍රඥප්තිය විධිමත්ව සකස් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම, ඇගයීම හා වැඩි දියුණු කිරීම යන පියවරයන් පසු කළ යුතු වේ. දෙහිවල, හෝමාගම හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුරවැසි |

ප්‍රඥප්තියක් සකස් කර තිබුණද උක්ත වක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ බවට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

මුදල් රෙගුලාසි අනුව මාසයක කාලයක් ඉක්මවන හදුනා නොගත් ලැබීම් සම්බන්ධයෙන් බැංකුව විමසා සැසඳුම් ප්‍රකාශය තුල අදාල ගැලපීම් සිදුකළ යුතු වුවත් 2022 පෙබරවාරි 25 සිට 2022 නොවැම්බර් දක්වා කාලයට අයත් රු.37,675ක්වූ ලැබීම් අවස්ථා 5ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. කෙසේ වුවත් දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කළ පිළිතුරු ලිපිය අනුව ඉන් රු.27,675ක් නිරවුල් කර ඇති බවත් ඉතිරි රු.10,000ක ශේෂය හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් බවත්, එම ශේෂ හදුනා ගැනීම් සිදු කර නිවැරදි කිරීමට සටහන් කර ගත් බව සඳහන් කර තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

(අ) ක්‍රියාකාරී සැලැස්මේහි නිවාස 152 ක සුර්ය පැනල සවිකිරීම, තෝරාගත් විරැකියාවෙන් පෙලෙන කණ්ඩායම්වලට ස්වයං රැකියා පුහුණු පාඨමාලා 65ක් පැවැත්වීම, පුද්ගලයින් 1000කට පුහුණුව ලබාදීම, සනිපොළ 10ක් සංවර්ධනය කිරීම හා ක්‍රීඩා උපකරණ 2500ක ප්‍රමාණයක් ලබාදීම වැනි එකඳු ක්‍රියාකාරකමක්වත් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි.

(ආ) ගම සමඟ පිළිසඳරක් - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

(i) මෙම ව්‍යාපෘතිය සඳහා 2022 අයවැය ඇස්තමේන්තු මඟින් රු.946,500,000ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.825,194,184ක් සමාලෝචිත වර්ෂයේ වියදම් කර තිබුණු අතර රු.121,305,816ක් හෙවත් සියයට 13ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ප්‍රගති වාර්තාව - 2022 හා මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිපාදන හා වියදම අතර පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විස්තරය | ප්‍රතිපාදන | | | වියදම් | | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අනුව | ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව | වෙනස | මූල්‍ය ප්‍රකාශන අනුව | ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව | වෙනස |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 255/1/01/008/2509/068 | 333,500,000 | 334,062,417 | 562,417 | 313,829,030 | 315,009,518 | 1,180,488 |
| 255/1/01/008/2509/069 | 228,500,000 | 210,859,773 | 17,640,227 | 193,227,450 | 192,661,991 | 565,459 |
| 255/1/01/008/2509/071 | 323,000,000 | 268,842,802 | 54,157,198 | 261,002,386 | 247,034,214 | 13,968,145 |
| 255/1/01/008/2509/070 | 61,500,000 | 59,977,715 | 1,522,285 | 57,135,318 | 57,135,318 | - |
| එකතුව | 946,500,000 | 873,742,707 | 72,757,293 | 825,194,184 | 811,841,041 | 13,353,143 |

(iii) ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව වැය විෂය 255-1-1-8-2509-068 යටතේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවලංගු වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.582,000 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවත් දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කළ පිළිතුරු ලිපිය අනුව අදාල ආයතනය විසින් භාණ්ඩ ලබා නොදුන් බැවින් එම භාණ්ඩ ලබාගැනීම සඳහා එම ආයතනය වෙත ලියන ලද චෙක්පත රජයේ අදායමට බැර කිරීමට කටයුතු කළ බව සඳහන් කර තිබුණි.

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

ග්‍රාමීය ජන සමාජයේ නිෂ්පාදන ආර්ථිකයට ජවයක් ලබා දීම මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රමුඛ අවශ්‍යතාවය ඉටු කිරීමට ගම සමඟ පිළිසඳරක් - 2022 වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව නිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම සමඟ පිළිසඳරක් ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් දක්වයි.

(අ) ව්‍යාපෘති අංක 2022/Q/RCC/THI/RUG/LH/003 යටතේ කිරුළ ග්‍රාම නිලධාරී වසමේ රාත්‍රී ආපනශාලාවක් පවත්වාගෙන යන ව්‍යවසායකයකු සඳහා සිය නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට අවශ්‍යවන උපකරන ලබා දීම වෙනුවෙන් රු.400,000ක් අනුමතකර තිබුණි. ඒ අනුව "පස්දෙනෙකුගෙන් සමන්විත පවුලකට අවශ්‍ය කෑම ප්‍රමාණය එක් පාර්සලයකින්" සංකල්පය පෙරදැරි කරගෙන King Rice නමින් අවන්හලක් ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකර තිබූ අතර ව්‍යාපෘති ලිපි ගොනුව අනුව රු.386,825ක් වටිනා භාණ්ඩ

ප්‍රතිලාභියා වෙත භාරදී තිබුණද එම භාණ්ඩ භාරදීම සිදුකළ දිනය එහි සඳහන්ව නොතිබුණි. භාණ්ඩ භාරදීමේදී භාණ්ඩය / උපකරණයේ නම හා ප්‍රමාණය පමණක් සඳහන් කර තිබුණද, වැඩි විස්තර දක්වා නොතිබීම මත පසුවිපරම් කිරීමේදී එම භාණ්ඩය/ උපකරණද යන්න තහවුරු කරගත හැකි වන පරිදි ප්‍රමාණාත්මක තොරතුරු දක්වා නොතිබුණි. මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකළ බවට ලිඛිත තොරතුරු නිරීක්ෂණය නොවුණි.

(ආ) ව්‍යාපෘති අංක 2022 AQ/RCC/THI/RUG/LH/011 යටතේ වනාතමුල්ල ග්‍රාම නිලධාරී වසමේ කුළු බඩු නිෂ්පාදනයේ යෙදීමට අපේක්ෂිත නවක ව්‍යවසායකයකු සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම වෙනුවෙන් රු.500,000ක් අනුමත කර තිබුණි. කුළු බඩු අඹරා පැකට් කර අලෙවි කිරීම සඳහා ප්‍රතිලාභියා වෙත රු.500,000ක් භාණ්ඩ / උපකරණ භාරදී තිබුණද භාණ්ඩ භාරදීම සිදුකළ දිනය හෝ එහි සඳහන් කර නොතිබුණු අතර ප්‍රතිලාභියා සමග ගිවිසුමකටද එළඹී නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය 3Phrase විදුලි සම්බන්ධතාව ලබාගැනීමට නොහැකිවීමෙන් 2023 මාර්තු වන විටත් අරම්භ කර නොතිබුණි. කෙසේවුවත් ප්‍රතිලාභියා සමග ඇතිකර ගත් ගිවිසුම අතපසු වීමක් මත වෙනත් ගොනුවකට ඇතුලත් කර ඇති බවත් එය නිවැරදි ගොනුවට ඇතුලත් කර නිවැරදි කළ බවත් දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කළ ලිපියෙහි සඳහන් කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති අංක 2022 Q1/RCC/THI/RUG/LH/017 යටතේ බටහිර කුප්පියාවත්ත ග්‍රාම නිලධාරී වසමේ කොළ කැඳ, පත්තර, රෙදි බෑග් අලෙවිමයේ නිරත අය අතරින් තෝරාගත් ව්‍යවසායකයන්ගේ අලෙවිය ප්‍රවර්ධනය සඳහා ජංගම කරත්ත ලබා දීම වෙනුවෙන් රු.500,000 අනුමත කර තිබුණි. ඒ අනුව රු.117,000ක් වූ (VAT රහිත මිල) ජංගම කරත්ත 04ක් තැඹිලි වෙළඳාම, බෑග් අලෙවිය, කෙටි ආහාර නිෂ්පාදනය හා සිල්ලර වෙළඳාම සිදු කිරීම සඳහා පුද්ගලයින් 04 දෙනෙකු සඳහා ලබා දී තිබුණි. ලිපි ගොනුව අනුව ලබාදුන් භාණ්ඩවල වර්තමාන තත්ත්වය හොඳ තත්ත්වයේ පවතී යනුවෙන් පසු විපරම් ආකෘතියේ සඳහන් කර තිබුණද විගණනය විසින් අදාල ප්‍රතිලාභීන්ගේ දුරකතනයෙන් කරන ලද විමසීම්වලදී ජංගම කරත්ත භාවිතාකර අලෙවි කටයුතු කිරීම සඳහා අවසර ලබාගැනීමේ ගැටලු හේතුවෙන් අලෙවි කටයුතු සඳහා එම ජංගම කරත්ත යොදා ගැනීමට නොහැකිව පවතින බව සඳහන් කරන ලදී. එම ගැටළු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. එසේම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය හා ඇතිවී තිබූ ගැටළු පිළිබඳව පසු විපරම් වාර්තාවේ කිසිදු සඳහනක් කර නොතිබුණි.

**3.3. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(අ) හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු. 286,662,533 ක වියදමින් නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අංක අමප/16/0433/721/004 හා 2016 මාර්තු 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබූ අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබුණි. එසේම උපදේශක ආයතනය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සකස් කළ ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් 2016 අගෝස්තු 12 දින ජාතික තරගකාරී ලංසු කැඳවීමේ තීරණය කර තිබුණ අතර 2016 අගෝස්තු 19 දින පල කළ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම අනුව ලංසුකරුවන් 08 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඉන් ලංසුකරුවන් තිදෙනකුගෙන් ලැබුණු ලංසු ප්‍රතික්ෂේප වී තිබුණි. ඉතිරි ලංසුකරුවන් 05ගේ ලංසු ඇගයීම් කර, අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු Trio Construction (pvt) Ltd ආයතනය තෝරාගෙන තිබුණි. එම ආයතනය ඉදිරිපත් කර තිබූ රු.152,753,294ක්වූ ලංසු වටිනාකම මෙම ගොඩනැගිල්ල සඳහා වූ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු වී තිබූ බැවින් එකී සමාගම සමග සාකච්ඡාකර පසුව එම ආයතනය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්දේසි දෙකකට යටත්ව අනුමැතිය ලබාදී තිබුණි. එම කොන්දේසි ලෙස මූලික කොන්ත්‍රාත් මුදලින් සියයට 10ක් දක්වා කාර්යය සාධන සුරක්ෂණය ඉහළ දැමීමත් සහ කොන්ත්‍රාත් කාලය තුළ ඉතා සමීපව ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සිදු කිරීම විය. කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු කිරීම පිළිබඳ පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) 2017 ජනවාරි 06 දින වැඩ ආරම්භකර දින 350ක කාලයක් තුල කොන්ත්‍රාත්තුව නිම කළ යුතු නමුදු 2018 පෙබරවාරි 28 දක්වා කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු 2018 මාර්තු සිට කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබීම මත 2018 ජූලි 31 දින එම කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කාර සමාගම වන Trio Construction (pvt) Ltd ආයතනයට එරෙහිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලද පරිදි කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් කාර්යයන් පිළිබඳව සමීපව අධීක්ෂණයක් කර නොතිබුණි

(ii) කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කරන අවස්ථාව වන විට සමස්ත කොන්ත්‍රාත්තුවේ කාර්යයන්වලින් සියයට 20ක වැඩ ප්‍රමාණයක් පමණක් ඉටුකර තිබුණු අතර ඒ සඳහා ගතකළ කාලය දින 430ක් විය. ඒ අනුව දින 70ක දී සිදු කළ යුතු වූ වැඩ කොටස් වෙනුවෙන් දින 430ක් වැයකර තිබුනෙන් දින 360ක ප්‍රමාද කාලයක් සිදුව තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු ගණනය කර අයකර ගැනීම සිදු කර නොතිබුණි.

(iii) ඒ වගේම කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වන විට කොන්ත්‍රාත් වටිනාකමින් එනම් රු.152,753,293න් කළ වැඩ ප්‍රමාණය රු.43,071,625ක් වීමෙන් එවකට වටිනාකම රු.109,681,668 ක වැඩ ප්‍රමාණයක් තව දුරටත් කිරීමට තිබුණි. නමුත් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වන විට උක්ත කොන්ත්‍රාත්කරු වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (VATරහිත) රු.30,550,658ක්ද ඇතුළුව රු.62,173,287ක් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතියට අදාලව අත්තිකාරම් බැදුම්කරයෙන් රු.16,482,206ක් පියවා ගැනීමට කටයුතු කළ බව දිස්ත්‍රික් ලේකම් විසින් එවන ලද පිළිතුරු ලිපියෙහි සඳහන් කර තිබුණි.

(ආ). ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමන ලද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම ආසිරි කන්ස්ට්‍රක්ෂන් සමාගමට 2021 අප්‍රේල් 21 දින සිට 2022 අප්‍රේල් 21 දක්වා දින 365ක කාලයක් හා වටිනාකම රු.147,418,009ක්වූ කොන්ත්‍රාත්තු ලබාදී තිබුණි. 2022 නොවැම්බර් 11 දින වන විට කොන්ත්‍රාත් කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කර තිබුණු අතර එම කොන්ත්‍රාත්කරු සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.22,053,602ක් ද ඇතුලුව රු.113,001,510ක් ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) 2018 මාර්තු මස සිට Trio Construction (Pvt) Ltd විසින් අදාල කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණු අතර නැවත එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආසිරි කන්ස්ට්‍රක්ෂන් සමාගම විසින් 2021 අප්‍රේල් 21 දින ආරම්භ කර තිබීම මත වසර තුනක කාලයක් ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.

(ඈ). මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ආරම්භකර මේ දක්වා වසර 6ක කාලයක් ඉකුත්ව තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් හට ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 120කට අධික මුදලක් ගෙවීම් සිදුකර තිබුණු නමුත් මේ දක්වා

ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්ත්වයට ඉදිකිරීම් කටයුතු අවසන්ව නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් 2017 සිට මේ දක්වා වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 180, රු.මිලියන 188 හා රු.මිලියන 57.5ක් වශයෙන් උපයෝජනය කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පානීය ජලය බෙදාහැරීමේ කටයුතු සඳහා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති අංක WPLO - 2896 දරන ජල බවුසරය නඩත්තු කටයුතු පමණක් සිදු කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රදවා තබාගෙන තිබූ අතර 2020 වර්ෂයේ සිට ජලය බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණෙන් නිෂ්කාර්ය වත්කමක් බවට පත්ව තිබුණි.

**3.5 පාඩු හා හානි**

(අ) 2022 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණද මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණෙන් එම හානි අයකර ගැනීම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණ අතර ගිනි ගැනීමෙන් සිදු වූ පාඩුවේ වටිනාකම රු.92,606,688 ක් විය

(ආ) 2022 මැයි 09 වන දින මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගේට්ටුවට පහරදී සවිකර තිබූ CCTV 4කට පහරදී අලාභ සිදුකිරීම හා එක් කැමරාවක් අස්ථානගතවීමට අදාලව රු.106,912ක් 2022 අගෝස්තු 23 දින පොතෙන් කපා හැරීමට අනුමැතිය ලබාදී තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ගැලපීමක් සිදුකර නොතිබුණි.

**3.6 කළමනාකරණ දුර්වලතා**

(අ) ගණනය කිරීමේ හා පරිවර්තනය කිරීමේ දෝෂ, විශ්‍රාම වැටුප් දෙවරක් ගෙවීම, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව නහවුරු කර ගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම

වැටුප් ගෙවීම, හමුදා විශ්‍රාම වැටුප් සඳහා දෙවරක් ජීවන වියදම් දීමනා ගෙවීම යනාදී විවිධ හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 කට අදාළ බල ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන්ට අවිධිමත් ලෙස විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාමිකයන් 210 දෙනෙකුට එලෙස වැඩියෙන් ගෙවීම් කර තිබූ විශ්‍රාම වැටුප් වටිනාකම රු.19,176,950 ක් වූ අතර එම මුදලින් රු.16,506,081 ක් වර්ෂ 05 කට අඩු කාලයක්ද, රු.2,663,156 ක් වර්ෂ 5-10 ත් අතර කාලයක් හා වර්ෂ 10 වැඩි රු.7,713ක්ද අයවිය යුතුව පැවතුණි.

(ආ) කොළඹ, දෙහිවල, කොලොන්නාව, සහ කැස්බෑව යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීම සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2016 ජූනි 21 දිනැති අංක CO/PDK/2010/679දරන අනුරේඛණය සකස් කර ඇති පාදුක්ක ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ මිනිමරු දොළ රක්ෂිතයේ, රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 228 අනුව දොළ රක්ෂිතය වෙනමද, පුද්ගලයන් පදිංචි හා භුක්ති විඳින කොටස් වෙනමද, දැක්වෙන අනුරේඛණයන් සැකසීම සඳහා 2016/26 මැනුම් ඉල්ලීම මිනුම් අධිකාරී (කොළඹ) වෙත යොමු කර තිබුණි. නමුත් අදාල මිනුම් ඉල්ලීම සඳහා 2019 මාර්තු 23, 2020 මාර්තු 13 හා 2020 දෙසැම්බර් 02 දින සිහි කැඳවීම් ලිපි යොමුකර ඇතත් මෙතෙක් එම අනුරේඛණ සැකසීමේකටයුතු සිදු කර නොතිබුණි.

(ඈ) කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාල කුලී ආදායම දිගුකාලයක් තිසිසේ අයකර ගෙන නොතිබූ අතර උසාවි නියෝගයට අනුවද කටයුතු කර නොතිබුණි.

## 4 තිරසාර සංවර්ධනය

---

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 31 කට අදාලව තිරසාර සංවර්ධන අරමුණු 14 ක් යටතේ දර්ශක 225ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 54ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද දර්ශක 39ක ප්‍රගතිය සියයට 50 – 74 අතර අගයකද පැවතුණි.

## 5. අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංවර්ධන නිලධාරීන් 07 ක හා කළනමාකරණ සේවා නිලධාරියෙකුගෙන් සමන්විත විය. සමාලෝචිත වර්ෂය තුලදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක විගණන පරීක්ෂණවලට අදාලව විගණන විමසුම් 21ක් නිකුත් කරතිබුණු අතර එය විගණන සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 25ක් පමණක් විය. තවද, සමාලොචිත වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07ක විගණන කටයුතු සිදුකර නොතිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 45 | 07 | |
| තෘතියික මට්ටම | 33 | 15 | 18 | |
| ද්විතියික මට්ටම | 1,196 | 1413 | 213 | 430 |
| ප්‍රාථමික මට්ටම | 142 | 97 | 45 | |
| එකතුව | 1,423 | 1,570 | 283 | 430 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අනුමත සේවක සංඛ්‍යාව 1,423ක් ද, තත්‍ය සේවක සංඛ්‍යාව 1,571ක් ද, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 283 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 430ක් විය. සංවර්ධන නිළධාරී සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 107ක් වුවද එම සේවයේ තත්‍ය සේවක සංඛ්‍යාව 537ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 430ක් විය. පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය කළමනාකරණ සේවයේ තනතුරු පුරප්පාඩු 98 ක් හා ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 98ක් නිරීක්ෂණය වූයෙන් එය මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

ආර්. පී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

ආර්. පී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය